International Trade Centre | SheTrades

UK International Development
Partnership | Progress | Prosperity



# මහා බ්‍රිතාන්‍ය වෙත අපනයනය කිරීම

## රෙදිපිළි සහ ඇඟලුම්, පාවහන්, කාන්තා ආයිත්තම් සහ ගෘහ අලංකරණ ක්ෂේත්‍ර වල ශ්‍රී ලාංකේය කාන්තා මූලික ව්‍යාපාර සඳහා අත්පොත

In partnership with

EDB SRI LANKA EXPORT DEVELOPMENT BOARD

ප්‍රකාශක: ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානය

මාතෘකාව: මහා බ්‍රිතාන්‍ය වෙත අපනයනය කිරීම : රෙදිපිළි සහ ඇඟලුම්, පාවහන්, කාන්තා ආයිත්තම් සහ ගෘහ අලංකරණ ක්ෂේත්‍ර වල නියැලෙන, ශ්‍රී ලාංකේය කාන්තා මූලික ව්‍යාපාර සඳහා අත්පොත

ප්‍රකාශිත දිනය සහ ස්ථානය: ජිනීවා, 2024 නොවැම්බර් මස

පිටු ගණන: 64

වැඩි විස්තර සඳහා, සම්බන්ධ වන්න: kristy@intracen.org වෙතින් මිෂෙල් ක්‍රිස්ටි

පුළුල් අන්දමින් බෙදා හැරීම සිදු කළ හැකි වීම පිණිස සිය ප්‍රකාශන ප්‍රතිමුද්‍රණය සහ පරිවර්තනය, ITC විසින් දිරිගන්වනු ලබයි. මූලාශ්‍රය වෙත නිසි පිළිගැනීමකින් යුතුව, මෙම ලේඛනයේ කෙටි උපුටන ප්‍රතිනිර්මාණයට නිදහස පවතියි. වඩාත් විස්තරාත්මක ප්‍රතිනිර්මාණයක් හෝ පරිවර්තනයක් සම්බන්ධයෙන් අවසර ලබාගැනීම කළ යුතු වේ.

ප්‍රතිමුද්‍රිත හෝ පරිවර්තනය කරන ලද ද්‍රව්‍ය වල පිටපතක් ITC වෙත එවිය යුතු වේ.
කවරයේ ඩිජිටල් රූපසටහන (සටහන්) කෘතිම බුද්ධිය මගින් උත්පාදිත ය.

© ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානය (ITC)

ITC යනු ලෝක වෙළෙඳ සංවිධානය සහ එක්සත් ජාතීන්ගේ හවුල්කාර නියෝජිතායතනයයි.






# පිළිගැනීම

මෙම ප්‍රකාශනය නිර්මාණය කිරීම සඳහා දායකත්වය දුන් සැමට ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානය (The International Trade Centre - ITC) සිය කෘතඥතාව පළ කරයි

ප්‍රදීපා කුලසේකර සහ මාතංගී හරිහරන් (දෙදෙනාම ITC) විසින් මෙම වාර්තාව සකස් කරන ලද්දේ මිෂෙල් ක්‍රිස්ටි (ITC) යන අයගේ මගපෙන්වුම යටතේ ය.

මෙම වාර්තාව සකස් කිරීමට දායකත්වය ලබා දුන් ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධන මණ්ඩලයට තුති පුද කිරීමට ITC මෙය අවස්ථාවක් කරගනියි. ITC සහ TradeLab International Economic Law Clinic, ජිනීවා හි Centre for Trade and Integration, ජිනීවා හි Graduate Institute of International and Development Studies අතර සහයෝගීතාව ඇතිව මින් ඉහත සිදු කළ වෙනත් කාර්යයකින් මෙම අත්පොතට යම් සහයක් ලබා ගන්නා ලදී.

කතුවැකිය සහ නිෂ්පාදන ක්‍රියාවලිය වෙත දැක්වූ සහය වෙනුවෙන් ඊවා චැංග් (ITC) වෙත; වාර්තාව සංස්කරණය කළ මාර්නි මැක්ඩොනල්ඩ්; සහ පිටු සැකසුම සිදු කළ මැග්ඩලීනා ස්ටැඩ්නික් වෙත ද ITC ස්තුතිවන්ත වේ.

මෙම වාර්තාවට අරමුදල් සපයන ලද්දේ එක්සත් රාජධානියේ ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනය විසිනි.

# මෙම අත්පොත පරිශීලනය කළ යුත්තේ කවුරුන් විසින් ද?

මහා බ්‍රිතාන්‍ය වෙත ඇතැම් නිපැයුම් අපනයනය කරන විට, ශ්‍රී ලාංකේය කාන්තා මූලික කුඩා සහ මධ්‍ය-පරිමාණ ව්‍යවසායයන් (SMEs) විසින් සපුරාලිය යුතු මූලික සහ අදාළ නීතිමය සහ නියාමන අවශ්‍යතාවන් මෙම අත්පොත මගින් පැහැදිලි කෙරෙයි. ඒ අනුව, මෙහි පැහැදිලි කර ඇති නීතිමය සහ නියාමන අවශ්‍යතා අදාළ වන්නේ එංගලන්තයේ, වේල්සයේ සහ ස්කොට්ලන්තයේ වෙළෙඳපොළ වෙත යවනු ලබන නිපැයුම් සම්බන්ධයෙන් පමණි. උතුරු අයර්ලන්ත වෙළෙඳපොළ වෙත යවනු ලබන නිපැයුම් සඳහා මෙම අත්පොත අදාළ නොවේ.

රෙදිපිළි සහ ඇඟලුම්, කාන්තා ආයිත්තම් (ඇඳුම්-පැළඳුම්), පාවහන් සහ ගෘහ අලංකරණ අපනයනය පිළිබඳ නියාමන අවශ්‍යතා වෙත මෙම අත්පොත මගින් අවධානය යොමු කර ඇත. සැබෑ සහ විභවීය (actual or potential) අපනයන මත පදනම්ව, මෙම අත්පොතෙන් වඩාත් නිශ්චිතවම ආවරණය කරනු ලබන්නේ නිමි ඇඳුම්, ඇගලුම්, පාවහන් සහ අත්බෑග යන අයිතම වේ.

මෙම අත්පොතින් පැහැදිලි කර ඇති බොහෝ නියාමන අවශ්‍යතා, බෙහෙවින් තාක්ෂණික සහ සවිස්තරාත්මක ය. එවැනි අවශ්‍යතා සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් නිසි කටයුතු කරනු ලබන්නේ මහා බ්‍රිතාන්‍ය වෙත අපනයනය කරනු ලබන්නන් සමග ක්‍රියා කරන වෘත්තීමය අපනයනකරුවන් ය. මෙම යථා තත්ත්වය පෙන්නුම් කිරීම පිණිස, සැබෑ භෞතික අපනයන වලදී මධ්‍යම හෝ මහා-පරිමාණ ශ්‍රී ලාංකේය අපනයන එකතු කරන්නන් (Sri Lankan export aggregators) යොදා ගනු ඇති බවට මෙම අත්පොත උපකල්පනය කර ඇත. එසේ වුවද, වෘත්තීය අපනයනකරුවකු යොදා ගැනීමකින් තොරව, අපනයනය කටයුතු සෘජුව සිදු කිරීමට අදහස් කරන කුඩා පරිමාණ නිපැයුම්කරුවන් හට ද මෙම අත්පොත පරිශීලනය කළ හැකිය.

අපනයන නිපැයුම් වලට අදාළ වඩාත් තාක්ෂණික අවශ්‍යතා වෙත ප්‍රවේශ විය හැකි සබැඳි මෙම අත්පොතට අඩංගු කර ඇත්තේ එබැවිනි. මෙම අත්පොතෙහි එක් එක් පරිච්ඡේදයෙන් පැහැදිලි කර ඇති නියාමන අවශ්‍යතා කියැවිය යුත්තේ එහි සඳහන් කර ඇති අදාළ ඇමුණුම් ද සමග ය. එකී ඇමුණුම් මගින් ඒ එක් එක්  නියාමන අවශ්‍යතාව වැඩිදුරටත් පැහැදිලි කර ඇත.

අනාගතයේ දී යොදා ගනු ලැබිය හැකි නව නියාමන අවශ්‍යතා පිළිබඳ දළ විශ්ලේෂණයක් මෙම අත්පොත මගින් සපයනු ලබන්නේ එහි ඉදිරිය සැලකිල්ලට ගනිමිනි.  ඊට අමතරව, අත්පොත මගින් සාකච්ඡා කෙරෙන නිෂ්පාදන වලට සමාන නියාමන අවශ්‍යතා සහිත නිෂ්පාදන කාණ්ඩ සම්බන්ධයෙන් ද සැඟවුණු විකුණුම් අවස්ථා බොහෝ දුරට පැවතිය හැකිය.

එසේම, අපනයන හා ආනයන අවශ්‍යතා පිළිබඳ තාක්ෂණික නියාමන වලට අමතරව, මහා බ්‍රිතාන්‍යයේ වෙළෙඳපොළ හඳුනා  ගැනීම, සීඝ්‍රයෙන් වෙනස් වන පාරිභෝගික කැමැත්ත, නිපැයුම් පිළිබඳ තරගකාරී මිලගණන් සහ වත්මන් පාරිභෝගික ඉල්ලුම වැනි අපනයන ආශ්‍රිත වෙළෙඳ ආදී විවිධ කාරණා ගැන දැන ගැනීමේ අවශ්‍යතාව ද මෙම අත්පොත පරිශීලනය කරන්නන් හට පැවතිය හැකිය. නීතිමය-නොවන වෙළෙඳ කටයුතු සම්බන්ධයෙන් සැලකිල්ලට ගත යුතු එවැනි කාරණා මෙම අත්පොත මගින් සාකච්ඡා නොකෙරෙයි.

මෙහි අඩංගු සියලු තොරතුරු 2024 ඔක්තෝබර් මාසය වනවිට පැවති තොරතුරු වේ.  තමන්ගේ අපනයන කටයුතු වලට බලපෑ හැකි නව නියාමන අවශ්‍යතා සම්බන්ධයෙන් දැනුවත්ව සිටින මෙන් මෙම අත්පොත කියවන පාඨකයන් වෙතින් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනු ලැබේ.






## සංකේත නාම සහ කෙටි යෙදුම්

අන්‍යාකාරයකින් නිශ්චිතව දක්වා නොමැති නම් මිස, ඩොලර යනුවෙන් හැඳින්වෙන සියල්ලෙන්ම හඳුන්වනු ලබන්නේ ඇමෙරිකානු ඩොලර වන අතර, ටොන් යනුවෙන් හැඳින්වෙන සියල්ලෙන්ම හඳුන්වනු ලබන්නේ මෙට්රික් ටොන් වේ.

ASYCUDA - රේගු දත්ත ලබාගැනීම සඳහා වන ස්වයංක්‍රීය පද්ධති

CITES - වඳ වී යාමේ තර්ජනයට ලක්ව ඇති, වන සත්ව හා වෘක්ෂලතා විශේෂ වල ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ සම්මුතිය

DCTS - සංවර්ධනය වෙමින් පවතින රටවල වෙළෙඳ යෝජනාක්‍රම

EORI - ආර්ථික මෙහෙයුම්කරුවන්ගේ ලියාපදිංචිය සහ අනන්‍යතාව

FRC - වනාන්තර-අවදානමට ලක් කෙරෙන භාණ්ඩ

GOTS - ගෝලීය කාබනික රෙදිපිළි ප්‍රමිතිය

HS - කේතීකරණ පද්ධතිය

Incoterms - ජාත්‍යන්තර වාණිජ කොන්දේසි

IPR - බුද්ධිමය දේපල හිමිකම්

IRD - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

ITC - ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානය

POP - නොනැසී පවත්නා කාබනික දූෂක

REACH - රසායනික ද්‍රව්‍ය පිළිබඳ ලියාපදිංචිය, ඇගයුම, බලය ලබාදීම සහ සීමා කිරීම

SME - කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායයන

SVHC - දැඩි සැලකිල්ල යොමු විය යුතු ද්‍රව්‍ය

VAT - අගය එකතු කළ බදු

VSS - තිරසර භාවය පිළිබඳ ස්වෙච්ඡා ප්‍රමිති (නිපැයුම්, නිපැයීම, ප්‍රවාහනය, සහ සැකසුම තිරසර අයුරින් කළ බව සහතික කෙරෙන නීතිරීති)

UKCC - එක්සත් රාජධානියේ භාණ්ඩ කේතය

ජාත්‍යන්තර වාණිජ කොන්දේසි (ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු වලදී ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන්ගේ වගකීම් අර්ථදැක්වෙන නීතිරීති සමුච්ඡය) පිළිබඳ කෙටි යෙදුම්

CIF - පිරිවැය, රක්ෂණ සහ භාණ්ඩ ප්‍රවාහනය

CIP - රැගෙන යන්නා සහ රක්ෂණය ගෙවන ලද්දේ

CFR - පිරිවැය සහ භාණ්ඩ ප්‍රවාහනය

CPT - පිරිවැය ගෙවන ලද්දේ

DAP - නිශ්චිත ස්ථානයකට/ගමනාන්ත වරායකට භාණ්ඩ භාරදීම

DDP - භාර දීමේ බදු ගෙවන ලදී

DPU - බෑමකින් තොරව ස්ථානය වෙත භාර දෙන ලදී

EXW - නැව්ගත කිරීමේ ගනුදෙනුවක දී ගැනුම්කරුගේ සහ විකුණුම්කරුගේ වගකීම් අර්ථදැක්වෙන ජාත්‍යන්තර වාණිජ කොන්දේසියක

FCA - දක්වන ලද ස්ථානයක් වෙත භාණ්ඩ බෙදා හැරීම සඳහා විකුණුම්කරුගේ වගකීම් අර්ථදැක්වෙන ජාත්‍යන්තර වෙළෙඳ රීතියකි

FOB - භාණ්ඩ ප්‍රවාහනය සම්බන්ධයෙන් විකුණුම්කරුගේ වගකීම් සහ අවදානම් අවසන් වන හා මිලදී ගන්නාගේ වගකී සහ අවදානම් ආරම්භ වන තැන

# පටුන


පිළිගැනීම ..... I

මෙම අත්පොත පරිශීලනය කළ යුත්තේ කවුරුන් විසින් ද? ..... 2

සංකේත නාම සහ කෙටි යෙදුම් ..... 3

**1 වන ඡේදය : අපනයනය සඳහා ව්‍යාපාරය සූදානම් කිරීම ..... 8**

ශ්‍රී ලංකාවේ ව්‍යාපාර ලියාපදිංචිය ..... 9
1 වන පියවර: ව්‍යාපාර ලියාපදිංචිය ..... 9
2 වන පියවර: බදු ලියාපදිංචිය ..... 9
3 වන පියවර: වාණිජ දෙපාර්තමේන්තුව සමග ලියාපදිංචි වීම ..... 10
4 වන පියවර: ශ්‍රී ලංකා රේගුව සමග ලියාපදිංචි වීම ..... 10
5 වන පියවර: වාණිජ මණ්ඩල හා වෙළෙඳ සංගම් සමග එක්වීම ..... 11
6 වන පියවර: කර්මාන්ත ලියාපදිංචි කිරීම ..... 11
7 වන පියවර: මූල්‍ය පහසුකම් වෙත ප්‍රවේශය ..... 11
8 වන පියවර: විකුණුම් ගිවිසුම ..... 12
**මහා බ්‍රිතාන්‍ය වෙත අපනයනය කිරීම ..... 14**
9 වන පියවර: කේතීකරණ පද්ධති කේත සහ නිපැයුම් වර්ගීකරණය ..... 14
10 වන පියවර: අපනයනය සඳහා මූල්‍ය පහසුකම් ..... 15
**සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා එක්සත් රාජධානියේ වෙළෙඳ යෝජනාක්‍රමය ..... 17**
අදාළ රේගු ගාස්තු ..... 17
ප්‍රභවස්ථානය පිළිබඳ නීතිරීති ..... 17
ප්‍රමිතීන් සහ නියාමන අවශ්‍යතා ..... 17
DCTS යටතේ වරණීය වෙළෙඳ නීතිරීති සඳහා හිමිකම් පෑම ..... 17

**2 වන ඡේදය : නිපැයුම් සහ නිපැයුම් අවශ්‍යතා සපුරාලීම ..... 18**

**නිපැයුමෙහි ආරක්ෂිත බව ..... 20**
නිපැයුම පිළිබඳ පොදු ආරක්ෂිත භාවය ..... 20
**රසායන ද්‍රව්‍ය නියාමනය පිළිබඳ ලියාපදිංචි කිරීම, ඇගයීම, බලය ලබාදීම සහ සීමා කිරීම ..... 21**
සෘජ්‍ය අනුකූලතාව ..... 21
ජෛවනාශක ..... 22
නොනැසී පවත්නා කාබනික දූෂක ..... 22
රාත්‍රී-ඇඳුම් පිළිබඳ ආරක්ෂිත භාවය ..... 22
**වඳ වී යාමේ තර්ජනයට ලක්ව ඇති ශාඛ සහ සතුන්ගෙන් කළ නිපැයුම් ..... 23**
**බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ..... 24**
වෙළෙඳ ලකුණු ..... 24
සැලසුම් ..... 25








බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ඔබ විසින් කඩ කළහොත් සිදුවන්නේ කුමක්ද? ..... 26
නිපැයුමෙහි තිරසර භාවය ..... 27
නිපැයුම ඇසුරුම්කරණය ..... 28
නිපැයුමෙහි ලේබල ..... 29

**3 වන පරිච්ඡේදය : තිරසර භාවය පිළිබඳ ප්‍රමිතීන් ..... 30**

ස්වෙච්ඡා තිරසර භාවය පිළිබඳ ප්‍රමිතීන් ..... 30
සමාගම් සංග්‍රහය ..... 31

**4 වන පරිච්ඡේදය : රේගු සහ ආශ්‍රිත ක්‍රියාපටිපාටි ..... 32**

රේගු ලියාපදිංචිය ..... 33
මූල්‍ය සාධනපත්‍ර ..... 34
රේගු නිෂ්කාශනය ..... 35
රේගු බන්ධිත ගබඩා ..... 35

**5 වන පරිච්ඡේදය : ප්‍රවාහන සහ සැපයුම් ..... 36**

නෞභාර බිල්පත ..... 37
රක්ෂණය ..... 37

**ඇමුණුම් I: ශ්‍රී ලාංකික අපනයනකරුවකු වීමට සූදානම් කිරීම ..... 39**

ජාත්‍යන්තර වාණිජ කොන්දේසි වල සාරාංශය ..... 39
නිපැයුම් වර්ගීකරණය: HS කේත ..... 40
HS කේත සහ ඔණක්සි පිළිබඳ දළ විශ්ලේෂණය ..... 40
නිපැයුම් විස්තරය පිළිබඳ ආකෘතිය ..... 41
මෙම අත්පොත මගින් ආවරණය කර ඇති නිපැයුම් සඳහා භාණ්ඩ කේත දක්වන ලැයිස්තුව ..... 42
**එක්සත් රාජධානියේ සංවර්ධනය වෙමින් පවතින රටවල වෙළෙඳ යෝජනාක්‍රම ..... 44**

DCTS යටතේ රේගු ගාස්තු 44
ප්‍රභවස්ථානය පිළිබඳ නීතිරීති 45

**ඇමුණුම II: නිපැයුම් සහ නිපැයුම් අවශ්‍යතා 46**

සාමාන්‍ය නිපැයුම් ආරක්ෂණය 46
රසායනික ද්‍රව්‍ය පිළිබඳ ලියාපදිංචිය, ඇගයුම, බලය ලබාදීම සහ සීමා කිරීම (REACH) සම්බන්ධ රෙගුලාසිය 47
රාත්‍රී ඇඳුම් පිළිබඳ ආරක්ෂණය 47
ළමුන් සඳහා වන රාත්‍රී ඇඳුම් 47
වැඩිහිටියන් සඳහා වන රාත්‍රී ඇඳුම්, පිජාමා, ළඳරු ඇඳුම් සහ කපු ටෙරි ටවලින් බාත්රෝබ්ස් 48
ගිනි නිවන රසායන ද්‍රව්‍ය සමග පදම් කළ රෙදි වලින් නිම කළ රාත්‍රී ඇඳුම් 48
**නිපැයුම් ඇසුරුම්කරණය 49**
අත්‍යවශ්‍ය අවශ්‍යතා 49
අනුකූල නොවීමේ ප්‍රතිවිපාක 49
**ලේබල්කරණය පිළිබඳ අවශ්‍යතා 50**
රෙදිපිළි ලේබල්කරණය පිළිබඳ අවශ්‍යතා 50
පාවහන් ලේබල්කරණය පිළිබඳ අවශ්‍යතා 51

**ඇමුණුම III: තිරසර භාවය පිළිබඳ ප්‍රමිතීන් 53**

**සහතික කිරීම් ලබාගැනීමට ගත යුතු පියවර 54**
1 වන පියවර: නිවැරදි ප්‍රමිතිය හඳුනාගැනීම 54
2 වන පියවර: පරතර විශ්ලේෂණයක් සිදු කිරීම 54
3 වන පියවර: සහතික කිරීම් සඳහා අයදුම් කරන්න 54
4 වන පියවර: පරීක්ෂාව සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ ඉල්ලීම් 55
5 වන පියවර: සහතික කිරීම, අධීක්ෂණය කිරීම සහ අලුත් කිරීම 55
**අදාළ සහතික කිරීම් පිළිබඳ උදාහරණ 56**
ගෝලීය කාබනික රෙදිපිළි පිළිබඳ ප්‍රමිතීන් 56
ධෑණ්ඩ-ඖඛ ජාත්‍යන්තර සංවිධානය 56

**ඇමුණුම IV : රේගු කාර්යපටිපාටි සහ ආශ්‍රිත ලේඛන 57**

වාණිජ ඉන්වොයිසිය 57
ඇසුරුම් ලැයිස්තුව 58
ප්‍රභවස්ථානය ඔප්පු කිරීම 58
ප්‍රභවස්ථාන ප්‍රකාශනය 59
A පෝරමය 60
භාණ්ඩ පිළිබඳ ප්‍රකාශනය 60
තනි ප්‍රකාශනය 60
**ආර්ථික මෙහෙයුම්කරුවන්ගේ ලියාපදිංචිය සහ අනන්‍යතා අංකය 61**

## රූප, වගු සහ කොටු ලැයිස්තුව

1 වන රූපය: එක්සත් රාජධානියේ සංවර්ධනය වෙමින් පවතින රටවල වෙළෙඳ යෝජනාක්‍රම (DCTS) වල දළ විශ්ලේෂණය 6
Figure A1: Example of chapter notes for Chapter 71 of the UKCCs 43
Figure A2: DCTS country classification 44
Figure A3: Different tariffs chargeable under the DCTS 45
Figure A4: Example of footwear labelling pictograms and language 52

1 වන වගුව: විකුණුම් ගිවිසුමක අඩංගු ප්‍රධාන නීතිරීති වල සාරාංශය 12
2 වන වගුව: ජාත්‍යන්තර වාණිජ කොන්දේසි 2020 පිළිබඳ උදාහරණ 13
A1 වගුව: ජාත්‍යන්තර වාණිජ කොන්දේසි වල සාරාංශය 39
A2 වගුව: HS කේතය සහ UKCC වර්ගීකරණය පිළිබඳ උදාහරණ 40
A4 වගුව: HS කේත වර්ගීකරණය සඳහා වන නිපැයුම් විස්තරය පිළිබඳ ආකෘතිය 41
A6 වගුව: මෙම අත්පොත මගින් ආවරණය කර ඇති නිපැයුම් වල UKCCs දක්වන ලැයිස්තුව 42
A8 වගුව: නිපැයුම් ආරක්ෂණ උල්ලංඝනය සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය අධිකාරීන් විසින් ගනු ලබන පියවර 46

1 වන කොටුව : අනෙකුත් අධිකාරීන් සමග ලියාපදිංචි වීම 11
2 වන කොටුව : එක්සත් රාජධානියේ භාණ්ඩ කේතය නිවැරදිව හඳුනා ගැනීමේ වැදගත්කම 4
3 වන කොටුව : නිපැයුම් වර්ගීකරණය පිළිබඳ උදාහරණයක් 14
4 වන කොටුව : නිපැයුම පිළිබඳ ආරක්ෂිත භාවය පරීක්ෂා කිරීම 20
5 වන කොටුව : නිපැයුම පිළිබඳ ආරක්ෂිත භාවය සහතික කිරීම සම්බන්ධයෙන් නිර්දේශිත පරිචයන් 20
6 වන කොටුව : SVHC යනු කුමක්ද? 21
7 වන කොටුව : ශ්‍රී ලංකාව REACH තුළ පරීක්ෂාව 21
8 වන කොටුව : සැලසුම් (මෝස්තර) ආරක්ෂණය ලබාගැනීම පිළිබඳ අවශ්‍යතා 25
9 වන කොටුව : ඔබේ නිපැයුම කැපී පෙනෙන බව ඇති කළ හැකි අයුරු 25
10 වන කොටුව : වනාන්තර අවදානම සහිත පාරිභෝගික භාණ්ඩයක් යනු කුමක්ද? 27
11 වන කොටුව : තිරසර අනාගතයක් උදෙසා නිපැයුම්කරුවන් හට සූදානම් විය හැක්කේ කෙසේද? 27
12 වන කොටුව : නිපැයුම් ඇසුරුම්කරණය පිළිබඳ උදාහරණ 28
13 වන කොටුව : තිරසර භාවය පිළිබඳ ප්‍රමිතීන් යනු මොනවාද? 30
14 වන කොටුව : තිරසර භාවය පිළිබඳ සැපයුම්කාර සම්පත් 31
Box A1: Textile products that do not require labels 50
Box A2: Contents of a commercial invoice 57
Box A3: Conditions to prepare the origin declaration 59
Box A4: Origin declaration wording 59



© Shutterstock.com

# 01 අපනයනය සඳහා ව්‍යාපාරය සූදානම් කිරීම

## ශ්‍රී ලංකාවේ ව්‍යාපාර ලියාපදිංචිය

### 1 වන පියවර: ව්‍යාපාර ලියාපදිංචිය

ශ්‍රී ලංකාවේ බහුලව පවතින ව්‍යාපාර වර්ග වන්නේ: 1) තනි පුද්ගල ව්‍යාපාර; 2) හවුල් ව්‍යාපාර; සහ 3) පුද්ගලික සීමාසහිත සමාගම් ය. ඒ එක් එක් ව්‍යාපාර වර්ග වලට අදාළ වාසි සහ අවාසි ඇත. ඔබේ ව්‍යාපාරික අවශ්‍යතාව හා වඩාත් ගැළපෙන ව්‍යාපාරික ආකෘතියක් තෝරා ගන්න

තනි පුද්ගල ව්‍යාපාර සම්බන්ධයෙන්, ව්‍යාපාරය පිහිටුවනු ලබන සහ ලියාපදිංචි කරනු ලබන ස්ථානයට අදාළ ප්‍රදේශය අයත් වන පළාත් සභාව වෙතින් අදාළ පෝරම ලබා ගන්න. ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම සඳහා එක් පෝරමයක් ද ග්‍රාම නිලධාරී වෙතින් වාර්තාවක් ලබා ගැනීම සඳහා අනෙක් පෝරමය ද වශයෙ-න්; පළාත් සභාව විසින් පෝරම දෙකක් ලබා දෙනු ඇත. අයදුම්පත් වල දක්වා ඇති අවශ්‍ය අනෙකුත් සියලුම ලේඛන, ප්‍රාදේශීය ලේකම්තුමා වෙත ඉදිරිපත් කර, තනි පුද්ගල ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලබාගන්න.

සමාගම් ලියාපදිංචි කිරීම සිදු කළ යුත්තේ සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සමගිනි. පෞද්ගලිකව එම දෙපාර්තමේන්තුව වෙත ගොස් හෝ අන්තර්ජාලය හරහා ඍජුව තනි කවුළුව භාවිතයෙන් හෝ ලියාපදිංචිය සිදු කළ හැකිය.

ව්‍යාපාර නාමය වෙන්කරවා ගැනීමෙන් පසු අවශ්‍ය අනෙකුත් සියලුම ලේඛන ඉදිරිපත් කිරීමට eROC පද්ධතිය භාවිත කරන්න, නැතිනම් සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත තැපැල් මගින් යවන්න. පරිශීලක ඇතුල්වීම සහ ව්‍යාපාර නාමය වෙන්කරවා ගැනීම සහ අනුමැතිය ලැබීමෙන් පසු සමාගම් නාමයක් සංස්ථාපනය කිරීම පිළිබඳ මගපෙන්වුම් සඳහා මෙම සබැඳිය බලන්න.

බලයලත් බැංකුවක ව්‍යාපාර නාමය යටතේ බැංකු ගිණුමක් විවෘත කිරීම ද ඒ සමගම සිදු කරන්න. ව්‍යාපාර සඳහා බැංකු ගිණුමක් විවෘත කිරීමට අවශ්‍ය තොරතුරු සම්බන්ධයෙන් මෙම මගපෙන්-වුම බලන්න.

### 2 වන පියවර: බදු ලියාපදිංචිය

ආනයන සහ අපනයන කටයුතු සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (Inland Revenue Department - IRD) වෙතින් බදුගෙවන්නාගේ අනන්‍යතා අංකයක් ලබා ගැනීම ව්‍යාපාරයක් විසින් සිදු කළ යුතු වේ. එය, IRD හි IRD e-සේවාව-න් වෙතින් ලබාගත හැකිය. බදුගෙවන්නා හඳුනාගැනීමේ අංකය ලබාගැනීමෙන් පසුව, IRD හි e-සේවා ද්වාරය භාවිතයෙන්, එකතු කළ අගය මත බද්ද (VAT) සඳහා ලියාපදිංචි වන්න. බදු ලියාපදිංචිය පිළිබඳ විස්තර සඳහා මෙම මගපෙන්වුම බලන්න.

එක් එක් නැව්බඩු තොගය සම්බන්ධයෙන් ව්‍යාපාරය විසින් තාවකාලික VAT ලියාපදිංචි කිරීම් ලබාගත යුතු වේ. අපනය-නකරුවන්ගෙන් අය කරනු ලබන VAT අනුපාතිකය, 0% කි.

ශ්‍රීලංරු මිලියන 60ක හෝ ඊට වැඩි වාර්ෂික පිරිවැටුමක් සහිත ව්‍යාපාර, ස්ථිර VAT සඳහා ලියාපදිංචි වීම අවශ්‍ය කෙරෙයි. ඒ, ස්ථිර VAT ලියාපදිංචි කිරීම් සඳහා වන සීමාව එමගින් සපුරාලන බැවිනි.

## 3 වන පියවර: වාණිජ දෙපාර්තමේන්තුව සමග ලියාපදිංචි වීම

එක්සත් රාජධානියේ සංවර්ධනය වෙමින් පවතින රටවල වෙළෙඳ යෝජනා ක්‍රම (DCTS) යටතේ වරණීය රේගු ගාස්තු අනුපාතිකයන් ඉල්ලා සිටීමට අදහස් කරන අපනයනකරුවන්, ශ්‍රී ලංකා වාණිජ දෙපාර්තමේන්තුව සමග අපනයනකරුවන් ලෙසට ලියාපදිංචි වී, එහි මාර්ගගත පද්ධතිය (ඔන්ලයින්) මගින් තම අපනයන සාරාංශය උඩුගත කළ යුතු වේ. අපනයනකරුගේ ප්‍රකාශනය සහ වාණිජ දෙපාර්තමේන්තුව වෙත ලියාපදිංචි කිරීමේ ගාස්තුව සමග අයදුම්පත සහ අවශ්‍ය අනෙකුත් සියලුම ලේඛන ඉදිරිපත් කරන්න.

**කඩිනම් ඉඟියක්**

තාවකාලික VAT ලියාපදිංචි කිරීමේ සහතිකය අලුත් කරනු ලබන සෑම අවස්ථාවක දී ම ශ්‍රී ලංකා රේගුව සමග වන ලියාපදිංචිය ද අලුත් කරන්න.

## 4 වන පියවර: ශ්‍රී ලංකා රේගුව සමග ලියාපදිංචි වීම

ශ්‍රී ලංකා රේගුව සමග ගිණුමක් නිර්මාණය කර ඉන් පසුව රේගු දත්ත සඳහා ස්වයංක්‍රීය පද්ධතිය (ASYCUDA) හි ලියාපදිංචි වන්න. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග අවශ්‍ය අනෙකුත් සියලුම ලේඛන ඉදිරිපත්කරන්න. මෙම ලියාපදිංචිය සම්බන්ධයෙන් කිසිදු පිරිවැයක් නැත.



© Freepik.com



## 5 වන පියවර: වාණිජ මණ්ඩල හා වෙළෙඳ සංගම් සමග එක්වීම

වෙළෙඳපොළ පිළිබඳ අවබෝධයන්, ධාරිතා-ගොඩනැගීමේ පුහුණු සහ වැඩමුළු, ජාලකරණ (එකිනෙකා හා සම්බන්ධ වීමේ) අවස්ථා සැපයීම සහ ලේඛන සහතික කිරීම වැනි අත්‍යවශ්‍ය ව්‍යාපාරික සේවාවන් ද ඇතුළුව වටිනා සේවාවන් රැසක් වාණිජ මණ්ඩල විසින් සිය සාමාජිකයන් වෙත සපයනු ලබයි.

රෙදිපිළි සහ ඇඟලුම්, පාවහන්, කාන්තා ආයිත්තම් සහ ගෘහ අලංකරණ අපනයනකරුවන් වෙත සහය සේවාවන් සපයනු ලබන මණ්ඩල කිහිපයක් පහත දක්වා ඇති පරිදි වේ.

- ලංකා වාණිජ මණ්ඩලය
- ශ්‍රී ලංකා අපනයනකරුවන්ගේ ජාතික මණ්ඩලය
- ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය
- ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය
- කාන්තා කර්මාන්ත හා වාණිජ මණ්ඩලය
- ශ්‍රී ලංකා ඇඟලුම් අපනයනකරුවන්ගේ සංගමය
- ඒකාබද්ධ ඇඟලුම් සංගම් සංසදය

## 6 වන පියවර: කර්මාන්ත ලියාපදිංචි කිරීම

අපනයන සඳහා අමුද්‍රව්‍ය ආනයනය කිරීමේ දී, අපනයන ක්‍රියාවලි සඳහා තාවකාලික ආනයන යෝජනාක්‍රමය (TIEP) සහ අභ්‍යන්තර ක්‍රියාවලි සහ පහසුකරණ යෝජනාක්‍රමය (INFAC) යටතේ ප්‍රතිලාභ ලබාගැනීම පිණිස, නිෂ්පාදකයන් හට ඔවුන්ගේ නිෂ්පාදන වැඩබිම්, කර්මාන්ත අමාත්‍යාංශය යටතේ කර්මාන්ත රෙජිස්ට්‍රාර්වරයා සමග ලියාපදිංචි කළ හැකිය.

## 1 වන කොටුව: අනෙකුත් අධිකාරීන් සමග ලියාපදිංචි වීම

අපනයනය-ඉලක්ක කරනු ලබන කුඩා සහ මධ්‍ය-පරිමාණ ව්‍යවසායකයන් විසින් නව අපනයන සංවර්ධන වැඩසටහන යටතේ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සමග ස්වෙච්ඡා-වෙන් ලියාපදිංචි වී ධාරිතා ගොඩනැගීම, ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම, වෙළෙඳපොළ වෙත නිරාවරණය වීම, නිපුණතා සංවර්ධනය හා උපදේශනය සහ අපනයනකරුවන් හා විභවීය අපනයනකරුවන් උදෙසා නිර්මාණය කරන ලද අපනයන අලෙවිකරණ උපදේශන සේවාවන් වෙත ප්‍රවේශ වීම කළ හැකිය.

## 7 වන පියවර: මූල්‍ය පහසුකම් වෙත ප්‍රවේශය

නිෂ්පාදන ව්‍යාපාර වල යෙදෙන්නන් හට සිය වාණිජ බැංකුව හරහා චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය (SMILE) මගින් ප්‍රතිලාභ ලැබිය හැකිය. කුඩා සහ මධ්‍ය-පරිමාණ ව්‍යවසායකයන් (SMEs) වෙත ශ්‍රීලංරු මිලියන 25 දක්වා ණය පහසුකම් සපයනු ලබන මෙම අරමුදල, යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමට සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීමට යොදා ගත හැකි වේ. වසර 10ක උපරිම කාලයක් ඇතුළත ණය මුදල ආපසු ගෙවිය හැකි අතර, ඒ සඳහා අතිරේක සහන කාලයක් ද ඇතුළත් වේ. වැඩි විස්තර සඳහා මෙතැන බලන්න.

ඊට අමතරව, රජය සහ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වාණිජ බැංකු විසින් SMEs සහ කාන්තා ව්‍යවසායකයන් වෙත පිරිනමනු ලබන ණය යෝජනාක්‍රම රැසක් ද වේ. ඉන් සමහරක් පහත දක්වා ඇත.

- ශ්‍රී ලංකාවේ මහජන බැංකුව (රාජ්‍ය බැංකුවකි) ලබාදෙන SMEs ණය
- ලංකා බැංකුව (රාජ්‍ය බැංකුවකි) ලබාදෙන SME Energizer
- සණස සංවර්ධන බැංකුව විසින් ලබාදෙන SME යෝජනාක්‍රමය
- ශ්‍රී ලංකාවේ කොමර්ෂල් බැන්ක් පීඑල්සී විසින් ලබාදෙන SME ණය
- ශ්‍රී ලංකා රජය සමග සහයෝගීතාව සහිතව නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් විසින් ලබාදෙන SME re-energizer

පියවර 8, 9, සහ 10 බොහෝ විට එකිනෙකට සමාන්තරව සිදුවන දෑ බව පාඨකයන් සැලකිල්ලට ගත යුතු වේ.

## 8 වන පියවර: විකුණුම් ගිවිසුම

1 වන වගුවෙහි සවිස්තරාත්මකව දක්වා ඇති වගන්ති තමන්ගේ විකුණුම් ගිවිසුමෙහි ඇතුළත් වන බවට නිපැයුම්කරුවන් විසින් සෑම විටෙකම සහතික කරගත යුතු වේ. අනාගතයේ දී මතු විය හැකි යම් මතභේදයක් පැහැදිලි හා සුහද ආකාරයකින් නිරාකරණය කරගැනීමට එය උපකාරී වනු ඇත.

### 1 වන වගුව: විකුණුම් ගිවිසුමක අඩංගු ප්‍රධාන නීතිරීති වල සාරාංශය

| කොන්දේසිය | පැහැදිලි කිරීම |
|---|---|
| නාමමාත්‍ර ඉන්වොයිසිය | • ඇණවුම පිළිබඳ නීතිරීති තහවුරු කිරීම පිණිස විකුණුම්කරු විසින් ගැනුම්කරු වෙත යවනු ලබයි. එකම විකුණුම් ගිවිසුමක් යටතේ බහුවිධ ඉන්වොයිසි නිකුත් කරනු ලැබිය හැකියි.<br>• නිපැයුමෙහි විස්තරය, ප්‍රමාණය, මිල සහ භාණ්ඩ භාරදීමේ නීතිරීති වැනි තොරතුරු ඇතුළත් වේ.<br>• ගැනුම්කරු වෙතින් ගෙවීම් ඉල්ලා සිටීම සඳහා ද යොදා ගනු ලබයි. |
| ගෙවීම් පිළිබඳ නීතිරීති | • ඉන්වොයිසියක් සඳහා ගෙවීම් කටයුතු සම්බන්ධයෙන් එකඟ-වූ කොන්දේසි.<br>• ගෙවීම් නියමිත දිනය, ව්‍යවහාර මුදල් වර්ගය සහ ගෙවීම සිදු කරන ආකාරය සහ හිඟ ගෙවීම් සම්බන්ධයෙන් එකඟ වූ යම් දඩ මුදල් පිළිබඳව නිශ්චිතව දැක්වේ. |
| පූරක කාලය (ක්‍රියාවලියක ආරම්භය සහ අවසානය අතරතුර කාලය | • ඇණවුම ලබා දුන් වේලාවෙහි සිට නිපදවූ භාණ්ඩ භාරදීම දක්වා ගත වන කාලය මෙයයි. නිපැයුම, අපනයනකරු සහ නැව්ගත කිරීමේ ක්‍රමවේදය අනුව මෙය වෙනස් වේ.<br>• පූරක කාලය පිළිබඳ එකඟතාව මගින් දෙපාර්ශ්වය අතර විශ්වාසය ගොඩනැගීමේ සහ වෙළෙඳ සබඳතා සුමට වීමේ හැකියාව සැලසේ. |
| ඇණවුම් කළ හැකි අවම ප්‍රමාණය | • අපනයනකරුවකු වෙතින් ගැනුම්කරුවකු ඇණවුම් කළ යුතු අවම ඒකක ප්‍රමාණය.<br>• නිෂ්පාදන කාර්යක්ෂමතාව වැඩිදියුණු කරගැනීමට උපකාරී වේ. |
| නිර්මාණ අයිතීන්<br><br>නිර්මාණ අයිතීන් | • නිපැයුමෙහි නිර්මාණ අයිතීන් සම්බන්ධයෙන් නිපැයුම්කරුගේ සහ ගැනුම්කරුගේ භූමිකාවන් දැක්වෙයි (නිර්මාණ අයිතීන් පිළිබඳ වැඩි විස්තර සඳහා 2 වන පරිච්ඡේදය බලන්න).<br>- උදාහරණ: 'නිර්මාණය සම්බන්ධයෙන් නිපැයුම්කරුට දැනගැනීමට ලැබෙන යම් විභවීය නීති කඩ කිරීම්, නිපැයුම්කරු විසින් ගැනුම්කරු වෙත දැනුම් දීමට එකඟ වේ.' |
| ලේබල් කිරීම සහ ඇසුරුම් | • ලේබල් කිරීම සහ ඇසුරුම් සම්බන්ධයෙන් නිපැයුම්කරුගේ සහ ගැනුම්කරුගේ භූමිකාවන් දැක්වෙයි. උදාහරණ කිහිපයක්:<br>- 'ලේබල් කිරීම සම්බන්ධයෙන් නියාමන නියෝජිතායතනයෙහි අවශ්‍යතා වලට අනුකූල බව සහතික කිරීම නිපැයුම්කරුගේ වගකීම වේ.<br>- 'ගැනුම්කරු වෙනුවෙන් ලේබල සහ වෙනත් ඇසුරුම් ද්‍රව්‍ය ප්‍රමාණවත් පරිදි ඇණවුම් කිරීම නිපැයුම්කරුගේ වගකීම වේ.'<br>- 'නිපැයුමෙහි වෙනස්කම් හේතුවෙන් භාවිතයට ගනු නොලබන යම් ලේබල සහ ඇසුරුම් ද්‍රව්‍ය සඳහා ගැනුම්කරු වගකිව යුතු නොවේ.' |
| පුද්ගලාරෝපිත සංවර්ධනයන් | • නිශ්චිත නිපැයුම් සහ එම නිපැයුම් පිළිබඳව ගැනුම්කරුගේ ඉල්ලීම් වලට නිපැයුම්කරු සහ දෙපාර්ශ්වයම එකඟ බව පෙන්වීම සඳහා ඒවා විකුණුම් ගිවිසුමට ඇතුළත් කිරීම. |
| භාණ්ඩ භාරදීමේ කොන්දේසි හෝ ජාත්‍යන්තර වාණිජ කොන්දේසි | • 2 වන වගුවෙහි දක්වා ඇති පරිදි, ජාත්‍යන්තර ගනුදෙනු මගින් භාණ්ඩ විකිණීමේ දී, බෙදාහැරීමේ ස්ථානය සහ පිරිවැය සම්බන්ධයෙන් අපනයනකරුවන්ගේ සහ ගැනුම්කරුවන්ගේ වගකීම් නිර්වචනය කෙරෙන, හා ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට ලක් වූ නීතිරීති මාලාවකි.<br>• භාර දීමේ ස්ථානය හෝ ගමනාන්තය හැකි තාක් දුරට සවිස්තරාත්මකව නිශ්චිතව දක්වා ඇති බවට පාර්ශ්වයන් විසින් සහතික කළ යුතුය. ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයට අනුව, අනුගමනය කළ යුතු මනා පරිචය වන්නේ, පහත වගන්තිය යොදා ගැනීමයි '[තෝරාගත් ජාත්‍යන්තර වාණිජ කොන්දේසි] [නම් කරන ලද ස්ථානය හෝ ප්‍රදේශය] Incoterms 2020' |



ජාත්‍යන්තර විකුණුම් ගනුදෙනුවක දී නිපැයුම්කරුවන්/අපනයනකරුවන් සහ ගැනුම්කරුවන්ගේ වගකීම් අර්ථනිරූපණය කෙරෙන, ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට ලක් වූ නීතිරීති වන ජාත්‍යන්තර වාණිජ කොන්දේසි, විකුණුම් ගිවිසුම් වල ඇතුළත් විය යුතු වේ. Incoterms 2020 2020 මගින් පොදු නීතිරීති 11ක් පෙන්නුම් කෙරෙයි. නැව්ගත කිරීමේ ක්‍රියාවලිය තුළ විවිධ අවස්ථාවන් හි දී විකුණුම්කරුගේ සහ ගැනුම්කරුගේ වගකීම් එකී එක් එක් රීතිය මගින් නිර්වචනය කෙරෙයි.

ජාත්‍යන්තර වාණිජ කොන්දේසි ඇතුළත් කිරීම මගින් එක් එක් පාර්ශ්වයෙහි වගකීම් නිශ්චිතව පෙන්නුම් කෙරෙනු පමණක් නොව, විකුණුම්කරු වෙතින් ගැනුම්කරු වෙත අවදානම් පැවරීම සිදු වන ස්ථානය සහ දෙපාර්ශ්වයන් අතර පිරිවැය බෙදෙන අවස්ථාව ද පෙන්නුම් කෙරෙයි. භාණ්ඩ භාරදීම සම්බන්ධයෙන් කැමැත්ත දක්වන යම් යම් නීතිරීති සහ නිපැයුම්කරුවකු/විකුණුම්කරුවකු (Seller - S) සහ ගැනුම්කරුවකු (Buyer - B) අතර විය හැකි අවස්ථාවක් 2 වන වගුව මගින් පෙන්නුම් කෙරෙයි. කොළඹ වරාය හරහා අපනයන කටයුතු සිදු කෙරෙන කාලාන්තරයන් සැලකිල්ලට ගනිමින්, 2 වන වගුව මගින් අවධානය යොමු කරනු ලබන්නේ මුහුදු මාර්ගයෙන් ප්‍රවාහනයේ දී අදාළ වන ජාත්‍යන්තර වාණිජ කොන්දේසි වෙත ය. ඉතිරිය '1 වගුව, ඇමුණුම I මගින් සපයා ඇත.

### 2 වන වගුව: ජාත්‍යන්තර වාණිජ කොන්දේසි 2020 පිළිබඳ උදාහරණ

| INCOTERM | DESCRIPTION | RESPONSIBILITIES |
|---|---|---|
| බහුවිධ ප්‍රවාහන ක්‍රම | | |
| විකුණුම්කරු එකඟ වූ බෙදා හැරීමේ ගබඩාවකින් හෝ එවැනි ස්ථානයකින් ගැනුම්කරුට භාණ්ඩ ලබා ගත හැකි වීම | Sගේ පරිශ්‍රය විය යුතු නොවන, නම් කරන ලද ස්ථානයකට B වෙත භාණ්ඩ භාර දීම S සිදු කරයි. භාණ්ඩ පැටවීම, බෙදා හැරීම සහ ඒ හා ආශ්‍රිත සියලු අවදානම් සහ පිරිවැය සඳහා වගකිව යුතු වන්නේ B ය. | භාර දීම සිදු වන්නේ Sගේ දේශභූමිය තුළ නම්, අපනයන නිෂ්කාශන ලබාගැනීම සහතික කිරීමට S බැඳී නැත. එය Bගේ වගකීමයි. S සහය විය යුත්තේ අදාළ තොරතුරු සහ ලේඛන ලබාගැනීම සඳහා පමණි. |
| නිශ්චිත ස්ථානයකට/ගමනාන්ත වරායකට භාණ්ඩ භාරදීම | නම් කරන ලද ගමනාන්තයකට B වෙත භාණ්ඩ භාර දීම S සිදු කරයි. භාණ්ඩ නැතිවීම හෝ ඒවාට හානි සිදුවීම හෝ පිළිබඳව වන Bගේ අවදානම් වලට එරෙහිව රක්ෂණාවරණ මිලදී ගැනීමට S බැඳී නැත. | අපනයන නිෂ්කාශන ලබාගැනීම සහ ඒ සඳහා ගෙවීම S සිදු කළ යුතු නමුත් ආනයන නිෂ්කාශන හෝ තෙවැනි රටක් හරහා යැවීමට (මාර්ගස්ථ) අදාළ නිෂ්කාශන ලබාගැනීමට S බැඳී නැත. B විසින් පිරිවැය දැරීමට යටත්ව, ලේඛන සහ/හෝ මාර්ගස්ථ සහ/හෝ ආනයන නිෂ්කාශන ලබාගැනීමට S විසින් Bට සහය විය යුතුය. |
| මුහුදු සහ අභ්‍යන්තර ගංගා ජලමාර්ග ඔස්සේ ප්‍රවාහනය | | |
| භාණ්ඩ ප්‍රවාහනයේ දී විකුණුම්කරුගේ වගකීම් සහ අවදානම් අවසන් වන හා මිලදී ගන්නාගේ වගකීම් සහ අවදානම් ආරම්භ වන තැන | B විසින් නම් කරන ලද යාත්‍රාව වෙත, නැව්ගත කිරීමේ වරායේ දී භාණ්ඩ භාර දීම S විසින් සිදු කරයි. නැව තුළට භාණ්ඩ භාර ගත් අවස්ථාවේ සිට භාණ්ඩ සහ සියලු ආශ්‍රිත පිරිවැය සඳහා B වගකිව යුතු වේ. | අපනයන නිෂ්කාශන ලබාගැනීම සහ ඒ සඳහා ගෙවීම S සිදු කළ යුතු නමුත් ආනයන නිෂ්කාශන හෝ තෙවැනි රටක් හරහා යැවීමට (මාර්ගස්ථ) අදාළ නිෂ්කාශන ලබාගැනීමට S බැඳී නැත. |
| පිරිවැය සහ භාණ්ඩ ප්‍රවාහනය | S විසින් Bගේ භාණ්ඩ, යාත්‍රාව වෙත භාර දීම සිදු කරයි. එම භාණ්ඩ ගමනාන්තය වෙත සැබැවින්ම ළඟා වුවද නොවුවද, Sගේ බැඳීම් එතෙකින් සම්පූර්ණ /අවසන් වූ බවට සැලකේ. භාණ්ඩ නැතිවීම හෝ ඒවාට හානි සිදුවීම හෝ පිළිබඳව වන Bගේ අවදානම් වලට එරෙහිව රක්ෂණාවරණ මිලදී ගැනීමට S බැඳී නැත. | අපනයන නිෂ්කාශන ලබාගැනීම සහ ඒ සඳහා ගෙවීම S සිදු කළ යුතු නමුත් ආනයන නිෂ්කාශන හෝ තෙවැනි රටක් හරහා යැවීමට (මාර්ගස්ථ) අදාළ නිෂ්කාශන ලබාගැනීමට S බැඳී නැත.<br>B විසින් පිරිවැය දැරීමට යටත්ව, ලේඛන සහ/හෝ මාර්ගස්ථ සහ/හෝ ආනයන නිෂ්කාශන ලබාගැනීමට S විසින් ඊට සහය විය යුතුය. |
| පිරිවැය රක්ෂණ සහ භාණ්ඩ ප්‍රවාහනය | S විසින් Bගේ භාණ්ඩ, යාත්‍රාව වෙත භාර දීම සිදු කරයි. එම භාණ්ඩ ගමනාන්තය වෙත සැබැවින්ම ළඟා වුවද නොවුවද, Sගේ බැඳීම් එතෙකින් සම්පූර්ණ /අවසන් වූ බවට සැලකේ. භාණ්ඩ නැතිවීම හෝ ඒවාට හානි සිදුවීම හෝ පිළිබඳව වන ඊගේ අවදානම් වලට එරෙහිව රක්ෂණාවරණ මිලදී ගැනීමට S බැඳී ඇත. | අපනයන නිෂ්කාශන ලබාගැනීම සහ ඒ සඳහා ගෙවීම S සිදු කළ යුතු නමුත් ආනයන නිෂ්කාශන හෝ තෙවැනි රටක් හරහා යැවීමට (මාර්ගස්ථ) අදාළ නිෂ්කාශන ලබාගැනීමට S බැඳී නැත.<br>B විසින් පිරිවැය දැරීමට යටත්ව, ලේඛන සහ/හෝ මාර්ගස්ථ සහ/හෝ ආනයන නිෂ්කාශන ලබාගැනීමට S විසින් Bට සහය විය යුතුය. |

# මහා බ්‍රිතාන්‍ය වෙත අපනයනය කිරීම

## 9 වන පියවර: කේතීකරණ පද්ධති කේත සහ නිපැයුම් වර්ගීකරණය

නාමමාත්‍ර ඉන්වොයිසියේ (proforma invoice) සහ විකුණුම් ගිවිසුමෙහි නිපැයුම විස්තර කරන විට, විකුණුම්කරුවන් විසින් නිපැයුමට අදාළ නිවැරදි වර්ගීකරණය හෝ කේතීකරණ පද්ධති කේතය (HS) ඇතුළත් කළ යුතුය. මහා බ්‍රිතාන්‍ය වෙත අපනයනය කිරීම් වල දී එක් එක් නිපැයුමට ඉලක්කම් 10ක නිපැයුම් කේතයක් තිබෙන අතර, එය එක්සත් රාජධානියේ භාණ්ඩ කේත (United Kingdom Commodity Code - UKCC) මගින් ලබා දී ඇත. එය ගොඩනැගෙනුයේ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් HS කේත මත වන අතර, A2 වගුව, ඇමුණුම I මගින් එය පැහැදිලි කර ඇත.

අපනයනකරුවන් විසින් නිවැරදි UKCC නිපැයුම් කේතය හඳුනාගත යුතු වේ. HS කේත සහ UKCC වර්ගීකරණයන් පිළිබඳ දළ විශ්ලේෂණයක් සඳහා A2 වගුව, ඇමුණුම I මගින් දී ඇති සවිස්තරාත්මක උදාහරණය බලන්න.

කෙසේ වෙතත්, නිපැයුමෙහි සංකීර්ණ භාවය ඉහළ නැංවෙන විට, අපනයනකරුවන් හට නිපැයුම් වර්ගීකරණය කිරීම අසීරු කාර්යයක් වනු ඇත.

### 2 වන කොටුව: එක්සත් රාජධානියේ භාණ්ඩ කේතය නිවැරදිව හඳුනා ගැනීමේ වැදගත්කම

අපනයනකරුවන් විසින් මෙම වැදගත් කාර්යය සිදු කළ යුතු වීම සම්බන්ධයෙන් හේතු දෙකක් ඇත:

1. බ්‍රිතාන්‍ය වෙළෙඳපොළ වෙත නිපැයුම් ඇතුළත් වනවිට අදාළ වන රේගු ගාස්තු සහ තීරුබදු ගණනය කිරීමට.
2. නිපැයුම් අපනයනය කිරීමට පෙර සපුරාලිය යුතු නිශ්චිත නිපැයුම් අනුකූලතා අවශ්‍යතා වටහා ගැනීමට.

බතික් ක්‍රමවේදය යොදාගෙන අතින්-මුද්‍රිත කපු හැට්ටයක් සහ කපු සායක් විස්තර කරන අයුරු සහ අදාළ විය හැකි නිපැයුම් කේතය තෝරා-බේරා ගන්නා අයුරු වටහා ගැනීමට, 3 වන කොටුව බලන්න.

මහා බ්‍රිතාන්‍ය වෙත ආනයනය සඳහා වන සම් නිපැයුම් සහ දැව නිපැයුම් වර්ගීකරණය කිරීම සම්බන්ධ බ්‍රිතාන්‍ය මගපෙන්වුම (රෙදිපිළි සහ ඇඟලුම් වර්ගීකරණ මගපෙන්වුමට සමාන වූවකි) සහ මහරජුගේ ආදායම් සහ රේගු මගින් නිකුත් කළ රේගු ගාස්තු නිවේදන ද නිපැයුම්කරුවන් සහ අපනයනකරුවන් හට කියවා බැලිය හැකිය. යම් යම් නිපැයුම් වර්ගීකරණය කරන ආකාරය පිළිබඳ නිශ්චිත තොරතුරු රේගු ගාස්තු දැන්වීම් වල අඩංගු වේ. උදාහරණ වශයෙන්, දිවීමේ දී අඳිනු ලබන බැනියමක් සඳහා වන UKCC පිළිබඳව 2022, 21 දරන රේගු ගාස්තු නිවේදනය හි නිශ්චිතව දක්වා ඇත. මෙම අත්පොත මගින් ආවරණය කර ඇති නිපැයුම් සඳහා අදාළ විය හැකි UKCCs සම්බන්ධ දළ විශ්ලේෂණයක් මෙම අත්පොතෙහි A4 වගුව, ඇමුණුම I මගින් ලබා දී ඇත.

### 3 වන කොටුව: නිපැයුම් වර්ගීකරණය පිළිබඳ උදාහරණයක්

**හැට්ටයක් සහ සායක් සඳහා නිපැයුම් වර්ගීකරණය**

හැට්ටයක් සහ සායක් යනු ඇඳුම් කැබලි දෙකකි. ඒ එක් එක් ඇඳුම කපු වලින් තනා, බතික් ක්‍රමය යොදා අතින් මුද්‍රිත ලෙසට සාදා ඇති අතර, ඒවා නොගෙතූ හෝ ක්‍රොශේ නොගෙතූ (not knitted or crocheted) ඒවා වේ.

මහා බ්‍රිතාන්‍ය වෙත ආනයනය කිරීම සඳහා වන රෙදිපිළි සහ ඇඟලුම් වර්ගීකරණය පිළිබඳ මහා බ්‍රිතාන්‍යයේ මගපෙන්වුම කියවා බැලීමෙන් පසුව, පහත දැක්වෙන ආකාරයට එක් එක් ඇඳුම විස්තර කිරීම සහ ඒ සම්බන්ධයෙන් විය හැකි කේතය තෝරා-බේරා ගැනීමට අපනයනකරුවන්ට හැකිය.

| නිපැයුම | විස්තරය | විය හැකි කේතය |
|---|---|---|
| හැට්ටය, කපු වලින් තනා බතික් ක්‍රමය යොදා අතින්-මුද්‍රිත | අත් ඇතිව හෝ නැතිව, සහ ගෙල අසල විවරයක් ඇතිව හෝ නැතිව සිරුරේ ඉහළ කොටස ආවරණය කිරීමට නිර්මාණය කළ ලිහිල් ඇඳුම්. | 6206.3000.10 |
| සාය, කපු වලින් තනා බතික් ක්‍රමය යොදා අතින්-මුද්‍රිත | සාය සමග පළඳින, උරහිස සිට වැටෙන පටි හෝ බරොත්ති (braces nor bibs) නොමැතිව සිරුරේ පහළ කොටස ආවරණය කිරීමට නිර්මාණය කළ | 6204.5200.10 |

නිපැයුමෙහි විස්තරය සැකසීම පිණිස, මෙම අත්පොතෙහි A3 වගුව, ඇමුණුම I මගින් ප්‍රශ්න සහිතව ලබා දී ඇති නිපැයුම් විස්තර අනුකෘතිය බලන්න. තමන්ගේ නිපැයුම විස්තර කිරීමට අවශ්‍ය සහය එමගින් නිපැයුම්කරුවන් වෙත ලැබෙනු ඇත.



## 10 වන පියවර: අපනයනය සඳහා මූල්‍ය පහසුකම්

විශේෂයෙන්ම, නිපැයුම්කරුවන්/අපනයනකරුවන් හට ගැනුම්කරු වෙතින් එසැණින් ගෙවීම් නොලැබෙනු ඇති බැවින්, අපනයන ගනුදෙනු වල දී මුදල් ප්‍රවාහය ඉතාමත් වැදගත් වේ. අපනයන සඳහා ශ්‍රී ලංකාවේ බැංකු විසින් පිරිනමනු ලබන මූල්‍ය පහසුකම් (කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා පහසුකම්) සලසන ණය යෝජනාක්‍රම කිහිපයක් පහත දක්වා ඇත.

- ශ්‍රී ලංකා අපනයන මණ්ඩලයේ සහයෝගීතාව සහිතව හැටන් නැෂනල් බැංකුව විසින් කුඩා සහ මධ්‍ය-පරිමාණ ව්‍යවසායකයන් සඳහා හඳුන්වා දී ඇති Hatton National Bank SME Expo Credit ණය පහසුකම
- සම්පත් බැංකුව වෙතින් Export Financing ණය පහසුකම
- සණස සංවර්ධන බැංකුව වෙතින් Import and Export Loans ණය පහසුකම
- නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් වෙතින් අපනයනකරුවන් හා නවෝත්පාදකයන් සඳහා වන මූල්‍ය සහ උපදේශන සේවාවන් - ජයගමු ශ්‍රී ලංකා
- පෑන් ඒෂියා බැංකුව වෙතින් Pre and Post Shipment Financing

### කඩිනම් ඉඟියක්

**අපනයන මූල්‍යකරණය පිළිබඳ ඔබ සතු විකල්ප දැනගන්න**

අපනයනකරුවන් හට ඔවුන්ගේ වාණිජ බැංකුව වෙතින් අපනයන ණය යෝජනාක්‍රමයක සහය ලබාගත හැකිය. එය තමන්ගේ ව්‍යාපාරයට වඩාත් හොඳින් ගැළපෙන, ගනුදෙනු-මත පදනම් වූ ණය පහසුකමක් ද නැතිනම් කාර්යසාධනය-මත පදනම් වූ ණය පහසුකමක් ද යන වග ඔවුන්ගෙන් දැනගන්න. එසේම, අදාළ වන පොලී අනුපාතිකය, ණය පහසුකම ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ඇපකරයේ හෝ සුරක්ෂිතයේ වටිනාකම සහ ගෙවීම් සම්බන්ධ නීතිරීති ඔවුන්ගෙන් විමසා දැනගන්න.



## 1 වන රූපය: එක්සත් රාජධානියේ සංවර්ධනය වෙමින් පවතින රටවල වෙළෙඳ යෝජනාක්‍රම (DCTS) වල දළ විශ්ලේෂණය






# සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා එක්සත් රාජධානියේ වෙළෙඳ යෝජනාක්‍රමය

DCTS යටතේ, ශ්‍රී ලංකාව යනු වෙළෙඳ ගිවිසුමක් යටතේ වැඩි වරණීය සත්කාර ලබන (‘Enhanced Preference’) රටකි. එයින් අදහස් කෙරෙන්නේ, ශ්‍රී ලාංකේය අපනයනකරුවන් හට ආශ්‍රිත නිපැයුම් බොහොමයක් සම්බන්ධයෙන් ශූන්‍ය හෝ අඩු කරන ලද රේගු ගාස්තු වල ප්‍රතිලාභය ලැබිය හැකි බවයි. අපනයනයකරුවන් හට මෙම ප්‍රතිලාභය සඳහා හිමිකම් පෑම පිණිස පියවර සතරක් DCTS මගපෙන්වුම මගින් පෙන්වා දී ඇත.

## අදාළ රේගු ගාස්තු

මෙම පරිච්ඡේදයේ 9 වන පියවර මගින් පැහැදිලි කර ඇති පරිදි, නිවැරදි HS කේතය හඳුනාගැනීමෙන් පසුව නිපැයුම්කරුවන්ට/අපනයනකරුවන්ට අදාළ රේගු ගාස්තු, තීරුබදු, ප්‍රමිතීන් සහ නියාමන අවශ්‍යතා තෝරා-බේරා ගත හැකිය. අදාළ රේගු ගාස්තු තීරණය කිරීම පිණිස එක්සත් රාජධානියේ ඒකාබද්ධ මාර්ගගත රේගු ගාස්තු මෙවලම වෙතින් කඩිනම් සොයා බැලීමක් සිදු කිරීම ද නිපැයුම්කරුවන්ට සහ/හෝ අපනයනකරුවන්ට හැකි වේ. නිපැයුමට අනුව, අය කරනු ලැබිය හැකි නොයෙක් රේගු ගාස්තු වර්ග කිහිපයක් ඇති බව සැලකිල්ලට ගැනීම ද වැදගත් වේ. එකිනෙකට වෙනස් රේගු ගාස්තු වර්ග පිළිබඳ දළ විශ්ලේෂණයක් සඳහා මෙම අත්පොතෙහි ඇමුණුම I බලන්න.

## ප්‍රභවස්ථානය පිළිබඳ නීතිරීති

වරණීය රේගු ගාස්තු වෙතින් ප්‍රතිලාභ ලැබීම පිණිස, වෙනත් රටවලින් අමුද්‍රව්‍ය මිල දී ගත්තද, නිපැයුමෙහි ප්‍රභවස්ථානය ‘ශ්‍රී ලාංකික’ වන බවට හිමිකම් පෑම සඳහා නිපැයුම්කරුවන්/අපනයනකරුවන් හට එසේ වෙනත් රටවලින් අමුද්‍රව්‍ය මිල දී ගත හැකි සීමාව, ප්‍රභවස්ථානය පිළිබඳ නීතිරීති මගින් නිශ්චිතව දක්වා ඇත. ආනයනය කරනු ලබන ඕනෑම අමුද්‍රව්‍යයක් සම්බන්ධයෙන් එහි වටිනාකම, පිරිවැය සහ නිපැයුම් ක්‍රියාවලි ආදියෙහි ලේඛනගත සාක්ෂි, නිපැයුම්කරුවන්/ අපනයනකරුවන් විසින් රඳවා තබා ගත යුතු වේ. භාණ්ඩ වල ප්‍රභවස්ථානය තෝරා-බේරා ගැනීමේ නිර්ණායකයන් පිළිබඳ වැඩි විස්තර සඳහා ප්‍රභවස්ථානය පිළිබඳ නීතිරීති, ඇමුණුම I බලන්න.

## ප්‍රමිතීන් සහ නියාමන අවශ්‍යතා

මෙම අත්පොත මගින් ආවරණය කෙරෙන නිපැයුම් අපනයනය කිරීම සඳහා අදාළ වන ප්‍රමිතීන් සහ නියාමන අවශ්‍යතා පිළිබඳ සවිස්තරාත්මක දළ විශ්ලේෂණයක් මෙම අත්පොතෙහි 2 වන සහ 3 වන පරිච්ඡේද මගින් දක්වා ඇත.

### කඩිනම් ඉඟියක්

**ඔබේ නිපැයුමට පවතින අපනයන යෝග්‍යතාව පරීක්ෂා කරන්න**

මෙම අත්පොත මගින් ආවරණය කර ඇති භාණ්ඩ ශ්‍රී ලංකාව වෙතින් අපනයනය කළ හැකි බව සහ මහා බ්‍රිතාන්‍ය වෙත ආනයනය කළ හැකි බව පාඨකයන් සැලකිල්ලට ගත යුතු වේ. කෙසේ වෙතත්, සමාන නිපැයුම් කේත යටතට වැටෙනු හැකි සමාන සහ නව නිපැයුම් සම්බන්ධයෙන් යෝග්‍යතාව පිළිබඳව අපනයනකරුවන් විසින් සිය වාණිජ මණ්ඩලය වෙතින් හෝ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය වෙතින් හෝ දැන ගැනීම සුදුසු බවට ඉතා ඕනෑකමින් නිර්දේශ කරමු. අපනයනකරුවන් විසින් ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රතිපත්තිය ගැන ද දැනුම හා පුරුද්ද ඇති කරගත යුතු ය.

සියලු අවශ්‍යතාවන් පිළිබඳ ප්‍රයෝජනවත් දළ විශ්ලේෂණයක් ප්‍රමිතීන් සහ නියාමන අපනයන අවශ්‍යතා පිළිබඳ ඍජු මගපෙන්වුම මගින් ලබා දී ඇත

## DCTS යටතේ වරණීය වෙළෙඳ නීතිරීති සඳහා හිමිකම් පෑම

වරණීය වෙළෙඳ නීතිරීති යටතේ හිමිකම් පෑමේ දී, ශ්‍රී ලාංකේය අපනයනකරුවන් විසින් එසේ හිමිකම් පෑමට ඔවුන් සුදුසුකම් ලැබ ඇති බවට සනාථ කළ යුතු අතර, වාණිජ ඉන්වොයිසිය හෝ ඇසුරුම් ලැයිස්තුව (packing list) මත හෝ A පෝරමය මත, ප්‍රභවස්ථානය පිළිබඳ ප්‍රකාශනයක ආකාරයෙන් භාණ්ඩ වල ප්‍රභවස්ථානයට අදාළ ලේඛනගත සාක්ෂි ලබාදිය යුතු ය. විකුණුම් ගිවිසුමක් පිළිබඳව සාකච්ඡා කිරීමට සහ එය අත්සන් තැබීමට පෙරාතුව, සාමාන්‍යයෙන් මෙම පියවර සම්පූර්ණ කළ යුතු බව සලකන්න. ඊළඟට, තෝරා ගනු ලැබූ නිපැයුම්, මහා බ්‍රිතාන්‍ය වෙතට අපනයනය කළ හැකි දැයි පරීක්ෂා කරන්න. මිලදී ගැනීම, පිරිවැය සහ වටිනාකම, සහ අඩංගු ද්‍රව්‍ය වල නිපැයුම් ක්‍රියාවලිය ආශ්‍රිත ලේඛන ද ඇතුළුව අවශ්‍ය සියලුම ලේඛනගත සාක්ෂි; සහ භාණ්ඩ වල සහ අඩංගු ද්‍රව්‍ය වල ප්‍රභවස්ථාන තත්ත්වය පිළිබඳව අපනයනකරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකිය. වැඩි විස්තර සඳහා මෙම අත්පොතෙහි ඇමුණුම IV බලන්න.


© Shutterstock.com

02

# නිපැයුම් සහ නිපැයුම් අවශ්‍යතා සපුරාලීම

ව්‍යාපාරය ලියාපදිංචි කිරීමෙන් සහ අපනයනය කිරීමට සුදුසුකම් ලැබීමෙන් අනතුරුව, වඩාත්ම වැදගත් ඊළඟ පියවර වන්නේ, මහා බ්‍රිතාන්‍ය වෙත සාර්ථකව අපනයනය කිරීම සඳහා වන සියලුම නිපැයුම් අවශ්‍යතාවන් සහ නිපැයුම් පිරිවිතරයන් සපුරාලීම වේ. පළමුවැන්න නම්, මෙම පරිච්ඡේදයෙහි වැඩිදුරටත් පැහැදිලි කර ඇති බ්‍රිතාන්‍ය නීති, නීතිරීති සහ රෙගුලාසි යටතේ ලබා දී ඇති අනිවාර්ය අවශ්‍යතාවන් ය. දෙවැන්න නම්, මෙම අත්පොතේ 3 වන පරිච්ඡේදය මගින් පැහැදිලි කර ඇති, නීතියෙන් අවශ්‍ය නොවන්නා වූ නමුත් ගැනුම්කරුවන් සහ පාරිභෝගිකයන් විසින් ඉල්ලා සිටිනු ලබන්නා වූ ස්වෙච්ඡා සහතික කිරීම් (යම් නිපැයුමක ගුණාත්මක භාවය, භාවිතයට ආරක්ෂා සහිත බව, හෝ කාර්යක්ෂමතාව පිළිබඳ නිශ්චිත ප්‍රමිතීන් සපුරාලන බව දැක්වෙන ලේඛනයකි) වේ.

අපනයනය සඳහා නිපැයුම් සූදානම් කිරීමට පෙරාතුව, නිපැයුම්කරුවන් විසින් සපුරාලිය යුතු අනිවාර්ය, නීතිමය අවශ්‍යතාවන් පිළිබඳ කාණ්ඩ හයක් වේ. එම කාණ්ඩ නම්:

- නිපැයුමෙහි ආරක්ෂිත බව;
- වඳ වී යාමේ තර්ජනයට ලක් වූ ශාඛ සහ සතුන් භාවිත කර නොමැති බව;
- බුද්ධිමය දේපළ අයිතීන් (IPRs);
- නිපැයුමෙහි තිරසර භාවය;
- නිපැයුමෙහි ඇසුරුම්කරණය;
- නිපැයුමෙහි ලේබල.

නිපැයුම, නිර්මාණය සහ අමුද්‍රව්‍ය වලට අනුව ඉහත එක් එක් කාණ්ඩයට අදාළ වන අවශ්‍යතා වෙනස් වන බව නිපැයුම්කරුවන් සැලකිල්ලට ගත යුතු වේ.

නිපැයුම් ක්‍රියාවලියෙහි නොයෙක් අදියර වලදී මෙකී අවශ්‍යතා අදාළ වේ. ඇතැම් අවශ්‍යතා අමුද්‍රව්‍ය වලට පමණක් අදාළ වනවිට, අනෙකුත් අවශ්‍යතා එකිනෙකට වෙනස් නිපැයුම් අදියර වලදී අදාළ විය හැකිය. ඔබේ සැපයුම්කරුවන් අදාළ නීතිමය අවශ්‍යතාවන්ට අනුකූල බවට වන අවශ්‍ය අනෙකුත් සියලුම ලේඛන ඔබ වෙත ලබාදෙන බවට සහතික වන්න.

# නිපැයුමෙහි ආරක්ෂිත බව

## නිපැයුම පිළිබඳ පොදු ආරක්ෂිත භාවය

මහා බ්‍රිතාන්‍ය සිය වෙළෙඳපොළ වෙත ඉදිරිපත් කරන්නට අවසර ලබා දෙන්නේ ආරක්ෂිත භාවය සහිත නිපැයුම් වලට පමණි. එයින් අදහස් වන්නේ කුමක් ද? ගනුදෙනුකරුවකු විසින් යම් වෙළෙඳසැලකින් යම් නිපැයුමක් මිලදී ගන්නා විට, එය භාවිත කිරීමෙන් ඔවුන්ගේ සෞඛ්‍යයට හෝ ආරක්ෂාවට හෝ සෘජුව හෝ වක්‍රව විය හැකි කිසිදු අවදානමක් එහි නොවිය යුතු බවයි. ගනුදෙනුකරුවන් මිල දී ගනු ලැබිය හැකි සියˇ ම නිපැයුම් සම්බන්ධයෙන් නිපැයුම් පිළිබඳ පොදු ආරක්ෂණ රෙගුලාසි, 2005 අදාළ වේ. එවැනි නිපැයුම් පිළිබඳ උදාහරණ වලට ටී-ෂර්ට්, මුදල් පසුම්බි, අත්බෑග සහ ගෘහ අලංකරණ අයිතම ද ඇතුළත් වේ.
භාවිතය හේතුවෙන් මානව සෞඛ්‍ය සහ ආරක්ෂාවට ඇති විය හැකි යම් වක්‍ර අවදානම් පිළිබඳ තොරතුරු සියˇ ම නිපැයුම් වල අඩංගු වන බවට සහ එවැනි යම් වක්‍ර අවදානමකට එරෙහිව ගත යුතු ආරක්ෂිත පියවර සඳහන් කිරීමට ද සහතික වන්න.

### 4 වන කොටුව: නිපැයුම පිළිබඳ ආරක්ෂිත භාවය පරීක්ෂා කිරීම

**නිපැයුමක් ආරක්ෂිත බව පරීක්ෂා කරන විට බලධාරීන් විසින් සැලකිල්ලට ගනු ලබන්නේ මොනවාද?**

- නිපැයුමෙහි අඩංගු දෑ හි ගුණය සහ එය සැදුම්ලත් අයුරු
- ඇසුරුම්කරණය සහ රැකබලා ගැනීම හා නඩත්තු කිරීම සම්බන්ධ උපදෙස්
- භාවිතය සහ බැහැර කිරීම සම්බන්ධයෙන් ලේබල, අනතුරු ඇඟවීම් සහ උපදෙස්
- මෙම නිපැයුම, වෙනත් නිපැයුම් සමග භාවිත කළහොත් එම නිපැයුම් වලට එහි ඇති බලපෑම
- නිපැයුම භාවිතය මගින් අවදානමට ලක්විය හැකි පරිභෝජක-යන්; ළමුන් සහ වැඩිහිටි පුද්ගලයන් වැනි.

### 5 වන කොටුව: නිපැයුම පිළිබඳ ආරක්ෂිත භාවය සහතික කිරීම සම්බන්ධයෙන් නිර්දේශිත පරිචයන්

**නිපැයුමෙහි ආරක්ෂිත භාවය පිළිබඳ නීති අනුව කටයුතු කිරීම**

- වාර්තා පවත්වා ගැනීම: නිපැයුම නිර්මාණය, භාවිත කළ අමුද්‍රව්‍ය සහ ආශ්‍රිත සැපයුම්කරුවන්, නිපැයුම් කේතය සහ අපනයනය කිරීමට නිපදවූ භාණ්ඩ වල කාණ්ඩය වැනි සියලුම තාක්ෂණික තොරතුරු ලේඛනගත කරන්න; වසර 5ක් සඳහා එම තොරතුරු වල භෞතික හෝ ඉලෙක්ට්‍රොනික පිටපතක් සුරැකිව තබාගන්න.
- ආරක්ෂාව පිළිබඳ උපදෙස්: ආරක්ෂාකාරී ලෙස නිපැයුම භාවිත කළ හැකි ආකාරය පිළිබඳ උපදෙස් සහිත කාඩ්පතක් නිපැයුමට ඇතුළත් කරන්න.
- නම් කරන ලද ප්‍රමිතීන් භාවිත කරන්න (අදාළ තන් හි): නම් කරන ලද ප්‍රමිතීන් ප්‍රමිතීන් භාවිතය, නිපැයුම්කරුවන් හට නිපැයුමෙහි ආරක්ෂිත භාවය පිළිබඳ නීති සමග පවතින 'අනුකූලතාව පිළිබඳ පූර්ව-නිගමනය' ද පෙන්වීමේ හැකියාව ලැබේ. අදාළ වන නම් කරන ලද ප්‍රමිතීන් පිළිබඳ වැඩි විස්තර මෙතැනින් සොයා බලන්න.
- නිපැයුමෙහි ආරක්ෂිත භාවය පිළිබඳ ඇඟවුම්: නිපැයුමෙහි ආරක්ෂිත භාවය සහ ප්‍රමිතීන් සඳහා වන බ්‍රිතාන්‍ය කාර්යාලය විසින් විධිමත් කාලාන්තරයන් හි දී නිපැයුමෙහි ආරක්ෂිත භාවය පිළිබඳ ඇඟවුම්, වාර්තා සහ යළි කැඳවීම් ප්‍රකාශයට පත් කරනු ලබයි.



# රසායන ද්‍රව්‍ය නියාමනය පිළිබඳ ලියාපදිංචි කිරීම, ඇගයීම, බලය ලබාදීම සහ සීමා කිරීම

සම්, රෙදිපිළි හෝ ඇඟලුම් නිපැයුමට භාවිත කළ රසායන ද්‍රව්‍ය හෝ වෙනත් ද්‍රව්‍ය වල මානව සෞඛ්‍යයට සහ පරිසරයට හානි කළ හැකි විෂ සහිත දෑ අඩංගු විය හැකිය. මෙකී ද්‍රව්‍ය, දැඩි සැලකිල්ල යොමු විය යුතු ද්‍රව්‍ය (SVHCs) වශයෙන් ද හඳුන්-වනු ලැබේ. SVHCs පිළිබඳ වැඩි විස්තර සඳහා 6 වන කොටුව බලන්න.

රසායනික ද්‍රව්‍ය පිළිබඳ ලියාපදිංචිය, ඇගයුම, බලය ලබාදීම සහ සීමා කිරීම (REACH) සම්බන්ධ රෙගුලාසිය මගින් SVHCs සහ ඒවායෙහි භාවිතයට අදාළ නීතිරීති දක්වා ඇත. භාණ්ඩ නිෂ්පාදනයට හෝ නිපැයුමට භාවිත කරන ලද රසායන ද්‍රව්‍ය වලට එය අදාළ වේ. උදාහරණ වශයෙන්, ආභරණ නිපැයුම් වලදී, ඊයම් සාන්ද්‍රණය බරින් 0.05%ට සමාන හෝ නොවැඩි හෝ නොවිය යුතු අතර, කැඩ්මියම් වල බර අනුව, එම ලෝහයේ සාන්ද්‍රණය 0ග01% ( 100 මිග්‍රෑ/කිලෝ) ඉක්මවීම නොකළ යුතු ය.
මෙම අත්පොත මගින් ආවරණය කෙරෙන නිපැයුම් වල බහුලව දක්නට ලැබෙන SVHCs සහ SVHCs භාවිත කිරීම පිළිබඳ වැඩි විස්තර ඇමුණුම II සඳහා බලන්න.

## REACH අනුකූලතාව

මෙම අත්පොත මගින් ආවරණය කළ සියලුම නිපැයුම්, බ්‍රිතාන්‍ය වෙළෙඳපොළ වෙතට පිවිසීමට පෙර REACH අනුකූලතාව සහිත විය යුතු වේ. REACH අනුකූලතාව සහතික කරන ලද අමුද්‍රව්‍ය මිලදී ගැනීමට සහ සැපයුම්කරුවන් විසින් ඉන්වොයිසි සහ පරීක්ෂා කිරීමේ සහතික ලබාදෙන බවට සහතික වන්න. භාවිත කරන ලද රසායන ද්‍රව්‍ය සහ අන්තරාකාරී ද්‍රව්‍ය අවසර ලත් සීමාවන් තුළ පවතින බව මෙකී සහතික මගින් සනාථ කෙරෙයි. REACH පරීක්ෂාවක් පැවතියහොත්, ඉන්වොයිසි සහ පරීක්ෂා කිරීමේ සහතික එකතු කරගැනීම සහ සන්තකයේ තබාගැනීම ප්‍රයෝජනවත් බව ඔප්පු වනු ඇත.

### 6 වන කොටුව: SVHC යනු කුමක්ද?

යම් ද්‍රව්‍යයක් පහත පරිදි වූ විට, එය SVHC බවට පත් වේ:

- එමගින් පිළිකා ඇති විය හැකි වීම හෝ ප්‍රජනනයට විෂ සහිත වීම;
- එය දිගු කාලයක් පරිසරයේ රැඳී පැවතීම;
- එය ක්‍රමයෙන් එක්රැස් වෙමින් මානව සිරුර තුළ රැඳී පැවතීම;

උදාහරණ වශයෙන්: රෙදිපිළි මත ආලේප තට්ටුවක් තැවරීමේ දී, නිපැයුම්කරුවන් විසින් UV-320, UV-327, UV-328 and UV-350 වැනි බෙන්සොට්‍රියසොල් සංයෝග අඩංගු රසායන ද්‍රව්‍ය භාවිත කරනු ලබයි. මේවා විෂ සහිතය, කල් පවතියි සහ පරිසරය තුළ ගොඩ ගැසෙයි. මෙකී රසායන ද්‍රව්‍ය වලට නිරන්තරයෙන් නිරාවරණය වීම මානව සෞඛ්‍යයට හානිකර විය හැකි බැවින්, ඒවා SVHCs වශයෙන් කාණ්ඩගත කර ඇත.

### 7 වන කොටුව: ශ්‍රී ලංකාව REACH තුළ පරීක්ෂාව

QIMAසහ SGS යනු ශ්‍රී ලංකාව තුළ REACH පරීක්ෂණ සේවාව පිරිනමන තෙවැනි-පාර්ශ්වයේ රසායනාගාර දෙකකි. REACH රසායනාගාර පරීක්ෂාවක් සඳහා, පරීක්ෂාවට ලක් කරනු ලබන ද්‍රව්‍ය සංඛ්‍යාව සහ ප්‍රභේදනයන්ට අනුව, ඇමරිකා-නු ඩොලර් 300ක් සහ 600ක් අතර මුදලක් වැය විය හැකිය.

## ජෛවනාශක

දිලීර සහ කෘමීන් වැනි හානිකර සත්වයකු හෝ ශාඛයක බලපෑම ජෛවනාශක විසින් බැහැර කිරීම හෝ අවම කිරීම සිදු කරනු ලබන අතර සතුන් හා මිනිසුන් ආරක්ෂා කිරීම සඳහා එකී ජෛවනාශක යොදා ගනු ලබයි. ඊට පොදු උදාහරණ, කෘමි විකර්ෂක (insect repellent) සහ දැව ආරක්ෂක ද්‍රව්‍ය වේ. රෙදිපිළි හෝ රෙදි වලින් තැනූ ද්‍රව්‍ය වල විෂබීජ නාශක සහ ඇල්ගී නාශක වැනි ජෛවනාශක අඩංගු විය හැකිය. සමින් කරනු ලබන නිපැයුම් වල දී ද ජෛවනාශක භාවිත කළ හැක්කේ ක්ෂුද්‍ර-ජීවවිද්‍යාත්මක හානි වැළැක්වීම පිණිස ය. ජෛවනාශක යෙදූ සියලුම නිපැයුම් හැඳින්වෙන්නේ, 'පදම් කළ භාණ්ඩ' ('treated articles') වශයෙනි. මෙකී ජෛවනාශක ද්‍රව්‍ය සෘජුව ම මිනිසුන්ට හෝ සතුන්ට යොදනු නොලබන නමුත්, මිනිසුන් විසින් භාවිත කරනු ලබන භාණ්ඩ වල බොහෝ විට ඒවා පවතියි. එවැනි සියලුම ජෛවනාශක ද්‍රව්‍ය පිළිබඳ විස්තර මෙතැනින් ලබාගත හැකිය.

මෙම අත්පොත මගින් ආවරණය කෙරෙන නිපැයුම්, 'පදම් කළ භාණ්ඩ' වශයෙන් සැලකිය හැකි අතර, එම නිසා නිපැයුම්කරුවන් විසින් සිය සැපයුම්කරුවන් සමග කථා කර, අමුද්‍රව්‍ය වල ජෛවනාශක භාවිත කර ඇති බව තහවුරු කරගත යුතු වේ.

## නොනැසී පවත්නා කාබනික දූෂක

නොනැසී පවත්නා කාබනික දූෂක (POPs) යනු පහසුවෙන් අනු-කොටස් බවට පත් නොවන රසායන ද්‍රව්‍ය වේ. POPs දිගු කාලයක් පරිසරයේ රඳා පතියි; ඒවා විවිධ භූගෝලීය ප්‍රදේශ කරා ප්‍රවාහනය කළ හැකිය; මත්ස්‍යයින්, කුරුල්ලන් සහ සතුන් තුළ එක්රැස් ව පැවතිය හැකියි; සහ මානව සෞඛ්‍යයට හානිකර විය හැකියි.

උදාහරණ වලට DDT, එන්ඩොසල්ෆන්, ඇල්ඩ්‍රින් සහ එල්ඩ්‍රින් ඇතුළත් වේ. කෘමිනාශක සහ කර්මාන්ත භාවිත කරන රසායන ද්‍රව්‍ය වල POP දක්නට ඇත. ද්‍රව්‍ය වල, සැකසීමේ දී හෝ රෙදිපිළි වැනි නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ වල හිතා-මතා එක් නොකළ අල්ප දූෂක (unintentional trace contaminants) ලෙස POP දක්නට ලැබුණහොත් හැර, සාමාන්‍යයෙන් ඒවායෙහි භාවිතය මහා බ්‍රිතාන්‍ය විසින් තහනම් කර තිබෙන්නකි. හිතා-මතා එක් නොකළ අල්ප දූෂක වල පැවතිය හැකි අවසර ලත් සීමාවන් මහා බ්‍රිතාන්‍ය විසින් ලැයිස්තුගත කර ඇති අතර, එම ලැයිස්තුව වෙත මෙතැනින් ප්‍රවේශ විය හැකිය.

නිපැයුම් ක්‍රියාවලි වලදී භාවිත කරනු ලබන අමුද්‍රව්‍ය වල POPs කිසිවක් අඩංගු නොවන බවට සහ ඒවා අඩංගු වේ නම් ඒවායෙහි මට්ටම්, හිතා-මතා එක් නොකළ අල්ප දූෂක වල පැවතිය හැකි අවසර ලත් සීමාවන් තුළ පවතින බවට නිපැයුම්කරුවන් සහතික කරගත යුතු වේ. නිපැයුම්කරුවන් විසින් මේ ගැන සිය සැපයුම්කරුවන් සමග සාකච්ඡා කරන ලෙසට සහ, නිපැයුම්කරුවන් වෙත ලැබෙන අමුද්‍රව්‍ය අහඹු පරීක්ෂාවන්ට ලක් කර, ඒවායෙහි POPs අඩංගු වේ දැයි සොයා බලන ලෙසට නිර්දේශ කෙරෙයි.

## රාත්‍රී-ඇඳුම් පිළිබඳ ආරක්ෂිත භාවය

වයස අවුරුදු 13ට අඩු අය විසින් අඳිනු ලැබීම වෙනුවෙන් නිර්මාණය කර ඇති ළමුන් සඳහා වන රාත්‍රී ඇඳුම්, නිපැයුම කළ යුත්තේ දැවෙනසුලු බව පිළිබඳ කාර්යසාධන අවශ්‍යතාවන් (flammability performance requirements) සපුරාලන තන්තු වලිනි. පිජාමා, ළදරු ඇඳුම් සහ ස්නානය කිරීමෙන් ඇඟලන කපු ටෙරි ටවලින් වලින් කළ ඇඳුම් (cotton terry towelling bathrobes) මෙම අවශ්‍යතාවන් වෙතින් බැහැර කෙරෙන නමුදු, සුදුසු ලේබල ඒවායෙහි අඩංගු විය යුතු වේ. වැඩිහිටි රාත්‍රී ඇඳුම් ද සුදුසු ලේබල් කිරීමේ අවශ්‍යතාවන්ට අනුකූල විය යුතු වේ. දැවෙනසු¨ බව පිළිබඳ කාර්යසාධන අවශ්‍යතාවන් පිළිබඳ වැඩි විස්තර සඳහා ඇමුණුම II බලන්න.






# වඳ වී යාමේ තර්ජනයට ලක්ව ඇති ශාඛ සහ සතුන්ගෙන් කළ නිපැයුම්

ඇතැම් නිපැයුම් තනනු ලබන්නේ පෘථිවිය නැමති ග්‍රහලෝකයෙන් වඳ වී යාමේ තර්ජනයට ලක්ව ඇති ශාඛ හෝ සතුන්ගේ ලැබෙන, විරල හෝ දුර්ලභ අමුද්‍රව්‍ය වලිනි. වඳ වී යාමේ තර්ජනයට ලක්ව ඇති වන සත්ව හා වෘක්ෂලතා විශේෂ වල ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ සම්මුතිය (CITES) යනු එවැනි අමුද්‍රව්‍ය වෙළෙඳාම නියාමනය කරනු ලබන ජාත්‍යන්තර ගිවිසුමකි. CITES යටතේ ශාඛ සහ සත්වයින් කාණ්ඩගත කර ඇත්තේ ඔවුන් පෘථිවියෙන් වඳ වී යාමේ තර්ජනය සැලකිල්ලට ගනිමිනි. සම්පූර්ණයෙන්ම වඳ වී යාමේ අවදානමට ලක් ව ඇති විශේෂයන් පිළිබඳව CITES උපග්‍රන්ථය I හි වර්ගීකරණය කර ඇත. CITES උපග්‍රන්ථ II හෝ III හි යම් ශාකයක් හෝ සත්වයකු වර්ගීකරණය කර තිබේ නම්, එය තදින් ම වඳ වී යාමේ අවදානමට පාත්‍ර වූවක් නොවන නමුදු එය වෙළෙඳාම් කිරීම පාලනය කළ යුතු වූවක් වේ. ව්‍යාපාර සම්බන්ධයෙන්, එයින් අදහස් වන්නේ, ව්‍යාපාරිකයන් විසින් ඒ සම්බන්ධයෙන් අවසර ඉල්ලා අයදුම් කළ යුතු බව සහ සිය නිපැයුම් අපනයනය කිරීමට පෙරාතුව අපනයන බලපත්‍රයක් ලබාගත යුතු බවයි.

> **කඩිනම් ඉඟියක්**
>
> අපනයන නිපැයුම් වල විශේෂ අඩංගු දැයි පිරික්සන්න
>
> සත්වයකු හෝ ශාඛයක් යම් CITES උපග්‍රන්ථයක ලැයිස්තුගත කර ඇති දැයි පරීක්ෂා කිරීමට, මෙම සබැඳිය ක්ලික් කර, සත්වයාගේ හෝ ශාඛයේ නම සෙවුම් තීරුවට ඇතුළත් කර බලන්න.

ශ්‍රී ලංකාව සහ එක්සත් රාජධානිය යන දෙරට ම CITES සම්මුතියට අත්සන් තැබූ රටවල් ය. එයින් අදහස් වන්නේ රටවල් දෙක ම සහ ඔවුන් අතර වන ව්‍යාපාරයන් ද ඊට අනුකූලව කටයුතු කළ යුතු බවයි. ශ්‍රී ලංකාව තුළ CITES බලාත්මක කරනු ලබන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසිනි. ඔබගේ නිපැයුම තනා ඇත්තේ CITES උපග්‍රන්ථ II හෝ III හි වර්ගීකරණය කර ඇති සත්වයකුගෙන් හෝ ශාඛයකින් ලබාගත් ද්‍රව්‍ය වලින් නම්, CITES සහතිකය ලබාගැනීම පිණිස ඔබේ අයදුම්පත වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන්න. අවශ්‍ය අනෙකුත් සියලුම ලේඛන සහ වැඩි විස්තර මෙතැනින් බලන්න.

# බුද්ධිමය දේපළ අයිතිවාසිකම්

මෙම අත්පොත මගින් ආවරණය කර ඇති සෑම නිපැයුමක්ම, සුවිශේෂී සංකල්පනාවකින් බිහි වූවකි. මෙම සංකල්පනාව, වෙළෙඳපොළෙහි විකිණිය හැකි යමක් ලෙසට පත් කිරීමට නිර්මාණාත්මක බව, සුවිශේෂී මෝස්තර හෝ නිර්මාණ, මාස ගණනාවක පර්යේෂණ සහ නිශ්චිත දැනුමක් ද අවශ්‍ය වේ. බුද්ධිමය දේපළ අයිතිවාසිකම් (IPRs) ආකාරයෙන් වන නීතිය මගින් මෙවැනි නිර්මාණ ආරක්ෂා කෙරෙයි. විවිධ වර්ගයේ IPRs පවතින අතර, ඒ එක් එක් වර්ගය මගින් නොයෙක් කාර්යයන් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබයි. එවා නම්, පේටන්ට් බලපත්‍ර, ප්‍රකාශන හිමිකම, මෝස්තර, වෙළෙඳ ලකුණු, භූගෝලීය දර්ශකයන් සහ වෙළෙඳ රහස් ය.

මෙම අත්පොත මගින් ආවරණය කරනු ලබන නිපැයුම් නිපදවනු ලබන නිපැයුම්කරුවන්, බ්‍රිතාන්‍ය නිපැයුම්කරුවන්ගේ IPRs වලට ගරු කිරීම, ප්‍රවේශම් සහගත ව සහතික කළ යුතු වේ. ඒවාට ගරු නොකළහොත්, එවැනි නිපැයුම් වලට බ්‍රිතාන්‍ය වෙළෙඳපොළට ඇතුළු වීමට අවසර නොලැබෙනු ඇත. එයින් අදහස් වන්නේ, නිපැයුම්කරුවන් විසින් මහා බ්‍රිතාන්‍යයේ නීති අවබෝධ කරගෙන තිබිය යුතු වීමයි.

ඊට සමගාමීව, සුවිශේෂී නිපැයුම්, ශ්‍රී ලංකාව තුළ ද ආරක්ෂණය කළ හැකි වේ. එසේ කිරීමට නම්, ශ්‍රී ලාංකික නිපැයුම්කරුවන් විසින් නිවැරදි IPR ලියාපදිංචි කිරීමකට අයදුම් කර, එය ලබාගත යුතු වේ. ඉන් අනතුරුව, එකී IPRහිමිකරු හට බලපත්‍ර පිළියෙළ කරගැනීමේ කටයුතු වලට පිවිස, තම IPR උල්ලංඝනය වන ලෙස වෙනත් අය විසින් තමන්ගේ IPRs අයිතිවාසිකම් කඩ කෙරෙන ආකාරයෙන් යන්ත්‍රානුසාරයේ සිදු කරන නිෂ්පාදන (manufacturing), ස්වාභාවික දෑ මගින් සිදු කරන නිපැයුම් (producing), විකිණීම සහ/හෝ භාණ්ඩ ආනයනය කිරීම වැළැක්වීම සඳහා තම අයිතීන් සම්බන්ධයෙන් ක්‍රියා කළ හැකිය. මෙම අත්පොත මගින් ආවරණය වන නිපැයුම් සියල්ලටම විශේෂිත සන්නාම (වෙළෙඳ ලකුණු මගින් ආරක්ෂිත) සහ සැලසුම (මෝස්තර) (සැලසුම් මගින් ආරක්ෂිත) ඇත. මෙම කොටස මගින් වෙළෙඳ ලකුණු සහ සැලසුම (මෝස්තර) පිළිබඳව සහ ශ්‍රී ලංකාව තුළ ඔබේ IPR ආරක්ෂා කරගන්නා අයුරු, සහ අපනයනය කරන නිපැයුම මගින් මහා බ්‍රිතාන්‍යයේ IPR ආරක්ෂණය උල්ලංඝනය කළහොත් සිදු වන්නේ කුමක් ද යන්න පිළිබඳ දළ විශ්ලේෂණයක් සපයනු ලබයි.

## වෙළෙඳ ලකුණු

එක් ව්‍යාපාරයකින් තවත් ව්‍යාපාරයක නිපැයුම් සහ සේවාවන් වෙන්කර හඳුනා ගැනීමට භාවිත කරන ලකුණු, වෙළෙඳ ලකුණු ලෙස හැඳින්වේ. අකුරු, වචන, අංක, චිත්‍ර සහ සංකේත එකට එක් කළ දෘශ්‍ය ලකුණු වලට වෙළෙඳ ලකුණු ලියාපදිංචි කිරීමක් ලබාගත හැකි වේ. නිපැයුමක හැඩයට හෝ ඇසුරුමකට ද ඒවා ලබාදිය හැකිය. වෙනත් ආකාරයේ IPR මෙන්ම, අයදුම් කරන ලද රට තුළ දී වෙළෙඳ ලකුණු වලට ද ආරක්ෂාව ලැබේ. ඔබගේ සන්නාමය ආරක්ෂා කරගැනීම සඳහා ඔබේ වෙළෙඳ ලකුණ ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය හි ලියාපදිංචි කරන්න. අයදුම්පත ලියාපදිංචි කිරීම සඳහා වන ගාස්තු මෙතැනින් බලන්න.

### කඩිනම් ඉඟියක්

ඔබේ සන්නාමය ආරක්ෂා කරගැනීම පිණිස, වෙළෙඳ ලකුණ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය වේගවත් කරගැනීමට සහ ශ්‍රී ලංකාව තුළ සහ වෙනත් රටවල දී වෙළෙඳ ලකුණක් ලියාපදිංචි කිරීමේ පිරවැය සහ ප්‍රතිලාභ තක්සේරු කරගැනීමට, IPR නීතිඥයකු සමග කථා කරන්න. එක් එක් අයදුම්පත සඳහා මුදල් ගෙවිය යුතු බව සිහිතබා ගැනීම වැදගත් ය. විවිධ රටවල් තුළ ලියාපදිංචිය සඳහා අයදුම් කිරීමේ දී අදාළ වන පිරිවැය සහ ප්‍රතිලාභ අධ්‍යයනය කිරීමට වග බලා ගන්න.

වෙළෙඳ ලකුණ ලියාපදිංචි කිරීමෙන් පසු, එම වෙළෙඳ ලකුණ හිමිකරු වෙත ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලැබේ. එමගින්, වෙළෙඳ ලකුණ සම්බන්ධයෙන් වසර 10ක පරම අයිතිවාසිකම් වෙළෙඳ ලකුණ හිමිකරු වෙත ප්‍රදානය කෙරෙයි. අදාළ ගාස්තු ගෙවීම මගින් මෙම ලියාපදිංචිය ආවර්තීයව අලුත් කළ හැකි වනු ඇත. වෙළෙඳ ලකුණ අනන්‍ය ලෙස භාවිත කිරීමේ හැකියාව එහි හිමිකරුට ලැබෙන අතර, ඉන් අදහස් වන්නේ හිමිකරුගේ අවසරයකින් තොරව එකී වෙළෙඳ ලකුණ වෙනත් අයෙකු හට භාවිත කළ නොහැකි බවයි. විකල්ප වශයෙන්, බලපත්‍ර ගාස්තුවක් ලබාගෙන, වෙළෙඳ ලකුණ බලපත්‍රයක් ලෙස භාවිත කිරීමේ අවසරය තෙවැනි පාර්ශ්වයක් වෙත ලබාදීමේ හැකියාව හිමිකරුට පවතියි.

විවිධ රටවල දී වෙළෙඳ ලකුණෙහි ආරක්ෂණය පිළිබඳව, අයදුම්කරුවන් හට විකල්ප දෙකක් පවතියි. ජාතික මට්ටමෙන්, සිය සන්නාමය ලියාපදිංචි කර, ආරක්ෂා කරගැනීමට අපේක්ෂා කරන අයදුම්කරුවකු සියලුම රටවල් සඳහා වෙන වෙන ම අයදුම්පත් ඉදිරිපත් කිරීම කළ යුතු වේ. ජාත්‍යන්තර මට්ටමෙන්, රටවල් 130ක් දක්වා ආරක්ෂණය ලබාගැනීම සඳහා, මැඩ්රිඩ් ක්‍රමවේදය භාවිත කරමින් අයදුම්කරු හට එක් තනි අයදුම්පතක් ඉදිරිපත් කළ හැකි වේ.



## සැලසුම්

සැලසුම් (මෝස්තර) හෝ කාර්මික සැලසුම් මගින් ත්‍රිමාන (නිපැයුමේ හැඩය හෝ වින්‍යාසය) වශයෙන් හෝ ද්විමාන (වර්ණ, සෑදී ඇති ආකාරය සහ රටාවන්) වශයෙන් වනවිට නිපැයුමට පණ පෙවීමක් සිදු වේ. මේවා මගින් නිපැයුමක විසිතුරු පෙනුම් හෝ නිපැයුමෙහි කලාත්මක සහ බාහිර පෙනුම නිර්මාණය කරයි. ඔබේ සැලසුම (මෝස්තරය) ලියාපදිංචි කිරීම පිළිබඳ වැඩි විස්තර ලබාගැනීමට, ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය බලන්න.

සැලසුම (මෝස්තරය) ලියාපදිංචි කිරීමෙන් පසු, අයදුම්කරු වෙත ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලැබේ. එමගින්, සැලසුම සම්බන්ධයෙන් වසර 10ක පරම හිමිකම ප්‍රදානය කෙරෙයි. අ¨ ත් කිරීමේ අයදුම්පතක් ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය ඉදිරිපත් කිරීම මගින් ලියාපදිංචි වූ හිමිකරු හට තම සැලසුමෙහි ලියාපදිංචිය අ¨ ත් කළ හැකිය.

සිරිතක් වශයෙන්, බොහෝ අවස්ථා වලදී සිදුවන්නේ අයදුම්පත පිළිබඳ සම්පූර්ණ ක්‍රියාවලිය සඳහා සහය පිණිස අයදුම්කරු විසින් IPR නියෝජිතයකුගේ සේවය ලබාගැනීමයි. නියෝජිතයා වෙත ගෙවනු ලබන ගාස්තුව ද අයදුම්පතෙහි සංකීර්ණ භාවය මත රඳා පවතියි.

සැලසුමට ආරක්ෂණය ලැබීමෙන් පසු, වෙනත් අය විසින් මුදල් ඉපැයීම පිණිස ආරක්ෂිත සැලසුම copying අනුකරණය කිරීම හෝ ප්‍රමාණවත් අන්දමින් අනුකරණය කිරීම මගින් භාණ්ඩ නිෂ්පාදනය කිරීම, නිපැයුම, විකිණීම සහ/හෝ ආනයනය කිරීම වැළැක්වීමේ හැකියාව හිමිකරුට පවතියි. එසේම, තවත් වැදගත් කරුණක් වන්නේ, ඕනෑම සැලසුම් ආරක්ෂණයක් දේශභූමික බව සැලකිය යුතු බවයි, එනම්, එය ආරක්ෂා කෙරෙනුයේ එවැනි ආරක්ෂණයක් ප්‍රදානය කළ රට තුළ පමණි.

බහුවිධ රටවල සැලසුම් ආරක්ෂණය ලබා ගැනීමේ දී අයදුම්කරුට විකල්ප දෙකක් ඇත. ජාතික මට්ටමෙන්, සිය සැලසුම ලියාපදිංචි කිරීමට සහ ආරක්ෂා කිරීමට අදහස් කරන සියලු රටවල් වලදී අයදුම්කරු විසින් වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ. ජාත්‍යන්තර මට්ටමෙන්, රටවල් 90කට වැඩි සංඛ්‍යාවක් දක්වා ආරක්ෂණය ලබාගැනීම සඳහා, හේග් ක්‍රමවේදය භාවිත කරමින් අයදුම්කරු හට එක් තනි අයදුම්පතක් ඉදිරිපත් කළ හැකි වේ.

### 8 වන කොටුව: සැලසුම් (මෝස්තර) ආරක්ෂණය ලබාගැනීම පිළිබඳ අවශ්‍යතා

- එය නව සැලසුමක් විය යුතුය, එනම් අයදුම් කර ඇති භාණ්ඩයේ සැලසුමට සමාන වෙනත් සැලසුමක් වෙළෙඳපොළ තුළ නොතිබිය යුතු බවයි.
- නවමු නිර්මාණයක් විය යුතු ය, එනම් දැනට පවතින සැලසුමක (මෝස්තරයක) අනුකරණයක් නොවන බවයි.

### 9 වන කොටුව: ඔබේ නිපැයුම කැපී පෙනෙන බව ඇති කළ හැකි අයුරු

1. මහා බ්‍රිතාන්‍ය තුළ නිවැරදි නිපැයුම් වෙළෙඳපොළ ඔබ විසින් සොයා ගත් පසුව, ඔබේ තරගකරුවන්ගේ නිපැයුම් පිළිබඳ විස්තර ගවේෂණය කර, ඔබේ නිපැයුම් ඒවායින් වෙනස් විය හැක්කේ කෙසේදැයි බලන්න.

2. රහස්‍ය භාවය පිළිබඳ ගිවිසුමක් අත්සන් තැබීමකින් තොරව, අපනයන නියෝජිතයකු, විභවීය වෙළෙඳ හවුල්කරුවකු හෝ බෙදාහරින්නෙකු වෙත කිසිදු අවස්ථාවක ඔබේ නව්‍ය නිපැයුම ගැන තොරතුරු හෙළිදරව් නොකළ යුතුය.

### කඩිනම් ඉඟියක්

විකුණුම් ගිවිසුමක ඔබේ වෙළෙඳ ලකුණ සහ සැලසුම් ලියාපදිංචිය පිළිබඳ විස්තර හැම විටම ඇතුළත් කිරීමට මතක තබාගන්න. ඔබ සතු ආරක්ෂිත වෙළෙඳ ලකුණ සහ/හෝ සැලසුම ආනයනය කරන්නා හෝ බෙදාහරින්නා විසින් භාවිත කිරීම පිළිබඳ නීතිරීති සහ එවැනි භාවිතයක් සඳහා වෙනම බලපත්‍රයක් අත්සන් කිරීමට ඔබට අවශ්‍ය නම් ඒ සම්බන්ධව සාකච්ඡා කරන්න.
මහා බ්‍රිතාන්‍යයේ ලියාපදිංචි කරන ලද නිශ්චිත සන්නාමයක් හෝ සැලසුමක් ඔබ විසින් භාවිත කිරීම අවශ්‍ය යැයි ඔබේ ආනයනකරු හෝ බෙදාහරින්නා කියා සිටියහොත්, අවම වශයෙන් විකුණුම් ගිවිසුම බලපැවැත්වෙන කාලසීමාව දක්වා හෝ ආවරණය කෙරෙන බලපත්‍රයක් හෝ බලය ලබාදීමක් ඔවුන් විසින් ඔබ වෙත නිකුත් කරනු ලබන බවට සහතික වන්න.
බලය ලබාදීමක් නොමැති වුවහොත් සිදුවන්නේ කුමක්ද? IPR උල්ලංඝනය පිළිබඳ වැඩි විස්තර සඳහා පහත උප-වගන්තිය බලන්න.

## බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ඔබ විසින් කඩ කළහොත් සිදුවන්නේ කුමක්ද?

IPR උල්ලංඝනය කිරීමක් යනු, කිසියම් පුද්ගලයකු හෝ ව්‍යවසායයක් විසින් පූර්ව අවසරයකින් තොරව, දැනටමත් ආරක්ෂිත IPR භාවිතයකි. උදාහරණ වශයෙන්, ඔබ සමින් කළ අත්බෑග නිපදවා, , 'Hyde & Hare' යන සන්නාමය යටතේ ශ්‍රී ලංකාව තුළ ඒවා විකුණනු ලබයි. කෙසේ වෙතත්, 'Hyde & Hare' යනු මහා බ්‍රිතාන්‍යයේ අත්බෑග නිපදවනු ලබන සුප්‍රසිද්ධ සමාගමකි. එනම්, ඔබ විසින් නිපදවනු ලබන එකී අයිතම මහා බ්‍රිතාන්‍ය වෙත අපනයනය කිරීමට ඔබ අදහස් කරන්නේ නම්, බලපත්‍රයක හෝ බලය ලබාදීමක ආකාරයෙන් ඔබ විසින් 'Hyde & Hare' සන්නාමය භාවිත කිරීම සඳහා පූර්ව අවසරයක් ලබාගත යුතු වේ. එවැනි අවස-රයකින් තොරව ඔබ විසින් එම අත්බෑග මහා බ්‍රිතාන්‍ය වෙත අපනයනය කරන්නේ නම්, බ්‍රිතාන්‍යයේ අත්බෑග නිපදවන සමාගමක් වන 'Hyde & Hare' විසින් එම සන්නාමය භාවිත කිරීමේ පරම ආරක්ෂිත අයිතිවාසිකම් ඔබ විසින් උල්ලංඝනයි කරනු ලබයි.

IPR උල්ලංඝනය කිරීම යනු බරපතල වරදකි. ව්‍යාජ හා ප්‍රතිනිපදවන ලද භාණ්ඩ රට තුළට පැමිණීම සීමා කිරීම උදෙසා රටට ඇතුළු වන වරායෙහි රේගු බලධාරීන් විසින් ඒ සම්බන්ධයෙන් දැඩි පියවර ගනු ලබයි. මහා බ්‍රිතාන්‍යයේ ලියාපදිංචි කළ IPRs (වෙළෙඳ ලකුණු සහ කාර්මික සැලසුම් ද ඇතුළුව) කිසිවක් ඔබගේ නිපැයුම් මගින් උල්ලංඝනය කර ඇති බවට රේගු බලධාරීන් විසින් සොයා ගැනුනහොත් හෝ සැල කරනු ලැබුවහොත් හෝ ඔබේ නිපැයුම් එතැනින් නතර කිරීමට, රඳවා තබා ගැනීමට හෝ විනාශ කර දැමීමට පවා ඔවුන්ට අයිතියක් පවතියි. 'භාණ්ඩ හිමිකරු' හෝ ආනයනක-රු වෙත ඒ බව වහා දැනුම් දෙනු ඇත. උල්ලංඝනය කිරීමක් සිදු වූ බවට හෝ නිපැයුම විනාශ කිරීමට ගිවිසුමක් පවතින බවට හෝ IPR හිමිකරු විසින් රේගු බලධාරීන් වෙත ලිඛිතව දැනුම් දීමට අපොහොසත් වුවහොත්, අනෙකුත් සියලුම විධිමත් රේගු කටයුතු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, රේගු බලධාරීන් විසින් එම නිපැයුම වෙළෙඳපොළට මුදා හරිනු ඇත.






# නිපැයුමෙහි තිරසර භාවය

පරිසර පනත, 2021 මගින් දක්වන්නේ, 'වනාන්තර-අවදානම සහිත පාරිභෝගික භාණ්ඩ' (('forest-risk commodities' - FRCs) හෝ එවැනි FRCs භාවිත කර සිදු කරන ලද නිපැයුම්, වන විනාශයට දායක වන බැවින්, ඒවා වාණිජ කටයුතු සඳහා යොදා ගත නොහැකි බවයි. 10 වන කොටුව වෙතින් FRCs පිළිබඳ වැඩි විස්තර බලන්න.

පවුම් මිලියන 50ක ට වැඩි ගෝලීය පිරිවැටුමක් ලබන බ්‍රිතාන්‍ය ගැනුම්කරුවන් වෙත සපයන නිපැයුම්කරුවන් විසින් FRC යෝජනාක්‍රමයට අනුකූලව කටයුතු කළ යුතු වේ. ටොන් 500ක වාර්ෂික පරිමාව ඉක්මවා නොයන සහ 10 වන කොටුවෙහි නිශ්චිතව දක්වා ඇති [illegible] භාවිත කරන නිපැයුම්කරුවන් විසින් බදු නිදහස් කිරීමක් සඳහා ඉල්ලීම් කළ හැකිය.

යම් නිපැයුමක් FRC වේ නම් හෝ FRC භාවිතයකින් සාදන ලද්දක් නම්, සහ ඉහත සඳහන් නිර්ණායකයන් සපුරාලයි නම්, සිදුවන්නේ කුමක් ද?

භාණ්ඩය හඳුනාගැනීමට සහ ඒ පිළිබඳ තොරතුරු ලබාගැන-මට, ආනයනකරු විසින් නිසි උද්යෝගී ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීමත්, භාණ්ඩ-ආශ්‍රිත සියලුම දේශීය නීති සපුරා නොමැති වීමේ අවදානම සහ අවදානම අවම කරගන්නා අයුරු යන කාරණා දෙක මැන බැලීමත් කළ යුතු වේ. දේශීය නීති සහ හිමිකාරිත්වය, භාණ්ඩ-ආශ්‍රිත දේශීය නීති වලට උදාහරණ වේ. නිපැයුම්කරුවන් සම්බන්ධයෙන් මෙයින් අදහස් වන්නේ, සිය නිපැයුම මගින් දේශීය නීති අවශ්‍යතා සපුරාලන බව සහ සිය නිපැයුමෙන් වන විනාශයට ඇති අවදානම ඉතාමත් අවම බව ඔවුන් විසින් ඔප්පු කළ යුතු බවයි. ඉදිරි FRC යෝජනාක්‍රමය මගින්, වඩා දිගු කාලයක් වාර්තා තබා ගැනීම නිපැයුම්කරුවන් වෙතින් අවශ්‍ය කෙරෙනු ඇත.

### 10 වන කොටුව: වනාන්තර-අවදානම සහිත පාරිභෝගික භාණ්ඩයක් යනු කුමක්ද?

FRC යනු:

- ශාබයකින්, සත්වයකුගෙන් හෝ ජීවියෙකුගෙන් නිපදවන ලද පාරිභෝගික භාණ්ඩයක්; සහ
- එකී පාරිභෝගික භාණ්ඩය නිපදවීම උදෙසා කෘෂිකාර්මික ඉඩමක් බවට පත්කිරීමට වනාන්තරය කපා-හෙලා, වෙනස්කම් ඇති කිරීම.

පහත දැක්වෙන නිපැයුම්, FRCs වශයෙන් වර්ගීකරණය කෙරෙන FRCs යෝජනාක්‍රමයක් මහා බ්‍රිතාන්‍ය විසින් හඳුන්වා දෙනු ඇත.

- ගවයින් ආශ්‍රිත කිරි-නොවන නිෂ්පාදන (හරක්මස් සහ සම් භාණ්ඩ);
- කොකෝවා;
- සෝයි;
- පාම් තෙල්.

මෙය දර්ශකයක් වශයෙන් යොදා ගත් ලැයිස්තුවක් බව කරුණාවෙන් සලකන්න. FRC පාරිභෝගික භාණ්ඩ වල අවසන් ලැයිස්තුව අනාවරණය කරනු ලබන්නේ FRC රෙගුලාසි ක්‍රියාවට නැංවීමෙන් පසුව පමණි.

### 11 වන කොටුව: තිරසර අනාගතයක් උදෙසා නිපැයුම්කරුවන් හට සූදානම් විය හැක්කේ කෙසේද?

- අමු-ද්‍රව්‍ය වල ප්‍රභවයන් සහ ඒවා වඩාත් වනාන්තර-හිතකාමී කරන්නේ කෙසේද යන වග පිළිබඳව ඔබේ සැපයුම්කරුවන් සමග කථා කරන්න.
- එක් එක් සැපයුම්කරු වෙතින් සිදු කළ මිලදී ගැනීම් වැනි වැදගත් තොරතුරු සහ ව්‍යාපාර නාමය, හිමිකරුගේ නම, තැපැල් ලිපිනය, වෙළෙඳ ලකුණ, ඊමේල් ලිපිනය සහ වෙබ් ලිපිනය වැනි තොරතුරු සම්බන්ධයෙන් වාර්තා පවත්වා ගන්න.
- 2024 අග භාගයේ දී හෝ 2025 දී හඳුන්වා දීමට නියමිතව තිබෙන FRC යෝජනාක්‍රමයට සම්බන්ධ සියලු පුවත් සම්බන්ධයෙන් ඔබ කලින් කලට යාවත්කාලීන වී සිටින්න.
- ඉවත ලන ද්‍රව්‍ය හෝ සම්පූර්ණයෙන්ම පරිසර-හිතකාමී ද්‍රව්‍ය ආදිය භාවිතයෙන් කරන නව නිපැයුම් වල යෙදෙන්න. මෙය, ඔබේ නිපැයුම විකිණීමට සහය වන අතිවිශිෂ්ට කරුණක් වනු ඇත. ඒ හරහා ඔබට සුවිශේෂී වෙළෙඳපොළක් ග්‍රහණය කරගැනීමට හැකි වනු ඇත.

# නිපැයුම ඇසුරුම්කරණය

ඇසුරුම්කරණය යනු, ඔබේ නිපැයුම දැවටීම, ඒවා ආරක්ෂා කිරීම සහ එමගින් ගුණාත්මක භාවය ඉහළින්ම පවත්වාගෙන යාමට හැකිවීම සඳහා භාවිත කරන යම් යම් ද්‍රව්‍ය වේ. ඇසුරුම්කරණය (අත්‍යවශ්‍ය අවශ්‍යතා) නියාමන, 2015 අනුව, විකුණුම් ඇසුරුම්කරණය, සමූහනය කළ ඇසුරුම්කරණය සහ ප්‍රවාහනය සඳහා ඇසුරුම්කරණය ද ඇසුරුම්කරණයට ඇතුළත් වේ. නීතිය මගින් ආවරණය කෙරෙන, විවිධ ඇසුරුම් තට්ටු (layers) පිළිබඳව නිපැයුම්කරුවන් හට අවබෝධයක් ලබාගත හැකි අයුරු, 12 වන කොටුවෙහි අඩංගු වේ.

තනි ඒකකයක් තුළ එක් එක් කොටස් ඇසුරුම්කරණය ද ඇතුළුව නිපැයුම් ඇසුරුම්කරණය ඇමුණුම II මගින් සවිස්තරාත්මකව දක්වා ඇති අත්‍යවශ්‍ය අවශ්‍යතා සපුරන බවට සහතික වන්න. ඇසුරුම්කරණයේ දී පමණ ඉක්මවා එය නොකිරීමට වග බලාගන්න. අවශ්‍ය අවම ප්‍රමාණයට ඇසුරුම්කරණය සීමා කරගෙන, පාරිභෝගිකයන් නිපැයුම පිළිගනු ලබන බව සහ එහි සෞඛ්‍යාරක්ෂිත බව සහ ආරක්ෂිත භාවය පවතින බවට සහතික වන්න.

ඉහත ආකාරයෙන් කළ ඇසුරුම් බ්‍රිතාන්‍ය වෙළෙඳපොළට එක් කළ දින සිට වසර හතරක කාලයක් දක්වා අත්‍යවශ්‍ය අවශ්‍යතා සපුරාලන බව සනාථ කෙරෙන තාක්ෂණික තොරතුරු පිළිබඳ වාර්තා පවත්වාගෙන යාමට නිපැයුම්කරුවන් සහ අපනයනකරුවන් වග බලා ගත යුතු වේ. අත්‍යවශ්‍ය අවශ්‍යතා වලට අනුකූල වීමට හෝ වාර්තා පවත්වාගෙන යාමට අපොහොසත් වීමෙහි ප්‍රතිවිපාක ඇමුණුම II හි විස්තර කර ඇත. අනුකූලතාව සහතික කිරීම පිළිබඳ ප්‍රයෝජනවත් ඉඟි සඳහා මෙම මගපෙන්වුම බලන්න.

## 12 වන කොටුව: නිපැයුම් ඇසුරුම්කරණය පිළිබඳ උදාහරණ

### ඇසුරුම්කරණයේ නොයෙක් තට්ටු අවබෝධ කරගැනීම

මැන්චෙස්ටර්-කේන්ද්‍ර කරගත් ගැනුම්කරුවකු හට සායවල් 500ක් සපයන ලෙසට ශ්‍රී ලාංකික නිපැයුම්කරුවකු වෙත ඇණවුමක් ලැබී ඇත. සායවල් මසා නිම කර ඇසුරුම්කරණයට සූදානම් වූ විට, නිපැයුම්කරු තට්ටු තුනකින් යුතු ඇසුරුම් යොදා ගනියි:

- **මූලික ඇසුරුම**: පාරිභෝගිකයකු විසින් මිලදී ගනු ඇති තනි ඒකකයක් වශයෙන් සායක් අඩංගු කර ආරක්ෂා කිරීම සඳහා භාවිත කරන ඇසුරුම.
- **දෙවන ඇසුරුම**: ඒකක කිහිපයක් වශයෙන් සායවල් මිටි බැඳීමට භාවිත කරන ඇසුරුම, එක් සායවල් මිටියකට 10ක් හෝ 20ක් වශයෙන්. මිලදී ගන්නා පාරිභෝගිකයා වෙත සායවල් මිටියක් සෘජුවම විකිණිය හැකි අතර, නොඑසේ නම්, තොගයට නැවත එක් කිරීමට පමණක් යොදා ගත හැකිය.
- **තෘතීයික ඇසුරුම**: සායවල් 500 ම හැසිරවීමේ දී සහ ප්‍රවාහනයේ දී ආරක්ෂා කිරීම සඳහා භාවිත කරන ඇසුරුම. සූදානම් කරගත් වැඩ පිළිවෙළෙ අනුව, අපනයනකරුවන් විසින් ද තෘතීයික ඇසුරුම ලබාදිය හැකිය. ගෝනි සහ පෙට්ටි තෘතීයික ඇසුරුම්කරණයේ උදාහරණ වලට අයත් වේ. කෙසේ වෙතත්, ඊට මාර්ග, නැව් හෝ ගුවන් බහලුම් අයත් නොවන බව සලකන්න.



# නිපැයුමෙහි ලේබල

නිපැයුමක ලේබල මගින් නිපැයුමෙහි සංයුතිය, මිල, ඒකක ගණන, එහි ප්‍රමාණය (size ), ප්‍රයෝජනය සහ ප්‍රභවස්ථානය පිළිබඳව පාරිභෝගිකයා දැනුවත් කරයි. සවිස්තරාත්මක සහ නිවැරදි ලේබල, පාරිභෝගිකයන්ට මිලදී ගැනීමේ තීරණයට වහා එළඹීමේ හැකියාව ලබාදෙන අතර, එමගින් සන්නාමයේ අගය ද ඉහළ නැංවේ. ලේබල්කරණ කොන්දේසි ඒ ඒ නිපැයුමට අනුව නිශ්චිත වේ. රෙදිපිළි සහ පාවහන් ලේබල්කරණ අවශ්‍යතා පිළිබඳ දළ විශ්ලේෂණයක් සඳහා ඇමුණුම II බලන්න.

### කඩිනම් ඉඟියක්

නිසි ඇසුරුම්කරණය, ආනයන වෙළෙඳපොළෙහි විකිණුම් ඉහළ නැංවීමට උපකාරී විය හැකිය. නිසි ඇසුරුම්කරණයේ දී භාවිත කිරීමේ හැකියාව, එහි ක්‍රියාකාරිත්වය, සන්නාම අගය හා පෙළගැස්වෙන අයුරු, ගුණාත්මක භාවය, කලාත්මක පෙනුම සහ ආනයන වෙළෙඳපොළෙහි පවතින වත්මන් ඇසුරුම්කරණ රටාවන් සැලකිල්ලට ගැනෙයි. බ්‍රිතාන්‍ය පාරිභෝගිකයන් රුචිකත්වය දක්වන්නේ තිරසර භාවයෙන් යුතු, පරිසර-හිතකාමී, නව්‍ය, නම්‍යශීලී සහ පුද්ගලාරෝපිත ඇසුරුම්කරණයටයි. බ්‍රිතාන්‍ය ඇසුරුම්කරණ වෙළෙඳපොළ රටාවන් සහ පුරෝකථනයන් පිළිබඳව නිපැයුම්කරුවන් දැනුවත්ව සිටිය යුතු වේ. එවැනි එක් වාර්තාවක් වෙත මෙතැනින් පිවිසිය හැකිය.




© Freepik.com

# 03 තිරසර භාවය පිළිබඳ ප්‍රමිතීන්

2 වන පරිච්ඡේදයෙන් සාකච්ඡා කරන ලද නීතිමය අවශ්‍යතාවන්ට අමතරව, නිපැයුම්කාර-අපනයනකරුවන් විසින් යම් යම් අමතර අවශ්‍යතාවන් සපුරාලීම ගැනුම්කරුවන් සහ පාරිභෝගිකයන් විසින් අවශ්‍ය කෙරෙනු හැකි වේ. නිපැයුම්කරුවන් විසින් සිය සැපයුම් දාමය පුරාවටම පරිසර-හිතකාමී ලෙස නිපදවන ලද බව සහ මනා ශ්‍රමික පිළිවෙත් අනුගමනය කර ඇති බව පෙන්වීම ද එකී අමතර අවශ්‍යතා වලට අයත් විය හැකිය. ස්වෙච්ඡා තිරසර ප්‍රමිති සහතික (voluntary sustainability standard - VSS) ලබාගැනීම සහ/හෝ ගැනුම්කරුගේ සමාගම් සංග්‍රහයේ දක්වා ඇති නිශ්චිත අවශ්‍යතා සපුරාලීම මගින් අවසන් නිපැයුමෙන් එය පිළිබිඹු කළ හැකිය.

## ස්වෙච්ඡා තිරසර භාවය පිළිබඳ ප්‍රමිතීන්

නිපැයුම්කරුවන් හට සිය නිපැයුමෙහි අදාළ ලේබලය හෝ මුද්‍රාව තබමින් සහ ස්වෙච්ඡාවෙන් සහතික කිරීම මගින් VSSs හා අනුකූල වීමට කටයුතු කළ හැකියි. එසේ කිරීමෙන්, නිපැයුම්කරු-වන් හට සිය තරගකාරිත්වයේ වාසිය රඳවා ගනිමින් වඩාත් පුළුල් පාරිභෝගික සමුදායක් ග්‍රහණය කර ගැනීමට ඉඩ සැලසේ.

### 13 වන කොටුව: තිරසර භාවය පිළිබඳ ප්‍රමිතීන් යනු මොනවාද?

තිරසර භාවය පිළිබඳ ප්‍රමිතීන් මගින්, පාරිසරික කාර්යසාධනය, සදාචාරාත්මක කාර්යසාධනය, සහ කළමනාකාරිත්ව හා මෙහෙයුම් කාර්යසාධනය වැනි තිරසර භාවය පිළිබඳ නොයෙ-ක් දර්ශකයන් සම්බන්ධයෙන් නිසි කටයුතු සිදු කරනු ලබයි. නොයෙක් දර්ශකයන් සම්බන්ධයෙන් වැඩි විස්තර ITC ප්‍රමිතීන් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු වෙතින් දැනගන්න.



ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූලධර්ම සහ වැඩෙහි යෙදවීම් නීතිරීති, සහ ශ්‍රී ලංකාවේ මධ්‍යම පරිසර අධිකාරිය මගින් දක්වා ඇති අදාළ නීතිරීති, රෙගුලාසි සහ පාරිසරික ගුණාත්මක භාවය පිළිබඳ ප්‍රමිතීන් වැනි සියලුම අවශ්‍යතා සැපයුම් දාමයේ සෑම අදියරයක දී ම සපුරාලන බවට නිපැයුම්කරුවන් සහතික විය යුතු ය. ස්වෙච්ඡා තිරසර භාවය පිළිබඳ සහතික කිරීමේ ක්‍රියාවලිය (VSS) පිළිබඳ නිශ්චිත තොරතුරු සහ මෙම අත්පොත මගින් ආවරණය කර ඇති නිපැයුම් සම්බන්ධයෙන් ජාත්‍යන්තර පිළිගැනීම සහිත VSS සහතික කිරීම් පිළිබඳ උදාහරණ, ඇමුණුම III හි සපයා ඇත.

## සමාගම් සංග්‍රහය

නිපැයුමෙහි ඇති ඇසට නොපෙනෙන විශේෂාංග සහ නිපැයුම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් මගපෙන්වුම් හෝ චර්යාධර්ම සංග්‍රහයක ආකාරයෙන් ඔවුන්ටම ආවේණික සමාගම් සංග්‍රහයක් ඇතැම් සමාගම් විසින් හඳුන්වා දිය හැකිය. සිරිතක් වශයෙන්, විකිණුම් ගිවිසුම ගැන සාකච්ඡා කරන අවස්ථාවේ දී ගැනුම්කරුවන් සාමාන්‍යයෙන් තම සමාගමෙහි චර්යාධර්ම සංග්‍රහය හෝ මගපෙන්වුම් වේ නම්, නිපැයුම්කාර-අපනයනකරුවන් ඒවාට අනුකූලව කටයුතු කිරීමේ අවශ්‍යතාව ඉස්මතු කර දක්වයි.

### 14 වන කොටුව: තිරසර භාවය පිළිබඳ සැපයුම්කාර සම්පත්

අදාළ අමුද්‍රව්‍ය (කපු, දැව සහ සම් වැනි) සම්බන්ධයෙන් ඔබේ රටේ තිරසර සහතික කිරීම් දරන සැපයුම්කරු පිරික්සීමට ITC තිරසර ක්‍රමවේදය භාවිත කරන්න.

තිරසර භාවය පිළිබඳ ප්‍රමිතීන් සහ සහතික කිරීම් ගැන වැඩි විස්තර දැනගැනීමට, ITC SME වෙළෙඳ ඇකඩමිය වෙතින් ලබාගත හැකි විවිධාකාර පාඨමාලාවන් පරීක්ෂා කර බලන්න.


### කඩිනම් ඉඟියක්

**ගැනුම්කරුගේ අපේක්ෂාවන් වටහා ගැනීම**

විකිණුම් ගිවිසුම සාකච්ඡා කරන අවස්ථාවේ දී, ස්වෙච්ඡා තිරසර භාවය පිළිබඳ (VSS) සහතික කිරීම් ලබාගැනීම සහ සමාගම් චර්යාධර්ම සංග්‍රහයට අනුකූල වීම ආදිය සම්බන්ධයෙන් ගැනුම්කරුගේ අපේක්ෂාවන් පිළිබඳව සාකච්ඡා කිරීමට මතක තබාගන්න. සාකච්ඡා කළ කරුණු සහ එකඟ වූ කරුණු පැහැදිලිව දැක්වෙන නියමයක් විකිණුම් ගිවිසුමට ඇතුළත් කරන්න.

### කඩිනම් ඉඟියක්

තිරසර භාවය පිළිබඳ සහතික කිරීමක් සඳහා අයදුම් කිරීමට ඔබ තවම සූදානම් නැති නම්, තිරසර බවට දැනටමත් සහතික කෙරුණු ශ්‍රී ලාංකික සැපයුම්කරුවන් හා සම්බන්ධ වී එවැනි සැපයුම්කරුවන් වෙතින් අමුද්‍රව්‍ය ලබාගැනීමට කටයුතු කරන්න. උදාහරණ වශයෙන් ඕෂන් ලංකා, ෆැබ්රික් පීඑල්සී, සවුත් ඒෂියා ටෙක්ස්ටයිල් හෝ කාබනික-සහතිකය ලත් කපු නිපැයුම්කරුවන් වෙතින් ඔබට අවශ්‍ය කපු මිලදී ගන්න.
සහතික කරනු ලබන ඇතැම් සමාගම් සමූහ සහතික කිරීම් වලට අවසර දෙනු ලැබේ. එය සැලකිල්ලට ගනු ලැබිය හැකි, පිරිවැය-කාර්යක්ෂමතාව සහිත විකල්පයකි. ඔබ වෙළෙන්දෙකු හෝ සුළු පරිමාණ විකුණුම්කරුවකු නම්, නිපැයුම් සහතික කිරීම සිදු කරනුයේ ඔබේ සන්නාමය යටතේ පමණක් බැව් සිහි තබාගන්න.




# 04 රේගු සහ ආශ්‍රිත ක්‍රියාපටිපාටි

රේගු ක්‍රියාපටිපාටි සහ අවශ්‍ය අනෙකුත් සියලුම ලේඛන සම්බන්ධයෙන් අපනයනකරුවන් දැනුවත් විය යුතුය. එවිට, මහා බ්‍රිතාන්‍ය වෙත නිපැයුම් සාර්ථකව යැවීමේ හැකියාව සහතික කළ හැකිය. පළපුරුද්ද හා සාමාන්‍ය දැනීමට අනුව, සංවර්ධනය වෙමින් පවතින රටවල වෙළෙඳ යෝජනාක්‍රම (DCTS) සිත් හි තබාගෙන නිවැරදි නිපැයුම් කේතය හඳුනාගත් බවට සහ සිය නිපැයුම් වලට නිවැරදි වටිනාකම ලබාදුන් බවට සියලු අපනයනකරුවන් සහතික විය යුතු වේ. නිපැයුම් කේත, DCTS සහ රේගු ගාස්තු අනුපාතිකයන් පිළිබඳ තොරතුරු 1 වන පරිච්ඡේදය සඳහා බලන්න.

## රේගු ලියාපදිංචිය

පළමු පියවර වන්නේ, ASYCUDA ද්වාරය භාවිතයෙන් ශ්‍රී ලංකා රේගුව සමග ලියාපදිංචි වීමයි. ලියාපදිංචි වීමෙන් අනතුරුව, ‘වෙළෙන්දන්’ වශයෙන් රේගු බලධාරීන් සමග ලියාපදිංචි වීමට පරිශීලකයන්ට හැකියාව ඇත.

රේගුව වෙත අපනයන භාණ්ඩ තොගය ගැන ප්‍රකාශ කිරීම, සහ අපනයනය සඳහා අපනයනකරු සූදානම් වූ පසු ඔන්ලයින් මගින් රේගු ප්‍රකාශනය ඉදිරිපත් කිරීමත් සිදු කළ යුතු වේ. ඉදිරිපත් කළ යුතු තොරතුරු/විස්තර සඳහා ඇමුණුම IV බලන්න.

අවශ්‍ය සියලුම තොරතුරු/ලේඛන ඉදිරිපත් නොකළේ නම්, නිපැයුම්කරුවන් හට රේගු නිෂ්කාශනය අහිමි වීමේ අවදානමට ලක් වීමට සිදු වේ.

රේගු නිවාස නියෝජිතයාට හෝ අපනයනකරුට, ප්‍රකාශකයා වීමේ හැකියාව පවතියි. එක් එක් ප්‍රකාශනය සඳහා ශ්‍රීලංරු. 550 (පරිගණක ගාස්තු - ශ්‍රීලංරු. 250ක් සහ පරීක්ෂා කිරීමේ ගාස්තු - ශ්‍රීලංරු. 300ක්) ගෙවිය යුතු වේ. ඉන් අනතුරුව, පහත සඳහන් කාර්යාල වලින් එකකදී අපනයන රේගු ප්‍රකාශන පිළිබඳ අවශ්‍ය සැකසුම් කටයුතු සිදු කළ හැකි වේ.

- ශ්‍රී ලංකා රේගු මූලස්ථානයෙහි අපනයන කාර්යාලයේ දී - විශේෂයෙන්, බහලුමකට සෑහෙන ප්‍රමාණයට වඩා අඩු තොගයක් සඳහා සහ ගුවන් මගින් යවනු ලබන තොගයක් සඳහා.
- අපනයන පහසුකරණ මධ්‍යස්ථානය - සම්පූර්ණ බහලුමකට සෑහෙන තොගයක් (සහ අවශ්‍ය විටෙක බහලුමකට සෑහෙන ප්‍රමාණයට වඩා අඩු තොගයක්) සඳහා.
- භාණ්ඩ තොග ගුවනින් අපනයනය කිරීමේ කාර්යාලය - ගුවන් මගින් යවනු ලබන නරක්වනසුලු භාණ්ඩ ඇතුළු සියලුම භාණ්ඩ තොග සඳහා.

රේගු ප්‍රකාශනය ලියාපදිංචි කළ දින සිට දින 30ක් ඇතුළත අපනයනය කිරීම සිදු කළ යුතු බව සැලකිල්ලට ගැනීම වැදගත් වේ.

# මූල්‍ය සාධනපත්‍ර

ASYCUDA පද්ධතියෙහි ලියාපදිංචි වීමෙන් අනතුරුව, ඔබේ බැංකු ගිණුම, ලියාපදිංචි ඊමේල් ලිපිනය සහ ජංගම දුරකථන අංකය ඉදිරිපත් කරමින් බැංකුව පිළිබඳ ඔබේ විස්තරය සබැඳි කිරීමට කටයුතු කරන්න. ටෙලෙක්ස් පැවරුම්, ණයවර ලිපි, ගෙවීම් පිළිබඳ වැඩපිළිවෙළෙට අදාළ ලේඛන සහ පිළිගැනීම පිළිබඳ වැඩපිළිවෙළෙට අදාළ ලේඛන වැනි මූල්‍ය සාධනපත්‍ර සම්බන්ධයෙන් ASYCUDA පද්ධතිය, ප්‍රධාන වාණිජ බැංකු සමග සබැඳි කර ඇත.




# රේගු නිෂ්කාශනය

වෙළෙඳ භාණ්ඩය සහ අනෙකුත් අවදානම් කළමනාකරණ නිර්ණායකයන් මත පදනම්ව, 'තීරු බදු නිදහස් කරන ලදී', 'මඩුල්ල විසින් පරීක්ෂා කිරීම සඳහා' හෝ 'පරීක්ෂා කිරීම සඳහා වන භාණ්ඩ' යන කාණ්ඩ තුනෙන් එකක් යටතේ එකී භාණ්ඩ තෝරා ගැනීම සිදු වනු ඇත. 'මඩුල්ල විසින් පරීක්ෂා කිරීම සඳහා' සහ 'පරීක්ෂා කිරීම සඳහා වන භාණ්ඩ' යන කාණ්ඩ යටතේ තෝරාගත් භාණ්ඩ තොග, පරීක්ෂා කිරීමට විෂය වන අතර, 'තීරු බදු නිදහස් කරන ලදී' යන කාණ්ඩය යටතට ගැනෙන භාණ්ඩ තොග පරීක්ෂාවකින් තොරව අපනයනය සඳහා නිදහස් කරනු ලැබේ. ASYCUDA ප්‍රකාශනය සත්‍යාපනය කිරීමෙන් සහ සම්පූර්ණ කර ඇති බව තහවුරු කරගැනීමෙන් අනතුරුව, අපනයනකරුවන් විසින් පර්යන්ත ගාස්තු ගෙවා, රේගු නිෂ්කාශනය ලබාගත යුතු වේ. ශ්‍රී ලංකාවේ රේගු නිෂ්කාශන ක්‍රියාවලිය පිළිබඳ වැඩි විස්තර දැනගැනීමට මෙතැන බලන්න.

ඉන් පසුව, භාණ්ඩ තොගය නිදහස් කර නැවකට හෝ යාත්‍රාවකට පැටවීම සිදු කරනු ලබයි. සෘජු අපනයන සම්බන්ධයෙන් ආර්ථික මෙහෙයුම්කරුවන්ගේ ලියාපදිංචි කිරීමේ සහ අනන්‍යතාව (Economic Operators Registration and Identification - EORI) පිළිබඳ අංකය අවශ්‍ය විය හැකිය. ලියාපදිංචිය අවශ්‍ය ද යන වග තීරණය කිරීම පිණිස කුඩා පරිමාණ නිපැයුම්කරුවන් විසින් සිය අපනයන හවුල්කරුවන් සමග සාකච්ඡා කළ යුතුය. EORI අංකය පිළිබඳ වැඩි විස්තර සඳහා ඇමුණුම IV බලන්න.

# රේගු බන්ධිත ගබඩා

සැපයුම් කාර්යයන් උදෙසා, සෘජුව හෝ යුරෝපීය සංගමය හරහා වැනි නොයෙක් නැව්ගත මාර්ග ඔස්සේ භාණ්ඩ වලට බ්‍රිතාන්‍ය දේශසීමාව වෙත ළඟා විය හැකිය. භාණ්ඩ, බ්‍රිතාන්‍ය දේශසීමාව වෙත ළඟා වීමෙන් අනතුරුව, එම භාණ්ඩ සාමාන්‍යයෙන් ගබඩා කර තබනුයේ රේගු බන්ධිත ගබඩා වල ය. භාරගත යුතු භාණ්ඩ (consigned goods) වල ප්‍රවාහය, ඒවා ප්‍රති-පිළියෙළ කිරීම සහ අදාළ රේගු බදු සහ වෙනත් බදු ගෙවීම් ප්‍රමාද කිරීම ආදිය පාලනය කිරීමේ හැකියාව ආනයනකරුවන්ට හැකිය. මහා බ්‍රිතාන්‍යයේ රේගු බන්ධිත ගබා පිළිබඳ වැඩි විස්තර සඳහා මෙතැන බලන්න.

මහා බ්‍රිතාන්‍ය වෙත භාණ්ඩ නැව්ගත කරනු ලැබුවේ යුරෝපා සංගමය හරහා නම්, ඒවා රේගු බන්ධිත ගබඩා වල ගබඩා කෙරෙනු ඇත. එබැවින්, එම භාණ්ඩ සම්බන්ධයෙන් ආර්ථික මෙහෙයුම්කරුවන් විසින් ආනයන බදු කිසිවක් ගෙවිය යුතු නොවේ. සුරාබදු බදු වලට යටත් වන (එකී තිරු ගෙවා ඇත්නම් මිස) භාණ්ඩ සහ සීමාවන්ට හෝ සනීපාරක්ෂක අවශ්‍යතාවන්ට විෂය වන භාණ්ඩ සම්බන්ධයෙන් අවශ්‍ය අනෙකුත් සිය¨ ම ලේඛන ඉදිරිපත් කර ඇති නම් මිස, එසේ ගබඩා කළ නොහැකි බව සලකන්න.

**කඩිනම් ඉඟියක්**

## රේගු බන්ධිත ගබඩා

- රේගු බන්ධිත ගබඩා යොදා ගනු ලබන්නේ, ප්‍රවාහනයෙන් පසු නැවත සැකසුම් කළ යුතු, පරපෝෂිතයන් සඳහා පිළියම් යෙදිය යුතු, සහ හානි වූ හෝ අපවිත්‍ර වූ කොටස් ඉවත් කරන ලද භාණ්ඩ වැනි සුළු හැසිරවීමේ අවශ්‍යතාවන් සහිත භාණ්ඩ ගබඩා කිරීමට පමණි සැකසීම් හෝ පරිණාමනය කිරීම් කළ යුතු භාණ්ඩ ගබඩා කිරීමට එම ගබඩා යොදා ගත නොහැකිය.

- ගබඩා කර තබන භාණ්ඩ වලින් මානව සෞඛ්‍යයට හෝ පරිසරයට හෝ තර්ජනයක් එල්ල නොවේ නම්, රේගු බන්ධිත ගබඩාවන් හි භාණ්ඩ ගබඩා කර තැබීම සම්බන්ධයෙන් කාල සීමාවන් නොමැත. ඔබගේ භාණ්ඩ බ්‍රිතාන්‍ය වෙළෙඳපොළට ඇතුළුවීම සම්බන්ධයෙන් හා ඔබට ගෙවීම් ලැබෙන විට එහි බලපෑමක් තිබිය හැකිය. ඔබේ ගැනුම්කරු සමග ඒ ගැන සාකච්ඡා කරන්න.

- අමතර ආනයන බදු අයකිරීම් (anti-dumping), ප්‍රතිතෝලන තීරු බදු (countervailing), හෝ සුරැකිතා පියවර (safeguard measures) මග හැරීම පිණිස යුරෝපා සංගමය හරහා වංචනික ලෙස භාණ්ඩ නැව්ගත කරන ලද අවස්ථා බොහෝ ඇත. තෝරාගත් නැව්ගත කිරීමේ මාර්ගය පිළිබඳ අව්‍යාජ බව සහතික කිරීමේ එක් ක්‍රමයක් වන්නේ, එවැනි රේගු බන්ධිත ගබඩාවල භාණ්ඩ ගබඩා කරන විට සැකසුම් හෝ පරිණාමයන කිරීම් සිදු කිරීමේ අවශ්‍යතාව මග හැරීමයි.




# 05 ප්‍රවාහන සහ සැපයුම්

නිවැරදි ප්‍රවාහනය සහ සැපයුම් (සංවිධානය කිරීමේ හා සැලසුම් කිරීමේ කාර්යයන්) යනු අපනයන ක්‍රියාවලියෙහි අත්‍යවශ්‍ය අංගයකි. නිවැරදි ප්‍රවාහන ක්‍රමය, භාණ්ඩ ගෙන යාමට පිළියෙළ කිරීම, අපනයන භාණ්ඩ ගෙන යාම පිළිබඳ රක්ෂණය, නැව්ගත කිරීමට පෙර සිදු කරන පරීක්ෂාව සහ ගමනාන්තය වෙත භාර දීම ආදී කරුණු සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශ්වය විකුණුම් ගිවිසුමක දී ඇති ජාත්‍යන්තර වාණිජ කොන්දේසි (Incoterms) මගින් සපයනු ලබයි. යැවීමට නියමිත භාණ්ඩ තොගය (consignment) ආශ්‍රිත මතභේදයක දී, නිසියාකාර සහ විනිවිද භාවයෙන් යුතුව ප්‍රවාහනය පිළිබඳ ලේඛන පවත්වාගෙන තිබීම වැදගත් වේ.

මුහුදු මගින් ප්‍රවාහනය කිරීම සඳහා වන නෞභාර බිල්පත (bill of lading) සහ ගුවන් මගින් ප්‍රවාහනය කරනු ලබන භාණ්ඩ සඳහා වන අදාළ නීතිමය ලේඛනය (bill of lading) යනු ගුවනින් හෝ මුහුදින් ප්‍රවාහනය කිරීම පිළිබඳ වෙනස දක්වන ප්‍රධාන ලේඛනයයි. ශ්‍රී ලංකාවේ නිතර සිදුවන්නේ මුහුදු මාර්ගයෙන් භාණ්ඩ තොග ප්‍රවාහනය කිරීම බැවින් මෙම අත්පොත සාකච්ඡා කරන්නේ නෞභාර බිල්පත් පිළිබඳව පමණි. එම ප්‍රවාහන මාර්ග දෙකෙන් තෝරා ගනු ලබන ඕනෑම ප්‍රවාහන ක්‍රමයක දී ඊට සහය පිණිස වාණිජ ඉන්වොයිසිය, ඇසුරුම් ලැයිස්තුව, ප්‍රභවස්ථාන ප්‍රකාශනය හෝ පෝරමය A, ඇමුණුම IV හි විස්තර කර ඇති පරිදි) අමුණා ඇති බවට නිපැයුම්කරුවන් විසින් සහතික කරගත යුතු වේ. අවශ්‍ය රක්ෂණාවරණ ලබාගත් බවට ද, එකී රක්ෂණාවරණ සනාථ කිරීමේ ලේඛන අමුණා ඇති බවට ද සහතික වන්න.



## නෞභාර බිල්පත

නෞභාර බිල්පත කෙටියෙන් කියතොත්, නෞභාර බිල්පතක් යනු භාණ්ඩ ගෙන යනු ලබන නෞකාව (පොදුවේ, නැවේ ප්‍රධානියා) විසින් භාණ්ඩ, නැව් භාණ්ඩ තොගය භාර ගනු ලබන්නා සහ ගමනාන්තය හෝ ආයතනය පිළිබඳ විස්තර අඩංගු කර නැව්ගත කරන්නාට/ භාණ්ඩ තොගය යවනු ලබන්නාට / අපනයනකරුට නිකුත් කරනු ලබන ගිවිසුම වේ. එමගින් වැදගත් කාර්යයන් තුනක් ඉටු කෙරෙයි:

- එය, එහි විස්තර කර ඇති භාණ්ඩ පිළිබඳ හිමිකම් ලේඛනයකි;
- එය, නැව්ගත කළ භාණ්ඩ පිළිබඳ ලදුපතකි;
- එය, නැව්ගත කිරීම පිළිබඳ නීතිරීති අඩංගු වූවකි.

**කඩිනම් ඉඟියක්**

**ආනයන/අපනයන භාණ්ඩ ප්‍රවාහනය කරන්නන් යොදා ගැනීම**

කුඩා පරිමාවන් අපනයනය කරනු ලබන කුඩා අපනයනකරුවන් හට ආනයන / අපනයන භාණ්ඩ ප්‍රවාහනය කරන්නන් සහ දේශීය ප්‍රවාහන සමාගම් වෙතින් සේවාවන් ලබාගැනීම මගින් ප්‍රතිලාභ ලැබිය හැකිය.


## රක්ෂණය

1 වන පරිච්ඡේදය හි පැහැදිලි කර ඇති පරිදි, භාණ්ඩ ප්‍රවාහනයේ දී සහ රක්ෂණය වැනි ඒ ආශ්‍රිත පිරිවැය සම්බන්ධයෙන් පැන නැගෙන අවදානම් කළමනාකරණය කිරීම පිළිබඳ වගකිව යුතු පාර්ශ්වය ජාත්‍යන්තර වාණිජ කොන්දේසි මගින් තීරණය කෙරෙයි. නැව්බඩු තොග රක්ෂණය මගින් මාර්ගස්ථ (තැනකින් තැනකට ගෙන යාම) අවස්ථාවේ දී භාණ්ඩ වලට සිදු විය හැකි අලාභ හානි සම්බන්ධයෙන් මූල්‍ය ආරක්ෂණයක් ලබා දෙයි. උදාහරණයක් වශයෙන්, CIF ගිවිසුමක, නැව්බඩු තොග රක්ෂණයක් ලබාගැනීම සහ එහි පිරිවැය දැරීම සම්බන්ධයෙන් වගකිව යුත්තේ විකුණුම්කරු ය. අපනයන භාණ්ඩ ගෙන යාම පිළිබඳ රක්ෂණය පිළිබඳ විස්තර, වාණිජ ඉන්වොයිසියෙහි ඇතුළත් කළ යුතු ය.

**කඩිනම් ඉඟියක්**

සියලුම ජාත්‍යන්තර වාණිජ කොන්දේසි සහ ඒ එක් එක් ජාත්‍යන්තර වාණිජ කොන්දේසියෙහි බලපෑම ඔබ විසින් ඉතා ඕනෑකමින් යුතුව කියවා බලා, අවබෝධ කරගන්නා බවට සහතික වන්න. සම්පූර්ණ අපනයන ගනුදෙනුව සම්බන්ධව ඔබට දරන්නට සිදු වන වගකීම, අවදානම සහ පිරිවැය කෙතරම් ද යන්න එමගින් තීරණය වනු ඇත.

# ඇමුණුම්




01

## ඇමුණුම් i: ශ්‍රී ලාංකික අපනයනකරුවකු වීමට සූදානම් කිරීම

### ජාත්‍යන්තර වාණිජ කොන්දේසි වල සාරාංශය

#### A1 වගුව: ජාත්‍යන්තර වාණිජ කොන්දේසි වල සාරාංශය

| ජාත්‍යන්තර වාණිජ නීතිරීති | ගැනුම්කරුගේ කාර්යභාරය | විකුණුම්කරුගේ කාර්යභාරය |
|---|---|---|
| නැව්ගත කිරීමේ ගනුදෙනුවක දී ගැනුම්කරුගේ සහ විකුණුම්කරුගේ වගකීම් | අපනයනකරුගේ පරිශ්‍රයේ සිට ගමනාන්තය දක්වා සියලු කටයුතු පිළිබඳ වගකිව යුතුයි. | ඔවුන් කළ යුත්තේ ඔවුන්ගේ පරිශ්‍රය වෙතින් ලබාගත හැකි අයුරින් භාණ්ඩ සූදානම් කර තැබීම පමණි. |
| දක්වන ලද ස්ථානයක් වෙත භාණ්ඩ බෙදා හැරීම සඳහා විකුණුම්කරුගේ වගකීම් | අපනයනකරුගේ පරිශ්‍රයේ සිට ප්‍රවාහන මාධ්‍යය දක්වා සියලු කටයුතු පිළිබඳ වගකිව යුතුයි. | ගැනුම්කරු විසින් නම් කරන ලද ප්‍රවාහන මාධ්‍යයට භාණ්ඩ භාර දිය යුතුයි. |
| නිශ්චිත වරායක දී ගැනුම්කරුගේ නෞකාවක් අසලට විකුණුම්කරු විසින් භාණ්ඩ භාර දීම අවශ්‍ය කිරීම | භාණ්ඩ පැටවීම සිදු කරන වරායේ සිට ගමනාන්තය දක්වා සියලු කටයුතු පිළිබඳ වගකිව යුතුයි. | භාණ්ඩ පැටවීම සිදු කරන වරායෙහි නෞකාව අසලට භාණ්ඩ භාර දිය යුතුයි. |
| භාණ්ඩ ප්‍රවාහනය සම්බන්ධයෙන් විකුණුම්කරුගේ වගකීම් සහ අවදානම් අවසන් වන හා මිලදී ගන්නාගේ වගකීම් සහ අවදානම් ආරම්භ වන තැන | භාණ්ඩ පැටවීම සිදු කරන වරායේ සිට ගමනාන්තය දක්වා සිය¨ කටයුතු පිළිබඳ වගකිව යුතුයි. | භාණ්ඩ පැටවීම සිදු කරන වරායෙහි නෞකාව අසලට භාණ්ඩ භාර දිය යුතුයි. |
| පිරිවැය සහ භාණ්ඩ ප්‍රවාහනය | නැව්ගත කිරීමේ වරායේ සිට ගමනාන්තය දක්වා සියලු කටයුතු පිළිබඳ වගකිව යුතුයි. | ප්‍රවාහන මාධ්‍යය මගින් ගමනාන්ත වරාය වෙත භාණ්ඩ යැවීමට කටයුතු සැලසීම සහ ප්‍රවාහන වියදම් ගෙවීම කළ යුතුයි. |
| පිරිවැය, රක්ෂණ සහ භාණ්ඩ ප්‍රවාහන | නැව්ගත කිරීමේ වරායේ සිට ගමනාන්තය දක්වා සියලු කටයුතු පිළිබඳ වගකිව යුතුයි. | ප්‍රවාහන මාධ්‍යය මගින් ගමනාන්ත වරාය වෙත භාණ්ඩ යැවීමට කටයුතු සැලසීම සහ ප්‍රවාහන වියදම් ගෙවීම කර, රක්ෂණය සඳහා කටයුතු පිළියෙළ කළ යුතුයි. |
| පිරිවැය ගෙවන ලද්දේ | ප්‍රවාහන මාධ්‍යයේ සිට ගමනාන්තය දක්වා සියලු කටයුතු පිළිබඳ වගකිව යුතුයි. | ප්‍රවාහන මාධ්‍යය මගින් නම් කළ ගමනාන්තය වෙත භාණ්ඩ යැවීමට කටයුතු සැලසීම සහ ප්‍රවාහන වියදම් ගෙවීම කළ යුතුයි. |
| ප්‍රවාහනකරුට සහ රක්ෂණය ගෙවන ලද්දේ | ප්‍රවාහන මාධ්‍යයේ සිට ගමනාන්තය දක්වා සියලු කටයුතු පිළිබඳ වගකිව යුතුයි. | ප්‍රවාහන මාධ්‍යය මගින් නම් කළ ගමනාන්තය වෙත භාණ්ඩ යැවීමට කටයුතු සැලසීම සහ ප්‍රවාහන වියදම් ගෙවීම කර, රක්ෂණය සඳහා කටයුතු පිළියෙළ කළ යුතුයි. |
| නිශ්චිත ස්ථානයකට/ගමනාන්ත වරායකට භාණ්ඩ භාර දෙන ලදී | භාණ්ඩ බෑම හැරෙන්නට අපනයනකරුගේ පරිශ්‍රයේ සිට ගමනාන්තය දක්වා සියලු කටයුතු පිළිබඳ වගකිව යුතුයි. | ගැනුම්කරුගේ පරිශ්‍රය වෙත හෝ නම් කළ වෙනත් ස්ථානයකට භාණ්ඩ භාර දිය යුතුයි. |
| බෑමකින් තොරව ස්ථානය වෙත භාර දෙන ලදී | භාණ්ඩ බෑම ඇතුළුව, විකුණුම්කරුගේ පරිශ්‍රයේ සිට ගමනාන්තය දක්වා සියලු කටයුතු පිළිබඳ වගකිව යුතුයි. | ගැනුම්කරුගේ පරිශ්‍රය වෙත හෝ නම් කළ වෙනත් ස්ථානයකට භාණ්ඩ භාර දී, ඒවා බෑම කළ යුතුයි. |
| භාර දීමේ බදු ගෙවන ලදී | අවශ්‍ය වන්නේ භාණ්ඩ භාර ගැනීම පමණි. | භාණ්ඩ බෑම සහ රේගු නිෂ්කාශනය ඇතුළුව අපනයනකරුගේ පරිශ්‍රයේ සිට ගමනාන්තය දක්වා සියලු කටයුතු පිළිබඳ වගකිව යුතුයි. |

# නිපැයුම් වර්ගීකරණය: HS කේත

## HS කේත සහ UKCCs පිළිබඳ දළ විශ්ලේෂණය

The HS Code is contained in the International Convention on the Harmonized Commodity Description ප්‍රමිතිගත වෙළෙඳ භාණ්ඩ විස්තරය සහ කේතීකරණ පද්ධතිය පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙහි HS කේත අන්තර්ගත වේ. HS කේතයෙහි අදාළ පරිච්ඡේදය, ශීර්ෂය සහ උප-ශීර්ෂය හි දක්වා ඇති නිපැයුම් විස්තරය මත පදනම්ව, එක් එක් නිපැයුම සඳහා නිපැයුම් කේතයක් හෝ HS කේතයක් ඇත. එය, ඉලක්කම් හයකින් සමන්විත වේ.

කෙසේ වෙතත්, HS කේත වලින් ඔබ්බට පියවරක් තබා, නිපැයුම් වර්ගීකරණ ක්‍රමවේදය පිළිබඳ වැඩිදුර හැඳින්වීමක් සිදු කිරීමේ හැකියාව රටවල් වලට පවතියි. මහා බ්‍රිතාන්‍යයේ, භාණ්ඩ වර්ගීකරණ වගුව, නිපැයුම් වර්ගීකරණය කරනුයේ ඉලක්කම්-10ක මට්ටමිනි. A2 වගුවෙහි පෙන්වා දී ඇති ආකාරයට HS කේතය සහ UKCC අනුව සමින් කළ අත්බෑග සම්බන්ධයෙන් වන නිපැයුම් වර්ගීකරණයෙහි උදාහරණය යොදා ගෙන නිපැයුම් වර්ගීකරණය කරනු ලබන විවිධ මට්ටම් දැක-බලා ගත හැකියි.

### A2 වගුව: HS කේතය සහ UKCC වර්ගීකරණය පිළිබඳ උදාහරණ

| | | | |
|---|---|---|---|
| HS පරිච්ඡේදය | ඉලක්කම් 2 | 42 | සම් භාණ්ඩ; සෑදල සහ ඇඳන ආම්පන්න; චාරිකා භාණ්ඩ, අත්බෑග සහ සමාන මලු, සත්ව අතුණුබහන් (සේද පනුවාගේ අතුණුබහන් හැර). |
| HS මාතෘකාව | ඉලක්කම් 4 | 42 02 | සමින් කළ හෝ සම්-මිශ්‍ර මලු, ප්ලාස්ටික් තහඩු, රෙදිපිළි ද්‍රව්‍ය, සෙලියුලෝස් වලින් සෑදූ වල්කනයිස්ඩ් තන්තු, හෝ කඩදාසි-බෝඩ්, හෝ සම්පූර්ණයෙන්ම හෝ ප්‍රධාන වශයෙන් එවැනි ද්‍රව්‍ය වලින් හෝ කඩදාසි වලින් ආවරණය කළ අත්බෑග, ඉටි-බෑග, මුදල් පසුම්බි, පර්ස්, මෙවලම් බෑග, ක්‍රීඩා බෑග, බෝතල් බහලන බෑග, ආභරණ පෙට්ටි, පවුඩර්-පෙට්ටි, හැඳි-ගෑරප්පු බහාලන මලු සහ ඒ සමාන මලු. |
| HS උප-මාතෘකාව | ඉලක්කම් 6 | 4202 21 | බාහිර මතුපිට සමින් කළ හෝ සම්-මිශ්‍ර: උරහිස් පටි සහිත වුව, හැන්ඩල නොමැති ඒවා ද ඇතුළුව අත්බෑග. |
| UKCC | | | |
| UKCC උප-මාතෘකාව | ඉලක්කම් 10 | 4202.2100.10 | බාහිර මතුපිට සමින් කළ හෝ සම්-මිශ්‍ර: උරහිස් පටි සහිත වුව, හැන්ඩල නොමැති ඒවා ද ඇතුළුව අත්බෑග: අතින් නිම කළ |
| UKCC උප-මාතෘකාව | ඉලක්කම් 10 | 4202.2100.90 | බාහිර මතුපිට සමින් කළ හෝ සම්-මිශ්‍ර: උරහිස් පටි සහිත වුව, හැන්ඩල නොමැති ඒවා ද ඇතුළුව අත්බෑග: වෙනත් |



## නිපැයුම් විස්තරය පිළිබඳ ආකෘතිය

ඔබේ නිපැයුම විස්තර කිරීමට සහ නිවැරදි UKCC පහසුවෙන් හඳුනා ගැනීමට, A3 වගුව මගින් ඉදිරිපත් කර ඇති ආකෘතිය ඔබට යොදා ගත හැකිය.

### A3 වගුව: HS කේත වර්ගීකරණය සඳහා වන නිපැයුම් විස්තරය පිළිබඳ ආකෘතිය

| නිර්ණායක | විස්තරය |
|---|---|
| තනි හෝ බහු-කොටස් සහිත නිපැයුම | බහු-කොටස් සහිත නිපැයුමක් හෝ කට්ටලයක් සඳහා, නිපැයුමෙහි එක් එක් කොටස සඳහා වන භාණ්ඩ කේතය තෝරා-බේරා ගත යුතු වේ. නිපැයුමෙහි සියලු තනි කොටස් ලැයිස්තුගත කරන්න.<br>• උදා: සායක් සහ හැට්ටයක් යනු ඇඳුම් කැබලි දෙකකි. සායක් යනු එක් ඇඳුම් කැබැල්ලකි. |
| කාණ්ඩය | නිපැයුම (නිපැයුම්) එක කාණ්ඩයක් හෝ ඊට වැඩි කාණ්ඩ ගණනක් යටතට වැටෙනවාද? නිපැයුම කාණ්ඩගත කෙරෙනු ඇති සියලුම කාණ්ඩ ලැයිස්තුගත කරන්න.<br>• උදා: ඇඳුම, විසිතුරු භාණ්ඩය, ආහාර ද්‍රව්‍යය, පාවහන් ආදී වශයෙන්. |
| භාවිත කළ අමුද්‍රව්‍ය | නිපැයුම නිෂ්පාදනය කර ඇත්තේ එක් අමුද්‍රව්‍යයක් හෝ ඊට වැඩි අමුද්‍රව්‍ය ගණනාවක් භාවිතයෙන්ද? අවසන් නිපැයුම සෑදීමට භාවිත කළ සියලුම අමුද්‍රව්‍ය ලැයිස්තුගත කරන්න.<br>• උදා, කපු, දැව, හණ, සේද, රබර්, ආදී වශයෙන් |
| අමුද්‍රව්‍ය වල ප්‍රභවය | ඔබ සියලුම අමුද්‍රව්‍ය මිලදී ගනු ලබන්නේ ශ්‍රී ලාංකික සැපයුම්කරුවන් වෙතින් ද නැතිනම් ඇතැම් අමුද්‍රව්‍ය ඔබ විසින් ආනයනය කරනවාද? දේශීය වශයෙන් ලබාගන්නා සහ ආනයනය කරනු ලබන සියලුම ද්‍රව්‍ය ලැයිස්තුගත කරන්න. |
| නිපැයුම් ක්‍රමවේදය | නිපැයුම නිෂ්පාදනය කළේ කෙසේද?<br>• උදා: අතින් නිම කළ, අත්යන්ත්‍රයකින් නිපද වූ, කාර්මිකව නිෂ්පාදනය කළ ආදී වශයෙන් නිපදවන ලද. |
| නිපැයුමේ ප්‍රයෝජනය | නිපැයුමෙහි අපේක්ෂිත භාවිතය හෝ කාරණාව කුමක්ද? එය නිමවන ලද්දේ සුළු-පරිමාණයෙන් විකිණීම සඳහා ද නැති නම් එහි වෙනත් කාරණා තිබේද? ඉගියː අපනයනය කිරීමේ අරමුණ මගින් සාමාන්‍යයෙන් නිපැයුමෙහි අපේක්ෂිත භාවිතය තීරණය කෙරෙයි.<br>• උදා: කපු නූල්, ගෙතු හෝ ක්‍රොශේ ගෙතු ක්‍රියාකාරකම් සඳහා සුළු-පරිමාණ කටයුතු උදෙසා විකිණීම හෝ සිය නිපැයුම් කටයුතු උදෙසා භාවිත කරනු ලබන ආනයනකරුවකු වෙත විකිණීම හෝ කළ හැකිය. |
| අපේක්ෂිත පරිශීලකයා | නිපැයුම නිර්මාණය කළේ කා වෙනුවෙන්ද? එය නිර්මාණය කරන ලද්දේ කිසියම් වයසක හෝ වෘත්තීයක සිටින අය වෙනුවෙන්ද?<br>• උදා: ක්‍රීඩා කටයුතු සඳහා නිර්මාණය කළ පාවහන්, නිර්මාණය කර ඇත්තේ ටෙනිස් හෝ පැසිපන්දු වැනි නිශ්චිත ක්‍රීඩාවක් සඳහා මිස ඇවිදීම සඳහා පමණක් නොවේ. |
| ඇසුරුම් සඳහා යොදා ගන්නා ද්‍රව්‍ය | නිපැයුම ඇසුරුම් කරනු ලබන්නේ දැව පෙට්ටි වල, හණ ගෝනි වල, කාඩ්බෝඩ් පෙට්ටි වල හෝ වෙනත් යම් ආකාරයකින්ද,<br>• උදා: සාය හැට්ට කට්ටලයක් කපු මල්ලක අසුරා, අනතුරුව එය කාඩ්බෝඩ් පෙට්ටියක අසුරනු ලබන්නේද? |

# මෙම අත්පොත මගින් ආවරණය කර ඇති නිපැයුම් සඳහා භාණ්ඩ කේත දක්වන ලැයිස්තුව

මෙම අත්පොත මගින් ආවරණය කර ඇති නිපැයුම් වලට අදාළ විය හැකි UKCCs දක්වන ලැයිස්තුවක් A4 වගුව මගින් ලබා දේ.

## A6 වගුව: මෙම අත්පොත මගින් ආවරණය කර ඇති නිපැයුම් වල UKCCs දක්වන ලැයිස්තුව

| UKCC විස්තරය | |
|---|---|
| **රෙදිපිළි සහ ඇගලුම්** | |
| 6212.1010.00 | ගෙතු හෝ ක්‍රොශේ ගෙතු තනපටයක් සහ යට ඇඳුමකින් යුතු කට්ටලයක්. |
| 6109.9090.00 | T ගෙතු හෝ ක්‍රොශේ ගෙතු, ටී-ෂර්ට්, තනි ඇඳුම් සහ වෙනත් බැනියම්. |
| 6104.6300.00 | ගෙතු හෝ ක්‍රොශේ ගෙතු සින්තටික් නූලෙන් නිම කළ, කාන්තාවන්ගේ හෝ ගැහැනු ළමුන්ගේ ඇඳුම්, කට්ටල, ජැකට්ටු, බ්ලේසර, ගවුම්, සාය, ඩිවයිඩඩ් ස්කර්ට්ස්, කලිසම්, බිබ්සහ බ්රේස් ඕවරෝල්, බ්‍රීච් සහ කොට කලිසම් (පිහිනුම් ඇඳුම් නොවන). |
| 6107.1100.00 | ගෙතු හෝ ක්‍රොශේ ගෙතු කපු වලින් නිම කළ, පිරිමින්ගේ හෝ පිරිමි ළමුන්ගේ යට කලිසම්, යට ඇඳුම්, රාත්‍රී ෂර්ට්, පිජාමා, බාත්රෝබ්, ඩ්‍රෙසිංග් ගවුන්. |
| 6108.2200.00 | ගෙතු හෝ ක්‍රොශේ ගෙතු, කාන්තාවන්ගේ සහ ගැහැනු ළමුන්ගේ යට සාය, පෙටිකෝට්, යට කලිසම්, යට ඇඳුම්, රාත්‍රී ඇඳුම්, පිජාමා, විනිවිද පෙනෙන ඇඳුම්, බාත්රෝබ්, සහ ඩ්‍රෙසිංග් ගවුන්. |
| 6112.4100.00 | ගෙතු හෝ ක්‍රොශේ ගෙතු, ට්‍රැක්සූට්ස්, ස්කී සූට්ස්, පිහිනුම් ඇඳුම්. |
| 6110.3010.00 | ගෙතු හෝ ක්‍රොශේ ගෙතු, ජර්සි, පුල්ඕවර්ස්, කාඩිගන්ස්, වේස්ට්කෝට්. |
| 6209.2000.20 | කපු රෙද්දෙන් කළ ළදරු ඇඳුම් සහ ඇඳුම් වලට අදාළ උපාංග |
| **ගෘහ අලංකරණ** | |
| 6304.9900.92 | නොගෙතු හෝ ක්‍රොශේ නොගෙතු, මේසරෙදි ඇතුළු ගෘහභාණ්ඩ වලට අදාළ දෑ |
| **පාවහන්** | |
| 6404.2010.00 | සමින් සාදන ලද හෝ සම්-මිශ්‍ර කර සාදන ලද පිටත අඩි සහිත පාවහන් |



UKCC සහිත එක් එක් පරිච්ඡේදයෙහි, ඒ ඒ පරිච්ඡේදයට අදාළ සටහන් තිබෙන බව සහ, නිවැරදි නිපැයුම් වර්ගීක-රණය තීරණය කිරීමට පෙර, අපනයනකරු විසින් ඒවා කියවා බැලිය යුතු බව සැලකිල්ලට ගැනීම වැදගත් වේ. උදාහරණයක් වශයෙන් 71 පරිච්ඡේදය සඳහා වන පරිච්ඡේද සටහන් -

'ස්වාභාවික මුතු හෝ රෝපණය කර තැනූ සැබෑ මුතු, මැණික් හෝ අඩු-වටිනාකමක් සහිත සැබෑ ගල්, වටිනා ලෝහ, වටිනා ලෝහ ගැල්වූ ලෝහ, සහ ඒවායින් තනන ලද අයිතම; කෘත්‍රිම ආභරණ; කාසි'- යනාදිය A1රූපය මගින් දී ඇත.

## A1 රූපය: 71 පරිච්ඡේදයේ UKCCs සඳහා වන පරිච්ඡේද සටහන් පිළිබඳ උදාහරණය

**There are important chapter notes for this part of the tariff:**

1. Subject to note 1(A) to Section VI and except as provided below, all articles consisting wholly or partly:

   a. of natural or cultured pearls or of precious or semi-precious stones (natural, synthetic or reconstructed),

   or

   b. of precious metal or of metal clad with precious metal, are to be classified in this chapter.

2. (A) Headings 7113, 7114 and 7115 do not cover articles in which precious metal or metal clad with precious metal is present as minor constituents only, such as minor fittings or minor ornamentation (for example, monograms, ferrules and rims), and paragraph (b) of the foregoing note does not apply to such articles.

   (B) Heading 7116 does not cover articles containing precious metal or metal clad with precious metal (other than as minor constituents).

3. This chapter does not cover:

   a. amalgams of precious metal, or colloidal precious metal (heading 2843);

   b. sterile surgical suture materials, dental fillings or other goods of Chapter 30;

   c. goods of Chapter 32 (for example, lustres);

   d. supported catalysts (heading 3815);

   e. articles of heading 4202 or 4203 referred to in note 3(B) to Chapter 42;

   f. articles of heading 4303 or 4304;

   g. goods of Section XI (textiles and textile articles);

   h. footwear, headgear or other articles of Chapter 64 or 65;

   ij. umbrellas, walking sticks or other articles of Chapter 66;

# එක්සත් රාජධානියේ සංවර්ධනය වෙමින් පවතින රටවල වෙළෙඳ යෝජනාක්‍රම

එක්සත් රාජධානිය විසින් ආදිකල් හි යොදා ගත් පොදු වරණීය යෝජනාක්‍රමය (GSP), වෙනුවට DCTS හඳුන්වා දෙන ලද්දේ 2023 වර්ෂයේ ජූනි මාසයේ දී ය. ශ්‍රී ලංකාව ඇතුළු රටවල් 65ක ට පහසුවෙන් වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වීමේ හැකියාව ලබාදීමට ඍකී මගින් ඉලක්ක කෙරෙයි. මෙම යෝජනාක්‍රමය හරහා, අපනයනකරුවන් හට පහත ප්‍රතිලාභ අත්පත් කරගත හැකි වේ:

- මහා බ්‍රිතාන්‍ය වෙත අපනයනය කිරීමේ දී ශූන්‍ය හෝ අඩුකළ රේගු ගාස්තු
- ප්‍රභවස්ථානය පිළිබඳ ලිහිල් නීතිරීති.

A2 රූපයෙහි දක්වා ඇති පරිදි, වරණීය කාණ්ඩ තුනෙන් එකකට රටවල් වර්ගීකරණය කර ඇත. එමගින් එවැනි රටවල අපනයනකරුවන් සඳහා වන ශූන්‍ය හෝ අඩු කරන ලද රේගු ගාස්තු සහිත නිපැයුම් ප්‍රමාණය තීරණය කෙරෙයි. DCTS යෝජනාක්‍රමයට අනුව, ශ්‍රී ලංකාව යනු වැඩි වරණීය සත්කාර (Enhanced Preference) ලබන රටකි. එබැවින්, අපනයනකරුවන් හට ඔවුන්ගේ UKCC වර්ග සම්බන්ධයෙන් 92%ක් සඳහා ශූන්‍ය රේගු ගාස්තු භුක්ති විඳීමේ හැකියාව ලැබේ. DCTS UKCC වර්ග වලින් පිටස්තර සියලු නිපැයුම් වලට බ්‍රිතාන්‍ය පොදු රේගු ගාස්තු ක්‍රමය යටතේ රේගු ගාස්තු-වක් අය කෙරෙනු ඇත.

## DCTS යටතේ රේගු ගාස්තු

නිපැයුමට අනුව, අපනයනකරුවන් විසින් වෙනස් වර්ගයක රේගු ගාස්තු ගෙවීම කළ යුතු විය හැකිය. උදාහරණ වශයෙන්, නැවුම් පලතුරු සහ එළවළු අපනයනකරුවන් හට, වටිනාකමට ගෙවනු ලබන රේගු ගාස්තු (ad-valorem) සහ නිශ්චිත රේගු ගාස්තු වලට අමතරව ආර්තව රේගු ගාස්තු (seasonal tariffs) ගෙවීමට ද සිදු විය හැකිය. DCTS යටතේ අදාළ වන එවැනි සියලුම රේගු ගාස්තු අපනයනකරු-වකු විසින් හඳුනා ගන්නේ කෙසේද? විවිධ වූ, නමුත් අදාළ වන රේගු ගාස්තු වර්ග පිළිබඳ ප්‍රයෝජනවත් දළ විශ්ලේෂණය-ක් රේගු ගාස්තු හඳුනාගැනීම පිළිබඳ DCTS මගපෙන්වුම් ලේඛනය මගින් ලබා දේ. වැඩි විස්තර සඳහා A2 රූපයෙහි දැක්වෙන ප්‍රස්තාරික විස්තරය බලන්න.

### A2 රූපය: DCTS රටවල් වර්ගීකරණය කිරීම

| Product tariff | Comprehensive Preferences | Enhanced Preferences | Standard Preferences |
|---|---|---|---|
| Tariff free products (0%) | 99.8% | 92% | 65% |
| Products with 0% to 5% tariffs | 0.2% | 0.4% | 10% |
| Products with 5% to 10% tariffs | 0% | 0.4% | 12% |
| Products with more than 10% tariffs (including Specific Tariffs* | 0% | 7.2% | 13% |

*Specific tariffs are tariffs calculated as a fixed charge on a unit of the product. The product unit could be weight, volume, number of items or other criteria.



## A3 රූපය: DCTS යටතේ අය කරනු ඇති විවිධ රේගු ගාස්තු

**Ad-valorem tariffs**

Most tariffs under the DCTS are ad-valorem tariffs. An ad-valorem tariff is a percentage of the value of the product. The value refers to the total customs value of the product.

For example, the tariff for white chocolate for Comprehensive and Enhanced Preference Tiers is 0%, while Standard Preferences is 4.5% of the value of the product.

**Specific tariffs**

Specific tariffs are tariffs calculated as a fixed charge on a unit of the product. The product unit could be weight, volume, number of items or other criteria.

For example, the tariff for carcasses and half carcases of domestic swine is £44 per 100kg.

**Compound tariffs**

Compound tariffs are a combination of ad-valorem tariffs and specific tariffs.

**Example of compound tariffs:**

| Commodity Code | Product Description | Tariff |
|---|---|---|
| 04032051 | Yoghurt, whether concentrated, flavoured or with added fruit, nuts or cocoa, sweetened, in solid forms, of a milkfat content by weight of less than or equals to 1.5% | 4.5% plus £79 per 100 kg |

In this example, the ad-valorem tariff is the 4.5% charged on the value of the product while the specific tariff is £79 per 100 kg.

**Seasonal tariffs**

Seasonal tariffs are tariffs that change depending on the time of the year.

## ප්‍රභවස්ථානය පිළිබඳ නීතිරීති

රටවල් විසින් ප්‍රභවස්ථානය පිළිබඳ නීතිරීති භාවිත කරනු ලබන්නේ භාණ්ඩ වල ආර්ථික ජාතිකත්වය තීරණය කිරීම උදෙසා ය. DCTS යටතේ, නිපැයුම්කරුවන් හට සිය භාණ්ඩ නිපදවනු ලන්නේ ශ්‍රී ලංකාවෙන් බව පෙන්වීමට 'සම්පූර්ණයෙන්ම ලබාගත්' රීතිය (Wholly Obtained Rule) හෝ 'ප්‍රාමාණිකව කටයුතු කළ හෝ සැකසුම් කළ' රීතිය (Sufficiently Working or Processing Rule) යන රීති දෙකෙන් එකක් යොදා ගත හැකිය. ආනයනය කළ කිසිදු අමුද්‍රව්‍යයකින් තොරව ශ්‍රී ලංකාව තුළ සම්පූර්ණයෙන්ම නිපදවන ලද නිපැයුම්, 'සම්පූර්ණයෙන්ම ලබාගත්' රීතිය යටතේ ශ්‍රී ලංකාවේ උත්පාදනය කරන ලදී යනුවෙන් වර්ගීකරණය කළ හැකිය. නිපැයුම් වල, ශ්‍රී ලංකාවට ආනයනය කළ අමුද්‍රව්‍ය අඩංගු වුවද, නිපැයුම්-නිශ්චිත නීතිරීති ඒවා මගින් සපුරාලයි නම්, එම නිපැයුම් තවදුරටත් 'ශ්‍රී ලංකාවේ උත්පාදනය කරන ලදී' යනුවෙන් වර්ගීකරණය කළ හැකිය. නිපැයුම් වල, ශ්‍රී ලංකාවට ආනයනය කළ අමුද්‍රව්‍ය අඩංගු වුවද, නිපැයුම්-නිශ්චිත නීතිරීති ඒවා මගින් සපුරාලයි නම්, එම නිපැයුම් තවදුරටත් ශ්‍රී ලංකාවේ උත්පාදනය කරන ලදී යනුවෙන් වර්ගීකරණය කළ හැකිය. ප්‍රභවස්ථානය පිළිබඳ නීතිරීති වැඩිදුර අවබෝධ කරගැනීම පිණිස DCTS මගපෙන්වුම් ලේඛනය බලන්න.

අදාළ නිපැයුම්-නිශ්චිත නීතිරීති අවබෝධ කරගැනීම පිණිස, නිපැයුම්කරුවන්/අපනයනකරුවන් හට, අන්‍යෝන්‍යව ක්‍රියා කරනු ලබන DCTS දෘෂ්ටිකල්පන මෙවලම (Visualization Tool) බැලිය හැකිය. අදාළ ප්‍රභවස්ථානය පිළිබඳ නීතිරීති තෝරා-බේරා ගැනීම පිණිස ප්‍රභවස්ථානය පිළිබඳ නීතිරීති තීරුව තෝරාගෙන කොටස, පරිච්ඡේදය සහ HS ශීර්ෂය අනුව පිරික්සන්න. නිපැයුම්කරුවන් විසින් නිපැයුම්-නිශ්චිත සියලුම නීතිරීති සහ එක් එක් පරිච්ඡේදයෙහි දැක්වෙන සටහන් කියවා බලන බවට සහතික විය යුතුය.

02

# ඇමුණුම ii: නිපැයුම් සහ නිපැයුම් අවශ්‍යතා

## සාමාන්‍ය නිපැයුම් ආරක්ෂණය

නිපැයුම්කරුවකු/අපනයනකරුවකු වශයෙන් වැඩි සැලකිල්ලක් දැක්විය යුතු කාරණා අතරින් එකක් වන්නේ තම නිපැයුම් වලට කිසිදු ප්‍රමාදයකින් හෝ අසීරුතාවකින් තොරව බ්‍රිතාන්‍ය දේශසීමාව තරණය කළ හැකි බැව් සහතික කරගැනීමයි. පරිභෝජනය කරන්නන් හට අන්තරාකාරී වේ නම් හෝ අවදානමක් එල්ල කරයි නම් හෝ නැව්බඩු තොගය වෙළෙඳපොළ කරා යැවීමේ ප්‍රමාදයන් ඇති විය හැකියි. A5 වගුවෙහි දක්වා ඇති පරිදි, විවිධ පියවර භාවිතයෙන් නිපැයුම් ආරක්ෂණ නීති බලාත්මක කිරීමේ හැකියාව අධිකාරීන් වෙත පවතිනි. තෝරාගනු ලැබූ පියවර මගින් නිපැයුමෙන් ඇති කෙරෙන අවදානම පිළිබිඹු කෙරෙයි.

### A8 වගුව: නිපැයුම් ආරක්ෂණ උල්ලඝනය සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය අධිකාරීන් විසින් ගනු ලබන පියවර

| පියවර (Measure) | ක්‍රියාමාර්ග (Actions) |
|---|---|
| අත්හිටුවීමේ නිවේදනය | නිපැයුම් ආරක්ෂණ නීතිරීති වල විධිවිධාන නිපැයුම මගින් තෘප්ත කර නොමැති බවට අධිකාරීන් සැක කරන්නේ නම්, එවිට ‘අත්හිටුවීමේ නිවේදනයක්’ නිකුත් කරනු ලැබිය හැකියි. ආරක්ෂණ ඇගයීම්, පිරික්සුම් සහ පාලන සංවිධානය කිරීමට අධිකාරීන් හට අවශ්‍ය කාලසීමාව එමගින් ආවරණය කෙරෙනු ඇත. මෙම කාලසීමාව තුළ දී, බලාධිකාරීන්ගේ අවසරයකින් තොරව නිපැයුම වෙළෙඳපොළෙහි තැබීම හෝ යම් පුද්ගලයකු වෙත සැපයීම හෝ කළ නොහැක. |
| සලකුණු කිරීමේ / අනතුරු ඇඟවීමේ අවශ්‍යතාව | අධිකාරීන් විසින් නිශ්චිතව දක්වා ඇති ආකාරයට, යම් තත්ත්වයන් යටතේ දී නිපැයුම මගින් සිදුවිය හැකි අවදානම් සම්බන්ධයෙන් වන අනතුරු ඇඟවීමක් නිපැයුම්කරු, අපනයනකරු හෝ බෙදාහරින්නා විසින් නිපැයුමෙහි සලකුණු කිරීම අධිකාරීන් විසින් අවශ්‍ය කෙරෙනු ඇත. |
| අස්කරගැනීමේ නිවේදනය | නිපැයුම අනතුරුදායක බවට විශ්වාස කිරීමට අධිකාරීන් වෙත කරුණු පවතියි නම්, එවිට ඔවුන් විසින් අස්කරගැනීමේ නිවේදනයක් නිකුත් කරනු ඇත. එමගින්, බලාධිකාරීන්ගේ අවසරයකින් තොරව නිපැයුම වෙළෙඳපොළෙහි තැබීම හෝ යම් පුද්ගලයකු වෙත සැපයීම හෝ තහනම් කෙරෙයි. නිපැයුම මගින් සිදුවිය හැකි අවදානම් සම්බන්ධයෙන් නිපැයුම්කරු, ආනයනය කරන්නා හෝ බෙදාහරින්නා විසින් පාරිභෝගිකයන්ට ඇඟවීම බලාධිකාරීන් විසින් අවශ්‍ය කෙරෙනු ඇත. |
| යළි කැඳවීමේ නිවේදන | නිපැයුම ඒ වනවිටත් වෙළෙඳපොළෙන් ලබාගත හැකිව තිබේ නම්, සහ එකී නිපැයුම අන්තරාදායක නම්, යළි කැඳවීමේ නිවේදනයක් නිකුත් කිරීමේ හැකියාව අධිකාරීන් හට ඇත. එකී යළි කැඳවීමේ නිවේදනයට අනුව, අදාළ නීති සංග්‍රහයෙහි දක්වා ඇති අවශ්‍යතාවන් නිපැයුම්කරුවන්, ආනයනය කරන්නන් හෝ බෙදා හරින්නන් විසින් සපුරාලීම අධිකාරීන් විසින් අවශ්‍ය කෙරෙනු ඇත.<br>වැදගත්: යළි කැඳවීමේ නිවේදනයක් අධිකාරීන් විසින් නිකුත් කළ හැක්කේ, පරිභෝජනය කරන්නන්ට හට පවතින අවදානම් වැළැක්වීම සම්බන්ධයෙන් නිපැයුම්කරු හෝ බෙදා හරින්නා විසින් ගනු ලැබූ පියවර ද ඇතුළුව අනෙකුත් ප්‍රතිකාරක ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවන්නේ නම් පමණි. |



## රසායනික ද්‍රව්‍ය පිළිබඳ ලියාපදිංචිය, ඇගයුම, බලය ලබාදීම සහ සීමා කිරීම (REACH) සම්බන්ධ රෙගුලාසිය

REACH රෙගුලාසිය යටතේ, යම් ද්‍රව්‍යයක්, දැඩි සැලකිල්ල යොමු විය යුතු ද්‍රව්‍යයක් (substance of very high concern - SVHC) බවට හඳුනා ගැනුණහොත්, එය ස්වයංක්‍රීයවම සෘජුක අපේක්ෂක ලැයිස්තුව වෙතට ඇතුළත් වේ. එම ද්‍රව්‍යය එම ලැයිස්තුවට ඇතුළත් කළ දිනය සහ එසේ ඇතුළත් කරගැනීමට හේතුව ද එම ලැයිස්තුව මගින් නිශ්චිතව දැක්වෙනු ඇත. REACH බලාධිකාරිය, අපේක්ෂක ලැයිස්තුව වෙතින් ගන්නා ද්‍රව්‍ය ආවර්තීයව, බලය ලබාදීමේ ලැයිස්තුව වෙතට ඇතුළත් කරනු ලබයි. බලය ලබාදීමේ ලැයිස්තුව වෙතට ද්‍රව්‍ය ඇතුළත් කළ පසු, බලාධිකාරය විසින් ‘නිශ්චිත දිනය’ (‘sunset date’) හෝ එවැනි SVHCs භාවිත කිරීමට අධිකාරීන් විසින් අවසර දෙනු ඇති අවසන් දිනය හෝ නිශ්චිතව දක්වනු ඇත. උදාහරණ වශයෙන්, මෙම අත්පොතෙහි 2 වන පරිච්ඡේදයේ 6 වන කොටුව හි දක්වා ඇති SVHCs වන UV-320, UV-327, UV-328 සහ UV-350 සඳහා වන නිශ්චිත දිනය හෝ අවසන් දිනය, 2023 නොවැම්බර් 27 වේ. ඉන් අදහස් වන්නේ, නිශ්චිත දිනයෙන් පසු, මෙකී SVHCs අඩංගු නිපැයුම්, REACH රෙගුලාසියට අනුකූල නොවනු ඇති බවයි. මෙම අත්පොත මගින් ආවරණය වන නිපැයුම් වල දක්නට ලැබුණු බහුලව භාවිත කරන රසායන ද්‍රව්‍ය සහ උවදුරු සහිත ද්‍රව්‍ය වලින් සමහරක්, නිකල්, ඩයොක්ටිල්ටින් සංයෝග, ට්‍රිබියුටයිල්ටින් සංයෝග, ක්‍රෝමියම් VI සහ තැලේට (phthalates) වේ.

## රාත්‍රී ඇඳුම් පිළිබඳ ආරක්ෂණය

### ළමුන් සඳහා වන රාත්‍රී ඇඳුම්

1985, රාත්‍රී ඇඳුම් (ආරක්ෂණ) රෙගුලාසි සහ 5722 බ්‍රිතාන්‍ය ප්‍රමිති (BS) අනුව, පිජාමා, ළදරු ඇඳුම් සහ කපු ටෙරි ටවලින් බාත්රෝබ්ස් හැරෙන්නට ළමුන් සඳහා වන රාත්‍රී ඇඳුම්, ඇවිලෙනසුලු බව පිළිබඳ කාර්යසාධන අවශ්‍යතා (ගින්නකට නිරාවරණය වූ විට එහි චර්යාව කෙසේ විය යුතුදැයි නිශ්චිතව දක්වන ප්‍රමිතීන් සහ රෙගුලාසි මාලාව) (performance flammability requirements) සපුරාලීම අනිවාර්ය වේ. ළමුන් සඳහා වන රාත්‍රී ඇඳුම් පහත දක්වා ඇති මිමි අනුව වීම අනිවාර්ය වේ.

1. රාත්‍රී ගවුම්: පපුවෙහි මිම්ම සෙමී 91 නොඉක්මවිය යුතු අතර, ගවුමෙහි දිග සෙමී 122 නොඉක්මවිය යුතු වේ.
2. ඩ්‍රෙසිංග් ගවුම්, බාත්රෝබ්ස් සහ ඒ හා සමාන අඳුම්: පපුවෙහි මිම්ම සෙමී 97 නොඉක්මවිය යුතු අතර, අතෙහි මිම්ම සෙමී 69 නොඉක්මවිය යුතු වේ.

ළමුන් සඳහා වන රාත්‍රී ඇඳුම්, ඇවිලෙනසුලු බව පිළිබඳ කාර්යසාධන අවශ්‍යතා සපුරාලන බවට සනාථ කිරීමේ සෝදන හා පිරික්සුම් ක්‍රමවේදය, BS 5722 මගින් දක්වා ඇත.



## වැඩිහිටියන් සඳහා වන රාත්‍රී ඇඳුම්, පිජාමා, ළදරු ඇඳුම් සහ කපු ටෙරි ටවලින් බාත්රෝබ්ස්

BS 5722 අනුව, ඇවිලෙනසුලු බව පිළිබඳ කාර්යසාධන අවශ්‍යතා සපුරාලන රෙදි වලින් නිම කරන ලද, මෙම මාතෘකාව යටතේ වන සියලුම නිපැයුම්, 'ගින්නෙන් ඈත් කර තබන්න' ('KEEP AWAY FROM FIRE') යන ලේබලය සහිත විය යුතු වේ. මෙම මාතෘකාව යටතේ වන අනෙකුත් සියලුම නිපැයුම්, 'ගින්නෙන් ඈත් කර තබන්න, BS 5722 වෙත අවම ඇවිලෙනසුලු' ('KEEP AWAY FROM FIRE, LOW FLAMMABILITY TO BS 5722') යන ලේබලය සහිත විය යුතු වේ. ඇඳුමෙහි ඇතුළතින්, කර අසල අමුණා ඇති ඕනෑම ලේබලයක හෝ ඇඳුම පිළිබඳ තොරතුරු අඩංගු කළ ඕනෑම ලේබලයකට හෝ ඇඳුමෙහි ප්‍රමාණය (size) දක්වනු ලබන ලේබලයකට හෝ යාබදව එකී වචන පෙන්නුම් කළ යුතු අතර, ඇඳුමෙහි ප්‍රමාණය (size) දක්වනු ලබන ලේබලයක නම්, ප්‍රමාණයට යටින් එම වචන පෙන්නුම් කළ යුතු වේ. වචන මධ්‍යම ප්‍රමාණයේ අකුරු වලින් එනම් 10 ප්‍රමාණයෙන් සහ කැපිටල් අකුරු වලින් විය යුතු අතර, එය පැහැදිලි සහ නොමැකෙන ආකාරයෙන් වෙනස් වර්ණයක පසුබිමින් යුතු ව පැවතිය යුතු වේ. එවිට, එය පැහැදිලිව දැකගත හැකි වේ.

## ගිනි නිවන රසායන ද්‍රව්‍ය සමග පදම් කළ රෙදි වලින් නිම කළ රාත්‍රී ඇඳුම්

මෙම මාතෘකාව යටතේ වන නිපැයුම් වල ලේබලයෙහි මෙම වචන දැක්විය යුතු වේ: 'සෙල්සියස් අංශක 50ට වැඩි උෂ්ණත්වයක සේදීමට ලක් නොකරන්න. යෙදිය යුතු රෙදි සෝදන කුඩු පිළිබඳව පරීක්ෂා කරන්න' ('DO NOT WASH AT MORE THAN 50°C. CHECK SUITABILITY OF WASHING AGENT)', ඇඳුමෙහි ඇතුළතින්, කර අසල අමුණා ඇති ඕනෑම ලේබලයක හෝ ඇඳුම පිළිබඳ තොරතුරු අඩංගු කළ ඕනෑම ලේබලයකට හෝ ඇඳුමෙහි ප්‍රමාණය (size) දක්වනු ලබන ලේබලයකට හෝ යාබදව හෝ 1985, රාත්‍රී ඇඳුම් (ආරක්ෂණ) රෙගුලාසි දැක්වෙන ඇමුණුම 3(b) වගන්තිය යටතේ අවශ්‍ය කෙරෙන වචන දැක්වෙන ඕනෑම ලේබලයක එකී වචන පෙන්නුම් කළ යුතු අතර, 3(b) වගන්තිය යටතේ දක්වනු ලබන ලේබලයක නම්, ඊට යටින් එම වචන පෙන්නුම් කළ යුතු වේ. වචන මධ්‍යම ප්‍රමාණයේ අකුරු වලින් එනම් 10 ප්‍රමාණයෙන් සහ කැපිටල් අකුරු වලින් විය යුතු අතර, එය පැහැදිලි සහ නොමැකෙන ආකාරයෙන් වෙනස් වර්ණයක පසුබිමින් යුතු ව පැවතිය යුතු වේ. එවිට, එය පැහැදිලිව දැකගත හැකි වේ. රාත්‍රී ඇඳුම් නිපැයුම් සම්බන්ධයෙන් ආරක්ෂණ අවශ්‍යතා පිළිබඳ වැඩි විස්තර සඳහා මෙම මගපෙන්වුම (සබැඳිය 72) බලන්න.





# නිපැයුම් ඇසුරුම්කරණය

## අත්‍යවශ්‍ය අවශ්‍යතා

භාවිත කරනු ලබන ඇසුරුම්කරණ ද්‍රව්‍ය මගින් මෙකී අත්‍යවශ්‍ය නිෂ්පාදන සහ සංයුති අවශ්‍යතා සපුරාලන බවට නිපැයුම්කරුවන් සහ අපනයනකරුවන් විසින් සහතික විය යුතු වේ.

I. නියාමනය කළ බැරලෝහ - එනම්, කැඩ්මියම්, රසදිය, ඊයම් සහ ෂඩ්සංයුජ ක්‍රෝමියම් වල සාන්ද්‍රණය, පහත ව්‍යාතිරේක වලට යටත් ව, මිලියනයකට කොස් 100 නොඉක්මවිය යුතු වේ.

a. ලෙඩ් ඔක්සයිඩ් අඩංගු පළිඟු වීදුරු සම්පූර්ණයෙන්ම අඩංගු ඇසුරුමකට මෙය අදාළ නොවේ.
b. මෙය, 2 වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතා සපුරාලන්නේ නම්, පාලනයකින් යුතු බෙදාහැරීමක සහ නැවත භාවිත කිරීමේ ක්‍රමවේදයකින් යුතු නම්, ප්ලාස්ටික් කැට (plastic pellets) හෝ කූඩ වලට මෙය අදාළ නොවන අතර,
c. මෙය, 3 වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතා සපුරාලන්නේ නම්, වීදුරු ඇසුරුම්කරණයට මෙය අදාළ නොවේ.

II. ඇසුරුම් පුළුස්සා අළු කළ විට හෝ ඉඩම් ගොඩ කිරීමට යොදා ගත් විට, විමෝචනය වීම හෝ කාන්දු වීම මගින් ඇති වන හානිකර හෝ වෙනත් අන්තරාකාරී ද්‍රව්‍ය අවම වීම.

III. නැවත භාවිතයට සහ නැවත අත්කරගැනීමට ඉඩ සැලසෙන ආකාරයකින් ඇසුරුම් නිර්මාණය කිරීම, නිපදවීම සහ වාණිජකරණය කිරීම සහ එවැනි ඇසුරුම් අපද්‍රව්‍ය හෝ ඇසුරුම් අපද්‍රව්‍ය කළමනාකරණ මෙහෙයුම් වලින් ඉතිරි වන දෑ හෝ බැහැර කිරීමේ දී පරිසරයට වන හානි අවම කිරීම.

ඔබ, නැවත භාවිත කළ හැකි ඇසුරුම් යොදා ගන්නේ නම්, ඒවා මගින් පහත අවශ්‍යතා සපුරාලන බවට සහතික වන්න.

a. සාමාන්‍යයෙන් පුරෝකථනය කළ හැකි භාවිත තත්ත්වයන් වල දී වාර ගණනාවකට හෝ වටමාරු කිරීම් ගණනාවකට ඉඩ ලැබෙන ලක්ෂණ සහ භෞතික දී ගුණාංග වලින් එකී ඇසුරුම් සමන්විත වන බව.
b. පිරිදි භාවිත කළ ඇසුරුම්, හැසිරවීමේ දී ආරක්ෂණ හා සෞඛ්‍යමය අවශ්‍යතාවන් සපුරාලීමේ හැකියාව පැවතිය යුතු වේ.
c. ඇසුරුම්, නැවත භාවිත කළ නොහැකි විට සහ අපද්‍රව්‍ය බවට පත්වන විට, ඒවා recoverable packaging (එකතු කිරීම, හැසිරවීම, නැවත භාවිත කිරීම හෝ ප්‍රතිචක්‍රීකරණය කිරීම) සම්බන්ධයෙන් සපුරාලිය යුතු අවශ්‍යතා සපුරාලීමේ හැකියාවෙන් යුක්ත විය යුතුය.

## අනුකූල නොවීමේ ප්‍රතිවිපාක

අත්‍යවශ්‍ය අවශ්‍යතා සපුරාලීම නොකරන ඇසුරුම්කරණ භාවිතය සහ/හෝ වාර්තා පවත්වාගෙන යාමට අපොහොසත් වීම යනු දඬුවම් ලැබිය හැකි වරදකි. අනුකූල-නොවූ බවට සොයා ගැනෙන අය දඩ ගෙවීම කළ යුතු වේ.

# ලේබල්කරණය පිළිබඳ අවශ්‍යතා

## රෙදිපිළි ලේබල්කරණය පිළිබඳ අවශ්‍යතා

රෙදිපිළි නිපැයුම් (ලේබල්කරණය සහ නිශ්චිත තන්තු වර්ග සහ එහි සංයුතිය) පිළිබඳ රෙගුලාසි, 2012 {Textile Products (Labelling and Fibre Composition) Regulations, 2012} හි කාර්යයන් සම්බන්ධයෙන්, රෙදිපිළි වලින් කළ නිපැයුම් නිමවන තන්තු, බුමුතුරුණු, මෙට්ට, කූඩාරම් වලට යොදා ගන්නා භාණ්ඩ (camping goods), ගෘහ භාණ්ඩ, සෙවන සඳහා ආවරණ සම්බන්ධ නිපැයුම්, අර්ධ-වශයෙන් නිෂ්පාදනය සහ නිෂ්පාදනය කිරීම අයත් වන අතර, එමගින් අනෙකුත් නිපැයුම් වල මූලික කොටසක් ඉන් නිර්මාණය කෙරෙයි. කෙසේ වෙතත්, රෙදිපිළි වලින් නිමවන සියලුම නිපැයුම් වල ලේබල අඩංගු වීම අවශ්‍ය නොවේ. ලේබලයක් අවශ්‍ය නොවන නිපැයුම් දැක්වෙන ලැයිස්තුවක් සඳහා A2 කොටුව බලන්න. රෙදිපිළි වලින් කළ නිපැයුම් සඳහා වන ලේබල සම්බන්ධයෙන් අනුකූල විය යුතු අවශ්‍යතාවන්ට පහත කරුණු ද ඇතුළත් වේ.

I. ලේබල, ඉංග්‍රිසි භාෂාවෙන් තිබිය යුතුය.

II. ලේබලය පහසුවෙන් ඇස ගැටෙන, කල් පවතින, කියැවිය හැකි, පෙනෙන තිබිය යුතුය.

III. තන්තු වර්ග දෙකක් හෝ ඊට වැඩි ගණනකින් යුතු නිපැයුම් වල තන්තු භාවිත කළ ප්‍රතිශතය වෙන්කර දැක්වීම මේ ආකාරයෙන් විය යුතුය - ‘කපු 70%, සේද 20%, හණ 10%’

IV. සල්වාර් ඇඳුම් කට්ටලයක ලයිනින් තිබීම වැනි වූ, කොටස් දෙකක් හෝ ඊට වැඩි ගණනක් නිපැයුමක වේ නම්, ඒ එක් එක් කොටසෙහි අන්තර්ගතය ලේබල් කළ යුතුය.

V. ‘සුපිරිසිදු’ අර්ථය දෙන ‘pure’ වචනය ලේබලයක අඩංගු කළ හැක්කේ, එම ඇඳුම එක් තන්තු වර්ගයකින් පමණක් නිපදවන ලද්දක් නම් පමණි.

VI. සේද-කපු හෝ සේද ඇසිටේට් වැනි, සේද සමග මිශ්‍ර කළ තන්තු ඇතුළුව, ‘සේද’ අර්ථය දෙන ‘Silk’ යන වචනය, වෙනත් යම් තන්තු වර්ගයක් විස්තර කිරීමට යොදා ගත නොහැකි වේ.

VII. ඒකක-අනුව තනි ලේබල් යෙදීම හැකි සේ ම, රෙදිපිළි වලින් කළ නිපැයුම් වලට බහු-ඇසුරුම් තිබෙන විට දී, ඇසුරුම්-අනුව ඒවාට ලේබල් යෙදිය හැකි වේ.

රෙදිපිළි ලේබල්කරණ අවශ්‍යතා පිළිබඳ සම්පූර්ණ ලැයිස්තුව අවබෝධ කරගැනීම පිණිස මෙම මගපෙන්වුම බලන්න.

## A1 රූපය: ලේබල අවශ්‍ය නොකෙරෙන, රෙදිපිළි වලින් කළ නිපැයුම්

- කෘත්‍රිම මල්, බොත්තම් සහ බකල්, ලේබල සහ බැජ්, අංගරචන භාණ්ඩ අසුරණ (make-up cases).
- උඳුන් සඳහා යොදා ගන්නා අත්මේස් සහ රෙදි, පින්තාරු කළ කැන්වස්, ඇල්පෙනෙත්ති ගසන කුඩා කොට්ට, ක්‍රීඩා වලදී අවශ්‍ය වන ආරක්ෂිත උපකරණ (අත්මේස් හැර), සෑදල ආම්පන්න (saddlery).
- ඇඳුමක අත්වල ආරක්ෂාවට ඇති දෑ, ඇඳුමක අත්වල සහයට යොදන පටි, මතුපිට පෘෂ්ඨය 500 සෙමී2 නොවැඩි කොටස් කිහිපයකින් යුතු ටේබල් මැට්ස්.
- ගෙත්තම් කළ රෙදි තීරු (Tapestries), ඒවා නිපැයීමට යොදා ගත් ද්‍රව්‍ය ද ඇතුළුව; තේ සහ කෝපි පෝච්චි වසන උර (cosies), පාවහන් වල රෙදි සහිත කොටස්, පාදමට සහ යටට දමන රෙදි සහ ස්ටිෆ්නිංග් සහිත රෙදිපිළි වලින් කළ නිපැයුම්.
- දුම්කොළ පැස, සිරුර පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය බහාලන මලු (toilet cases), සෙල්ලම් බඩු, සංචාරයේ දී රැගෙන යන දෑ දමන මලු (travel goods) සහ ඔරලෝසු පටි.

රෙදිපිළි ලේබල අවශ්‍ය නොවන නිපැයුම් පිළිබඳ සම්පූර්ණ ලැයිස්තුව සඳහා මෙම guide බලන්න.



## පාවහන් ලේබල්කරණය පිළිබඳ අවශ්‍යතා

පහත දක්වා ඇති දෑ සම්බන්ධයෙන් හැරෙන්නට සරල සැන්ඩල්ස් වල සිට කලවා-දක්වා දිගින් යුතු බූට්ස් තෙක් වන සියලු පරාසයන් විස්තර කෙරෙන පාවහන් සම්බන්ධයෙන් පාවහන් (සංයුතිය දක්වන දර්ශකය) ලේබල්කරණ රෙගුලාසි, 1995 {The Footwear (Indication of Composition) Labelling Regulations 1995} අදාළ වේ.

- වරක්-භාවිත කළ හෝ අඳින ලද පාවහන්;
- ආරක්ෂිත පාවහන්;
- ඇස්බෙස්ටෝස් අඩංගු පාවහන්;
- වයස අවුරුදු 14ට අඩු ළමුන් විසින් ක්‍රීඩා සඳහා භාවිතය (උදාහරණ: විකට ඇඳුම් තරග) පිණිස වූ පාවහන්.

පාවහන් වල ඉහළ කොටස, ඇතුළත යෙදූ කොටස සහ පය ආවරණය කිරීමට රෙද්දෙන් තැනූ කොටස, සහ පිටත අඩිය නිමවන ලද ප්‍රධාන ද්‍රව්‍යය රූපාකාරයෙන් (සංකේත) හෝ වචන ආකාරයෙන් දැක්වීමක් සහිතව පාවහන් ලේබල් කළ යුතුය.

අවම වශයෙන් පාවහන් යුගලයෙහි එක් අයිතමයකට ලේබලය ඇමිණිය යුතු අතර, එය ඇසුරුමෙහි ද දැක්විය හැකිය.

ඉංග්‍රිසි භාෂාවෙන් හෝ රූපාකාරයෙන් හෝ එහි පහත දෑ 80%කින් සැදුම්ලත් ද්‍රව්‍යය ලේබලයෙහි දැක්විය යුතුය.

- ඉහළ කොටසෙහි මතුපිට පෘෂ්ඨය;
- ඇතුළත යෙදූ කොටස සහ පය ආවරණය කිරීමට රෙද්දෙන් තැනූ කොටසෙහි මතුපිට පෘෂ්ඨය (මින් අදහස් වන්නේ ඇතුළත යෙදූ කොටසෙහි ඉහළ සහ ඇතුළත අඩිය යන කොටස්ය - එනම් පාවහන් වල ඇතුළත කොටසයි);
- පිටත අඩිය.

බහුවිධ ද්‍රව්‍ය භාවිත කරන ලද අවස්ථාවක, පාවහන් වල සංයුතියේ ප්‍රධානතම ද්‍රව්‍ය දෙක සඳහන් කළ යුතු වේ.
අවම වශයෙන් එක් එක් පාවහන් යුගලයෙහි එක් පාවහනකට ලේබලය ඇමිණිය යුතු අතර, එය මුද්‍රිත ආකාරයෙන්, ඇළවීමෙන්, එම්බොස් කිරීමෙන් හෝ ලේබලයක් ලෙස ඇමිණීම මගින් ඊට යා කළ යුතු වේ; එය පෙනෙන ලෙසට, ආරක්ෂිතව හා පහසුවෙන් දැකගත හැකි ලෙසට ඇමිණිය යුතු ය. ලේබලය, ඇසුරුමෙහි ද දැක්විය හැකි නමුත්, එය පාවහන් යුගලයක එක පාවහනකට අනිවාර්යයෙන්ම සම්බන්ධ කර තිබිය යුතු වේ.




© Freepik.com

## A4 රූපය: රූපාකාරයෙන් (සංකේත) සහ භාෂාවෙන් පාවහන් ලේබල්කරණය පිළිබඳ උදාහරණ

1. Pictograms or written indications concerning the parts of the footwear to be identified.

| | PICTOGRAMS | WRITTEN INDICATIONS |
|---|---|---|
| (a) Upper. |  | Upper. |
| (b) Lining and sock. |  | Lining and sock. |
| (c) Outer sole. |  | Outer sole. |

2. Pictograms or written indications concerning materials used in the composition of footwear.

| | PICTOGRAMS | WRITTEN INDICATIONS |
|---|---|---|
| (a) (i) Leather. |  | Leather. |
| (ii) Coated leather. |  | Coated leather. |
| (b) Natural textile materials and synthetic or non-woven textile materials. |  | Textile. |
| All other materials. |  | Other materials. |

සුළු-පරිමාණ වෙළෙඳසැලක රූපාකාරයන් භාවිත කරයි නම්, පාරිභෝගිකයන්ගේ දැන ගැනීම පිණිස, සංකේත වලින් අදහස් කරන්නේ කුමක් ද යන්න, දැන්වීමක ආකාරයෙන් ප්‍රදර්ශනය කළ යුතු වේ. පාරිභෝගිකයන් හට හොඳින් දැක-බලා ගැනීමට සහ අවබෝධ කරගැනීමට හැකි වන පරිදි, එකී දැන්වීම පැහැදිලි විශාල අකුරින් කළ එකක් විය යුතුය.

පාරිභෝගිකයන් හට ප්‍රවේශ වීමේ හැකියාවක් නොමැති ස්ථානයක සිට පාවහන් විකිණීමේ දී රූපාකාරයන් භාවිත කරයි නම් (උදාහරණ වශයෙන්, තැපැල් ඇණවුම් හෝ අන්තර්ජාල වෙළෙඳාම්), භාවිත කරනු ලබන රූපාකාරයන් වල අර්ථයන් පිළිබඳව පාරිභෝගිකයන් පැහැදිලිව දැනුවත් කළ යුතු වේ.

පාවහන් ලේබල්කරණ අවශ්‍යතාවන් පිළිබඳ සම්පූර්ණ ලැයිස්තුව අවබෝධ කරගැනීමට මෙම මගපෙන්වුම බලන්න. A4 රූපයෙන් දක්වා ඇති පරිදි, තොරතුරු අවශ්‍යතා සහිත ලේබලය රූපාකාර ආකාරයෙන් හෝ ලිඛිත දැක්වීමක් වශයෙන් හෝ සැපයිය හැකිය.



# 03 ඇමුණුම iii: තිරසර භාවය පිළිබඳ ප්‍රමිතීන්

3 වන පරිච්ඡේදයේ සඳහන් කර ඇති පරිදි, තිරසර භාවය පිළිබඳ ප්‍රමිතීන් සහ සහතික කිරීම්, තරගකාරීත්වය අතින් ව්‍යාපාරයක දී ඉදිරියෙන් සිටීමේ හැකියාව මෙන්ම සුවිශේෂී වෙළෙඳපොළක් ග්‍රහණය කරගැනීමේ අවස්ථාව වුව ලබා දේ. එසේ කරගැනීමට, නිපැයුම්කරුවන් මූලික අවශ්‍යතා දෙකක් සම්බන්ධයෙන් දැනුවත් විය යුතු වේ:

a. සහතික කිරීමක් ලබාගැනීමේ සාමාන්‍ය ක්‍රියාවලිය; සහ
b. අදාළ විය හැකි යම් යම්, විවිධ සහතික කිරීම් පිළිබඳව.

මෙම අත්පොත මගින් ආවරණය වන බොහොමයක් නිපැයුම් තනා ඇත්තේ (i) කපු; (ii) සේද; (iii) කාශ්මීර වූල්; (iv) පොලියෙස්ටර්; (v) ප්ලාස්ටික්; (vi) දැව; හෝ (vii) සම් යන ද්‍රව්‍ය මත පදනම් ව බව සැලකිල්ලට ගෙන ය. අවශ්‍ය විය හැකි, ජාත්‍යන්තරව පිළිගැනීමට ලක් වූ තිරසර භාවය පිළිබඳ සහතික කිරීම් කිහිපයක උදාහරණ මෙම ඇමුණුමට අන්තර්ගත කර ඇත.



# සහතික කිරීම් ලබාගැනීමට ගත යුතු පියවර

බොහෝ සහතික කිරීම් පිළිබඳ ක්‍රියාවලීන් එක සමාන බැවින්, ගත යුතු පියවර පහත පරිදි වෙන් කරගත හැකිය.

## 1 වන පියවර: නිවැරදි ප්‍රමිතිය හඳුනාගැනීම

නිපැයුම් ක්‍රියාවලියෙහි විවිධ අදියර සහ අමුද්‍රව්‍ය, ස්වෙච්ඡා තිරසර භාවය පිළිබඳ (VSS) විවිධ සහතික කිරීම් මගින් ආවරණය කෙරෙන අතර, ඒවා භාවිත කරනු ලබන්නේ යම් යම් රටවල් විසින් පමණක් විය හැකිය. ඇතැම් අවස්ථාවන් හි දී, නිපැයුම්කරුවන් විසින් යම් යම් සහතික කිරීම් ලබාගත යුතු බව ආනයනකරු විසින් නිශ්චිතව දැක්විය හැකිය. තවත් අවස්ථාවන් හි දී, ගැනුම්කරු සමග විකුණුම් ගිවිසුම පිළිබඳ සාකච්ඡා කිරීමට පෙරාතුව, විවිධ වර්ගයේ VSS සහතික කිරීම් ගැන ඔබ දැනුවත්ව සිටීම සුදුසු වේ. එසේ දැනුවත් වීම පිණිස, ITC ප්‍රමිතීන් පිළිබඳ අන්තර්ජාලයෙන් ලබාගත හැකි සවිස්තරාත්මක තොරතුරු අඩංගු 'ප්‍රමිතීන් හඳුනාගන්න' සහ 'සසඳන්න' වැනි මෙවලම් යොදා ගන්න.

## 2 වන පියවර: පරතර විශ්ලේෂණයක් සිදු කිරීම

හඳුනා ගත් VSS වල දක්වා ඇති අවශ්‍යතා සහ පවතින ව්‍යාපාර පරිචයන් අතර ඇති යම් පරතරයන් හැඳින ගැනීම පිණිස පරතර විශ්ලේෂණයී (gap analysis) සිදු කිරීමට නිපැයුම්කරුවන් කටයුතු කළ යුතු වේ. විශ්ලේෂණය මගින් පරතරයන් හඳුනා ගනු ලැබුවහොත්, ඊළඟට ගත යුතු පියවර, පිරිවැය සහ එවැනි ඊළඟට ගත යුතු පියවර ක්‍රියාවට නැංවීමේ කාලය වැනි සුදුසු ක්‍රියාමාර්ග මාලාවක් නිපැයුම්කරුවන් විසින් තීරණය කළ යුතු වේ. එම ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමෙන් අනතුරුව, 3 වන පියවර වෙත යොමු වන්න. පරතර විශ්ලේෂණයී මගින් කිසිදු පරතරයක් හඳුනා නොගැනුණේ නම්, නිපැයුම්කරුවන් හට සෘජුව ම 3 වන පියවර වෙත යොමු විය හැකිය.

## 3 වන පියවර: සහතික කිරීම් සඳහා අයදුම් කරන්න

සහතික කිරීම් සඳහා අයදුම් කිරීමට පෙරාතුව, සහතික කිරීම් සඳහා දරන්නට වන පිරිවැය වෙන වෙන ම විමසා බැලීමට නිපැයුම්කරු සහතික විය යුතු වේ. සාමාජික ගාස්තු, විගණන ගාස්තු (අවශ්‍ය කෙරෙන යාම්-ඊම් ගණන අනුව මෙය වෙනස් විය හැකිය), සහ නිපැයුම් ප්‍රමිතිය සහ VSS සහතික කිරීම් මගින් දක්වා ඇති ප්‍රමිතීන් අතර පරතරයක් නොමැති බව සහතික කිරීමේ පිරිවැය ආදිය මෙකී පිරිවැයට ඇතුළත් වේ.
නිපැයුම්කරු විසින් අදාළ පිරිවැය තෝරා-බේරා ගැනීමෙන් පසු සහ, ඒ වෙනුවෙන් මුදල් වෙන් කළ පසු, සහතික කිරීම් සඳහා VSS ආයතනයට අයදුම් කිරීමේ හැකියාව නිපැයුම්කරුවන්ට ඇත. අයදුම් කිරීමෙන් අනතුරුව, නිපැයුම්කාර-අයදුම්කරු විසින් වැඩ-බිම තුළ තක්සේරු කිරීමක් සඳහා විගණකවරයකු/පරීක්ෂකවරයකු හට ආරාධනය කරනු ඇත.
විවිධ VSS සහතික කිරීම් සම්බන්ධයෙන්, මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන එක් එක් රටෙහි බලයලත් හෝ අනුමැතිය ලත් විවිධාකාර විගණකවරු සිටියි. උදාහරණ වශයෙන්, බියුරෝ වෙරිටාස් පාරිභෝගික නිෂ්පාදන සේවාවන්, CCPB SRL, ක්ලීන් ග්ලෝබ් ඉන්ටර්නැෂනල්, කන්ට්‍රෝල් යුනියන් සර්ටිෆිකේෂන්ස්, GCL ඉන්ටර්නැෂනල් සහ GSCS ඉන්ටර්නැෂනල් යනු ශ්‍රී ලංකාවේ සිටින අනුමැතිය ලත් ගෝලීය කාබනික රෙදිපිළි ප්‍රමිතීන් (GOTS) පිළිබඳ විගණකවරුන් කිහිපදෙනෙකි.




## 4 වන පියවර: පරීක්ෂාව සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ ඉල්ලීම්

අනතුරුව, නිපැයුම්කරුවන් විසින් විගණනයක් සඳහා කටයුතු සූදානම් කළ යුතු අතර එහිදී පරීක්ෂකයකු විසින් වැඩබිම-තුළම ඒකකය තක්සේරු කිරීමක් සිදු කරනු ඇති අතර, ඉන් පසුව, විගණන හෝ පරීක්ෂණ වාර්තාවක් නිකුත් කරනු ඇත. නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ ඉල්ලීම් ද පරීක්ෂකවරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි අතර, වත්මන් ව්‍යාපාර පරිචයන් සහ VSS සහතික කිරීමේ යටතේ අවශ්‍ය කෙරෙන ප්‍රමිතීන් අතර පවතින පරතරයන් නිවැරදි කිරීම පිණිස නිපැයුම්කරු විසින් ගත යුතු පියවර එමගින් විස්තර කෙරෙනු ඇත.
නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ ඉල්ලීම් ක්‍රියාවට නැංවීමෙන් අනතුරුව, පරතරයන් සම්බන්ධයෙන් නිවැරදි අන්දමින් නිසි කටයුතු සිදු කර ඇති බව සහතික කිරීම පිණිස නව විගණනයක් පවත්වනු ඇත. විගණන වාර්තාවෙහි අපැහැදිලි ඡේද අඩංගු වේ නම්, විගණකවරයා වෙතින් පැහැදිලි කිරීම් ඉල්ලා සිටින බවට සහතික වන්න. අපැහැදිලි තීරණයක් නිකුත් කරනු ලැබුවහොත්, පැහැදිලි කිරීම් ඉල්ලා සිට, අවශ්‍ය නම් තීරණය සම්බන්ධයෙන් නැවත අයැද සිටින්න.

## 5 වන පියවර: සහතික කිරීම්, අධීක්ෂණය කිරීම සහ අලුත් කිරීම

විගණනය සම්පූර්ණ කළ පසු සහ ක්‍රියාවට නැංවීමට නියමිතව පවතින නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ ඉල්ලීම් තවදුරටත් නොමැති වූ විට, සහතික කිරීම නිකුත් කරනු ලබයි. සහතික ලත් නිපැයුම්කරු අඛණ්ඩව, අදාළ අවශ්‍යතාවන්ට අනුකූල වන බව සහතික කිරීම පිණිස, VSS සහතික කිරීම් යටතේ දක්වා ඇති අවශ්‍යතාවන් අනුව, වැඩබිම-තුළ හෝ පවත්නා දත්ත මත පදනම්ව (On-site or desk-based) හෝ සත්‍යාපනය කිරීමේ විගණන වුවද සිදු කළ හැකිය.

එක් එක් සහතික කිරීම සම්බන්ධයෙන් වන වලංගු කාලසීමාවන් විවිධ වන අතර, ඒ එක් එක් සහතික කිරීම ඒ අනුව අලුත් කළ යුතු වේ. ලබාගත් සහතික කිරීමට අදාළ වෙබ් අඩවිය නිපැයුම්කරුවන් විසින් පිරික්සා බැලිය යුත්තේ, අලුත් කිරීමේ ඊළඟ දිනය දැන ගැනීම සහ ඒ අනුව සැලසුම් කිරීම පිණිස ය.

# අදාළ සහතික කිරීම් පිළිබඳ උදාහරණ

## ගෝලීය කාබනික රෙදිපිළි පිළිබඳ ප්‍රමිතීන්

මෙම සහතික කිරීම අදාළ වන්නේ සමින් කළ භාණ්ඩ සහ රෙදිපිළි සඳහා ය.

GOTS සහතික කිරීම ලබා ගැනීම ඉතාමත් සුදුසු බවට නිර්දේශ කෙරෙයි. එය ගෝලීය වශයෙන් පිළිගත් සහතික කිරීමකි. එසේම, කාබනික ද්‍රව්‍ය වලින් සාදන ලද තන්තු සඳහා වන ප්‍රමිතියක් වශයෙන් ද එය ක්‍රියා කරයි. සැපයුම් දාමයේ සෑම අදියරයක් ම එනම්, ද්‍රව්‍ය ලබාගැනීමේ සිට නිෂ්පාදනය කිරීමේ සහ අපනයනය කිරීම දක්වා කටයුතු, GOTS සහතික කිරීම මගින් ආවරණය කෙරෙයි. සමින් කළ භාණ්ඩ සහ රෙදිපිළි සම්බන්ධයෙන් සැකසුම් කටයුතු සිදු කරන්නන්, නිෂ්පාදනය කරන්නන් සහ වෙළෙන්ද-න් එමගින් සහතික කෙරෙන අතර, සදාචාරාත්මක ව්‍යාපාරික චර්යාවන් සහ පාරිසරික ආරක්ෂණය වෙත එහි මූලික අවධානය යොමු කරනු ලබයි. GOTS සහතික කිරීම ලබාගන්නා අයුරු පිළිබඳ පියවරෙන් පියවර දැක්වෙන මගපෙන්වුම සඳහා මෙතැන බලන්න.

ඔබ, GOTS සහතික කිරීම සහිත රෙදිපිළි සහ සම් සැපයුම්කරුවන් සොයන නිපැයුම්කරුවකු නම්, මෙම GOTS දත්ත ගබඩාව තුළින් ඔවුන් සොයා ගැනීමට ඔබට හැකියාව ඇත.

**කඩිනම් ඉඟියක්**

එක් එක් ප්‍රමිතිය පිළිබඳ වැඩි විස්තර ITC ප්‍රමිතීන් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු වෙතින් විමසා බලන්න. ITC ප්‍රමිතීන් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු වල අඩංගු එක් එක් ප්‍රමිතියෙහි, අනුකූලතා අවශ්‍යතාවන්, පාලනය සහ සම්පත් සම්බන්ධව සවිස්තරව දැක්වෙයි.
ප්‍රමිතීන් පිළිබඳ අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් පවත්නා තාක්ෂණික සහය හා අයඳුම්කරුවන්ට මූල්‍ය සහය ලබාගැනීම සම්බන්ධයෙන් වැඩිදුර දැනගැනීමට නිපැයුම්කරුවන් සම්පතී වෙත යොමු විය යුතු වේ.

---

## OEKO-TEX ජාත්‍යන්තර සංවිධානය

සමින් කළ භාණ්ඩ සහ රෙදිපිළි සඳහා මෙම සහතික කිරීම අදාළ වේ.
ඔබ සමින් කළ භාණ්ඩ සහ රෙදිපිළි නිෂ්පාදන ව්‍යාපාරයක නිරත වන අයෙකු නම්, ඔබට අදාළ විය හැකි OEKO-TEX iy;sl lsḯ yhla we;'

[2] Made in Green f,an,h
[2] Standard 100 iy;slh
[2] Leather Standard iy;slh
[2] STeP iy;slh
[2] Responsible Business iy;slh
[2] Eco Passport iy;slh

fulS iy;sl lsḯ w;r fjki jkafka" ksmehqï-u; mokï jQ ks¾Kdhlhla mej;Su fyda ksmehqï ms<sno jeä wjOdkhla fhduq lr ;sîu jk w;r" we;eï tajd l%shdj,sh-u; mokï jQ fyda ksmehqu ksmehSfï l%shdj,sh ms<sno jeä wjOdkhla fhduq jQ fyda tajd h' tla iy;sl lsÍula wjOdkh fhduq lrkafka" frÈms<s j, Ndú; lr we;s ridhk øjH ms<snoj h" wfkla wjOdkh fhduq lrkaf-ka iïmQ¾K kslamdok l%shdj,sh ;=< mj;akd ;srir Ndjh ms<snoj h" iy ;j;a iy;sl lsÍula u.ska wjOdkh fhduq lrkafka ksmehqfuys ish¨u fldgia ms<sno iuia; wdrlaIdj ms<snoj hs' ;u jHdmdrhg idlaId;a lr.; yels wkql+,;d m%ñ;Skag wkqj" ,nd.; hq;= iy;sl lsḯ f;dard .ekSug ksmehqïlrejka lghq;= lsÍu iqÿiq njg ks¾foaY flfrhs'



# 04 ඇමුණුම IV: රේගු කාර්යපටිපාටි සහ ආශ්‍රිත ලේඛන

4 වන පරිච්ඡේදය හි දක්වා ඇති පරිදි, බාධාවකින් තොරව නිපැයුම් රේගුව හරහා යන බව සහතික කරගැනීම පිණිස, අපනයනකරුවන් රේගු කාර්යපටිපාටි සහ අවශ්‍ය අනෙකුත් සිය¨ ම ලේඛන පිළිබඳව හොඳින් දැන සිටිය යුතු වේ. මහා බ්‍රිතාන්‍ය වෙත අපනයනය කිරීමේ දී, ශ්‍රී ලාංකික අපනයනකරුවන් ASYCUDA ද්වාරයෙහි ප්‍රකාශනය ගොනු කරන අවස්ථාව වනවිට, පහත දක්වා ඇති ලේඛන සූදානම් කරගෙන සිටිය යුතු වේ.

## වාණිජ ඉන්වොයිසිය

අපනයනකරු විසින් සූදානම් කරනු ලබන වාණිජ ඉන් වොයිසිය යනු අපනයනකරුවන් සඳහා වඩාත්ම වැදගත් ලේඛනය වන අතර, එය විකුණුම් ඉන්වොයිසියකට වඩා වැඩි විස්තර සහිත එකකි. වාණිජ ඉන්වොයිසියක පහත කරුණු අඩංගු වේ:

- ගනුදෙනුවට අදාළ සිය¨ ම තොරතුරු
- අපනයනයට හේතු;
- ගෙවීමේ ක්‍රමය;
- HS කේතය;
- බර සහ භාණ්ඩ ගණන;
- තෝරාගත් ප්‍රවාහන ක්‍රමය සහ ප්‍රවාහන මාර්ගය;
- ජාත්‍යන්තර වාණිජ නීතිරීති;
- නැව්බඩු තොගයෙහි වටිනාකම.

විවිධ පාර්ශ්වයන් විසින් විවිධාකාර ආකෘති වල වාණිජ ඉන්වොයිසි භාවිත කරන අතර, ඔබේ වාණිජ මණ්ඩලය සමග සාකච්ඡා කර, වඩාත් බහුලව භාවිත කරන වාණිජ ඉන්වොයිසි ආකෘතිය පිළිබඳව දැනගන්න. නැව්බඩු තොගය මත යම් තීරුබදු සහ ගාස්තු අය කළ යුතු ද යන්න තීරණය කිරීම පිණිස රේගු බලධාරීන් විසින් ද වාණිජ ඉන්වොයිසියක් භාවිත කරනු ලබයි.
ගැණුම් මිල තීරණය කළ පසුව, ව්‍යවහාර මුදල් විනිමය අනුපාතිකය ඉතා වැදගත් කාරණයක් බවට පත් වේ. විනිමය අනුපාතිකයේ අගය ඉහළ නැගීම හෝ පහත වැටීම හෝ සිදුවිය හැකිය. එනම්, ගැනුම්කරු වෙතින් ලද අවසන් මුදලෙහි වෙනසක් තිබිය හැකි වීමයි. විනිමය අනුපාතිකයේ උච්චාවචනයන් හේතුවෙන් සිදු වන පාඩු වලින් ඔබ ආරක්ෂාවීම පිණිස, පහත දී ඇති ඉඟි බලන්න.

### A2 කොටුව: වාණිජ ඉන්වොයිසියක අන්තර්ගත දෑ

- ගැනුම්කරුගේ සහ අවසන් ලැබුම්කරුගේ (එය ගැනුම්කරුගෙන් වෙනස් වේ නම්) සම්පූර්ණ නම, ලිපිනය සහ සම්බන්ධ විය හැකි ආකාරයන් පිළිබඳ තොරතුරු.
- වාණිජ ඉන්වොයිසි අංකය සහ නිකුත් කළ දිනය
- මිලදී ගැනීමේ ඇණවුම (Purchase order) හෝ නාමමාත්‍ර ඉන්වොයිසි (proforma invoice) අංකය සහ නිකුත් කළ දිනය (විශේෂයෙන්ම, එකම ගිවිසුම යටතේ බහුවිධ ඇණවුම් එහි තිබේ නම්)

[2] HS කේතය, නිපැයුමෙහි විස්තරය, ජාත්‍යන්තර වාණිජ නීතිරීති, භාණ්ඩ වල ප්‍රභවස්ථාන රට

- ප්‍රවාහන මාර්ගය සහ භාණ්ඩ වල වටිනාකම

වැඩි විස්තර සඳහා මෙතැන සහ මෙතැන බලන්න.

**කඩිනම් ඉඟියක්:**
**විනිමය අනුපාතික උච්චාවචනයන් සැලකිල්ලට ගන්න**
(QUICK TIP: Consider exchange rate fluctuations)
විනිමය අනුපාතිකයන් උච්චාවචනය වීම් වලින් ඔබ ආරක්ෂා වීම සඳහා පහත ඉඟි ගැන සැලකිල්ලට ගන්න:

- ගෙවීම් සිදු කරන දිනට අදාළ විනිමය අනුපාතිකය භාවිත කරන්න, හෝ විදේශ විනිමය ගිණුමක් වෙත විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම ලබාගන්න.
- අමතර ගාස්තුවක් ඇතුළත් කිරීම මගින්, මිල උච්චාවචනයන් සැලකිල්ලට ගැනීමට සහ විය හැකි පාඩු ආවරණය කිරීමට කටයුතු කරන්න.
- ඔබේ බැංකු කළමනාකරු හෝ පළපුරුද්ද සහිත වෘත්තිකයකු සමග කථා කරන්න.

# ඇසුරුම් ලැයිස්තුව

අපනයනකරු විසින් සකසනු ලබන, ඇසුරුම් ලැයිස්තුවෙහි නැව්බඩු තොගය සම්බන්ධයෙන් වන පහත දක්වා ඇති තොරතුරු ආදී සවිස්තරාත්මක තොරතුරු අඩංගු වේ:

- නිපැයුම් විස්තරය;
- ඒකක සංඛ්‍යාව සහ සමස්ත බර;
- ඇසුරුම්කරණ උපදෙස්;
- භාවිත කළ ඇසුරුම්කරණ වර්ගය, ප්ලාස්ටික් කැබලි අතුරු ඇසුරුවේ ද නැති නම් පෙට්ටි වල ඇසුරුවේද, එහි දිග, පළල යනාදී විස්තර සහ ඇසුරුම් වල ඇති සලකුණු ආදිය;
- විකුණුම්කරු සහ ගැනුම්කරු පිළිබඳ සඳහන් කිරීම.

අනෙකුත් සෑම ලේඛන වල මෙන්ම, ගැනුම්කරු, විකුණුම්කරු සහ ප්‍රවාහනකරු පිළිබඳ සඳහන් කිරීම් එහි අඩංගු විය යුතු වේ. ආනයන/අපනයන භාණ්ඩ ප්‍රවාහනය කරන්නන් (Freight forwarders) හෝ නැව්ගත

**කඩිනම් ඉඟියක්: ව්‍යාකූලතා මගහරවා ගන්න**
(QUICK TIP: Avoid confusion)
ඇසුරුම් ලැයිස්තුව යනු වාණිජ ඉන්වොයිසියට සමාන එකක් නොවේ. ඔබේ නිපැයුම් සාර්ථකව අපනයනය කිරීමට මෙම ලේඛන දෙක ම අත්‍යවශ්‍ය වේ.

කරන්නන් (Shippers) විසින් නෞභාර බිල්පත (bill of lading) සැකසීමට, ඇසුරුම් ලැයිස්තුව භාවිත කරයි. ශ්‍රී ලංකාවේ, රේගු නිලධාරීන් විසින් නැව්බඩු තොගයෙහි අඩංගු දෑ සමාලෝචනය කිරීමට සහ පරීක්ෂා කිරීමට, එය භාවිත කරනු ලැබිය හැකි අතර, ණයවර ලිපියක් යටතේ අපනයනකරුවන් හට ගෙවීම ලබාගැනීම සම්බන්ධයෙන් ඇසුරුම් ලැයිස්තුවෙහි පිටපතක් බැංකු වලට අවශ්‍ය විය හැකිය.

## ප්‍රභවස්ථානය ඔප්පු කිරීම

1 වන පරිච්ඡේදය හි පැහැදිලි කළ පරිදි, DCTS යටතේ වරණීය රේගු ගාස්තු අනුපාතික සඳහා හිමිකම් පෑමට ශ්‍රී ලාංකික අපනයනකරුවන් විසින් ඔවුන්ගේ භාණ්ඩ වල ප්‍රභවස්ථානය, ශ්‍රී ලංකාව බවට ඔප්පු කළ යුතු වේ. අපනයනකරුවන්, ශ්‍රී ලංකා වාණිජ දෙපාර්තමේන්තුව හි ලියාපදිංචි විය යුතු අතර, ඔවුන්ගේ අපනයන වාර්තාව (සාරාංශය) නිතිපතා යාවත්කාලීන කළ යුතු වේ. වැඩි විස්තර සඳහා 1 වන පරිච්ඡේදය බලන්න.
වරණීය වෙළෙඳ නීතිරීති යටතේ හිමිකම් පෑම් පිළිබඳ 'ෘක්‍ෂී මගපෙන්වුම අනුව, අපනයනය කිරීමට භාර ගැනීමේ දී ශ්‍රී ලාංකික අපනයනකරුවන් විසින් වාණිජ ඉන්වොයිසිය හෝ ඇසුරුම් ලැයිස්තුව, හෝ A පෝරමය මත හෝ ප්‍රභවස්ථාන ප්‍රකාශනයක් සකස් කර, ඉදිරිපත් කළ යුතු වේ. ප්‍රභවස්ථානය ඔප්පු කිරීම,

භාණ්ඩ පිළිබඳ තනි නැව්ගත කිරීමක් ආරම්භ කරන විට අදාළ වේ. එය, පහත පරිදි වන එක සමාන භාණ්ඩ නැව්ගත කිරීම් කිහිපයක දී වුවද අදාළ විය හැකියි:

- එකම විකුණුම් ගිවිසුම යටතේ ආනයනය කළ;
- එකම UKCC සහිත වූ;
- එකම අපනයනකරු විසින් එකම ආනයනකරු වෙත විශේෂිතව විකුණන ලද;
- මහා බ්‍රිතාන්‍යයේ එකම රේගු කාර්යාලයේ පිවිසුම් විධික්‍රම වලට විෂය වූ;
- නිරන්තර කාර්යරාමුවක් ඇතුළත සහ මාස 12 නොඉක්මවූ සැලකිය යුතු වාණිජ වටිනාකමකින් යුතු අඛණ්ඩ වෙළෙඳ ප්‍රවාහයක් සහිතව ආනයනය කරන ලද;



## m%Njia:dk m%ldYkh

ශ්‍රී ලාංකික අපනයනකරුවන් විසින් ප්‍රභවස්ථාන ප්‍රකාශනයක් සැපයිය යුතු වේ. එය වාණිජ ඉන්වොයිසියක්, ඇසුරුම් ලැයිස්තුවක් හෝ භාණ්ඩ භාරදීමේ ලේඛනයක් (delivery note) වැනි වාණිජ ලේඛනයක සකසන ලද්දක් විය යුතු වේ. මෙම මගපෙන්වුම හි 2 වන වගන්තියෙහි දක්වා ඇති තොරතුරු එහි අඩංගු වීම අත්‍යවශ්‍ය වන අතර, A5 කොටුවෙහි දී ඇති ප්‍රභවස්ථාන ප්‍රකාශන වචනී ර්ට ඇතුළත් විය යුතු වේ. ප්‍රභවස්ථාන ප්‍රකාශනය ඉංග්‍රිසි භාෂාවෙන් ලිවිය යුතු වන අතර, එහි අපනයනකරුගේ අත්සන ඇතුළත් විය යුතු වේ. එසේම, එය අපනයනකරු වෙතින් ආනයනකරු වෙත ඉලෙක්ට්‍රොනිකව යැවිය හැකිය. අපනයනකරු විසින් ඉදිරිපත් කිරීමෙන් පසු වසර දෙකක කාලයක් සඳහා එකී ප්‍රභවස්ථාන ප්‍රකාශනය වලංගු වේ.

### A3 කොටුව: ප්‍රභවස්ථාන ප්‍රකාශනය සැකසීමේ කොන්දේසි

- වරණීය රේගු ගාස්තු සඳහා සුදුසුකම් ලබන භාණ්ඩ නිපැයීමේ හා සැපයීමේ සුදුසු වාණිජ ගිණුම් වාර්තා පවත්වාගෙන යන්න.
- අවශ්‍ය අනෙකුත් සියලුම ලේඛන හෝ නිපැයුම්කරුවන් සහ සැපයුම්කරුවන් වෙතින් භාණ්ඩ වල ප්‍රභවස්ථානය දැක්වෙන අවශ්‍ය අනෙකුත් සියලුම ලේඛන හෝ ලිඛිත ප්‍රකාශන ශ්‍රී ලංකා රේගුව වෙත හෝ වෙනත් ඕනෑම අධිකාරියක් වෙත සැපයීමට සූදානමින් සිටින්න.

### A4 කොටුව: ප්‍රභවස්ථාන ප්‍රකාශන වචන

**වාණිජ ඉන්වොයිසියේ හෝ ඇසුරුම් ලැයිස්තුවේ ඇතුළත් කිරීම සඳහා**

මෙම ලේඛනය මගින් ආවරණය වන නිපැයුම් වල අපනයනකරු (EORI wxlh we;=<;a lrkak& ප්‍රකාශ කර සිටින්නේ, අන්‍යාකාරයකින් පැහැදිලිව දක්වා නොමැති නම් මිස, මෙකී නිපැයුම් යනු (භාණ්ඩ වල ප්‍රභවස්ථානය ඇතුළත් කරන්න) එක්සත් රාජධානියේ DCTS හි ප්‍රභවස්ථානය පිළිබඳ නීතිරීති වලට අනුව වරණීය ප්‍රභවස්ථාන වෙතින් සහ, සපුරාලන ලද ප්‍රභවස්ථාන නිර්ණායකයන් වන්නේ ඎසම්පූර්ණයෙන් ලබාගත් නිපැයුම්: ීී අකුර ඇතුළත් කරන්න; ප්‍රාමාණිකව සැකසූ නිපැයුම්: 'W' අකුර ඇතුළත් කරන්න, ඉන් පසු, HS ශීර්ෂය යොදන්න (උදාහරණ W' 9618)} බවයි.

{ස්ථානය සහ දිනය (ලේඛනයෙහි එය ඇතුළත් කර ඇත්නම්, මෙය සඳහන් කළ යුතු නැත)}

^අපනයනකරුගේ නම සහ අත්සන&

## A පෝරමය

ප්‍රභවස්ථානය ඔප්පු කර පෙන්වීමට, විකල්පයක් වශයෙන් ශ්‍රී ලාංකික අපයනයකරුවන් හට A පෝරමය සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමේ හැකියාව පවතියි. අනුක්‍රමික අංකයක් හෝ වාණිජ ඉන්වොයිසියට යොමුවක් හෝ A පෝරමයෙහි අඩංගු විය යුතු අතර, වඩාත්ම වැදගත් කාරණයක් වන්නේ, එය ශ්‍රී ලාංකික අධිකාරියක් විසින් අත්සන් තැබීම හෝ මුද්‍රා තැබීම හෝ අවශ්‍ය නොවීම ය. පෝරමය සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය රජය විසින් සපයා ඇති මගපෙන්-වුම බලන්න.

## භාණ්ඩ පිළිබඳ ප්‍රකාශනය

4 වන පරිච්ඡේදයෙහි සඳහන් කළ පරිදි, මූල්‍ය සාධන පත්‍රය සහ බැංකුවෙහි විස්තරය වෙළෙන්දා වෙත සබැඳි කළ පසු, ඊළඟ පියවර වන්නේ භාණ්ඩ පිළිබඳ ප්‍රකාශනය, ඔන්ලයින් මගින් ගොනු කිරීමයි. භාණ්ඩ තොගය යවනු ලබන්නා ^Con-signor& සහ භාණ්ඩ තොගය භාර ගනු ලබන්නා ^Consignee&" ඉන්වොයිසි අංකය, නැව්ගත කරනු ලබන වරාය, දළ බර, ඇසුරුම්කරණ තොරතුරු සහ ගමනාන්ත රට පිළිබඳ තොරතුරු වෙළෙන්දන් විසින් සැපයිය යුතු වේ. වෙළෙන්දන් විසින් බැංකුවෙහි විස්තරය සහ මූල්‍ය සාධන-පත්‍රය, භාණ්ඩ පිළිබඳ ප්‍රකාශනය සමග සබැඳි කර, අවශ්‍ය අනෙකුත් සියලුම ලේඛන උඩුගත ^upload& කළ යුතු වේ.

## තනි ප්‍රකාශනය

අපනයනකරුවන් විසින්, ASYCUDA ද්වාරයෙහි අපනයන සඳහා වන තනි ප්‍රකාශනයක් නිර්මාණය කළ යුතු වේ. පහත දක්වා ඇති තොරතුරු වැනි අදාළ තොරතුරු ඉදිරිපත් කරන්න:

2 අපනයනකරුගේ විස්තර
- භාණ්ඩ තොගය භාර ගනු ලබන්නාගේ ^Consignee& විස්තර
- යාත්‍රාවෙහි සහ මුහුදු ගමනෙහි තොරතුරු
- මුහුදු ගමනෙහි දිනය
- ප්‍රභවස්ථාන රට
- ගමනාන්ත රට
- විනිමය අනුපාතිකය
- HS කේතය
- භාණ්ඩ වල ශුද්ධ බර
- භාණ්ඩ වල දළ බර
- අයිතම මිල ^FOB/CIF)

2 පසුගිය ලේඛන / යොමු (නෞභාර බිල්පත් අංකය / ගුවන් ගමන් බිල්පත් අංකය)
- ව්‍යවහාර මුදල් වර්ගය
- ගෙවීම් පිළිබඳ නීතිරීති
- බැංකුවේ නම
- බැංකු ශාඛාවේ යොමු අංකය
- බලපත්‍ර අංකය (තිබේ නම්)
- ආනයනකරුගේ/අපනයනකරුගේ/නියෝජිතගේ අත්සන






# ආර්ථික මෙහෙයුම්කරුවන්ගේ ලියාපදිංචිය සහ අනන්‍යතා අංකය

මහා බ්‍රිතාන්‍යට භාණ්ඩ ආනයනය කිරීම සඳහා සහ බ්‍රිතාන්‍ය දේශසීමාවට භාණ්ඩ පැමිණි විට රේගු ප්‍රකාශනයක් සිදු කිරීම සඳහා EORI අංකයක් අවශ්‍ය වේ. මහා බ්‍රිතාන්‍ය-පදනම් කරගත් ආනයනකරුවන් සාමාන්‍යයෙන්

EORI අංකයක් සඳහා අයදුම් කර, එය ලබා ගනියි. සෘජු අපනයන සහ විකුණුම් සම්බන්ධයෙන් වනවිට, වෙළෙන්දන් හට EORI අංකයක් ලබාගැනීම පිණිස සහ රේගු බලධාරීන් හා සම්බන්ධ වීම පිණිස මහා බ්‍රිතාන්‍යයේ සංස්ථාපිත රේගු නියෝජිතයන් හෝ තැරැව්කරු-වන් කුලියට ලබාගත හැකි වේ.

# #SheTrades

*Her success. Our future.*

The International Trade Centre's SheTrades Initiative is a global movement to unlock women's full economic potential through trade.

By working with governments, business support organizations, the private sector, and women producers and entrepreneurs, we create the right capacities and conditions for sustainable impact at scale.